# කර්මාන්ත අමාත්‍යාංශය
# கைத்தொழில் அமைச்சு
# Ministry of Industries



## ප්‍රගති වාර්තාව
## முன்னேற்ற அறிக்கை
## Progress Report 2023

# ප්‍රගති වාර්තාව - 2023

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

# නායකත්වය සහ මග පෙන්වීම



ගරු වෛද්‍ය රමේෂ් පතිරණ
අමාත්‍ය, කර්මාන්ත අමාත්‍යාංශය



ගරු ප්‍රසන්න රණවීර
රාජ්‍ය අමාත්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන



ගරු චාමර සම්පත් දසනායක
රාජ්‍ය අමාත්‍ය, ප්‍රාථමික කර්මාන්ත



ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය

# දැක්ම

"තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම"

# මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම"

# අරමුණු

- 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය 30% දක්වා ඉහළ නැංවීම.
- 2030 වන විට නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 20% දක්වා ඉහළ නැංවීම.
- 2030 දී ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය 10% දක්වා ඉහළ නැංවීම.
- 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික අපනයනයන්ගේ දායකත්වය 20% දක්වා ඉහළ නැංවීම.
- 2030 වන විට කර්මාන්ත සඳහා වෙන් කල ඉඩම් ප්‍රමාණය 1% දක්වා ඉහළ නැංවීම (ජාත්‍යන්තර සම්මතය 3%).

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ප්‍රතිපත්ති සංවර්ධන අංශය
2. කර්මාන්ත සංවර්ධන අංශය
3. ආංශික සංවර්ධන අංශය
   - 3.1 සංවර්ධන අංශ 1
   - 3.2 සංවර්ධන අංශ 2
   - 3.3 සංවර්ධන අංශ 3
4. කර්මාන්ත ලියාපදිංචි අංශය
5. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
7. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය
8. ප්‍රාථමික කර්මාන්ත අංශය
9. සැලසුම් අංශය
10. පාලන අංශය
11. ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

- පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව (ROC)
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
- ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
- ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
- ජාතික කඩදාසි සමාගම (NPC)
- සී/ස ලංකා සිමෙන්ති සමාගම
- සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL)
- ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
- කාර්මික තාක්ෂණික ආයතනය (ITI)
- සී/ ස ලංකා ෆොස්ෆේට් සමාගම (LPL)
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
- ජාතික ශිල්ප සභාව (NCC)
- සීමාසහිත ලංකා සළුසල (LSL)
- විද්‍යාතා මධ්‍යස්ථානය
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

# පටුන


| | |
|---|---|
| පෙරවදන | xiii |
| අමාත්‍යාංශයේ දිශානතිය | 01 |
| **ප්‍රධාන අංශ** | |
| ප්‍රතිපත්ති සංවර්ධන අංශය | 11 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 16 |
| ආංශික සංවර්ධන අංශය | |
| සංවර්ධන අංශ 1 | 22 |
| සංවර්ධන අංශ 2 | 27 |
| සංවර්ධන අංශ 3 | 31 |
| කර්මාන්ත ලියාපදිංචි අංශය | 34 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 37 |
| පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය | 39 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය | 43 |
| ප්‍රාථමික කර්මාන්ත අංශය | 48 |
| සැලසුම් අංශය | 52 |
| පාලන අංශය | 54 |
| ගිණුම් හා ප්‍රසම්පාදන අංශය | 56 |
| **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | |
| පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI) | 61 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව (ROC) | 65 |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) | 68 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) | 74 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL) | 79 |
| ජාතික කඩදාසි සමාගම (NPC) | 83 |
| ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් (LMSL) | 86 |
| ලංකා පිගන් සංස්ථාව (CCC) | 90 |
| කාර්මික තාක්‍ෂණික ආයතනය (ITI) | 93 |
| සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL) | 99 |
| සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL) | 102 |
| ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA) | 105 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) | 109 |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB) | 115 |
| ජාතික ශිල්ප සභාව (NCC) | 117 |
| සීමාසහිත ලංකා සළුසල (LSL) | 122 |
| විද්‍යාතා මධ්‍යස්ථානය | 124 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) | 128 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI) | 132 |
| **මූල්‍ය ප්‍රගතිය** | |
| කර්මාන්ත අමාත්‍යාංශය | 137 |

# පෙරවදන

ශ්‍රී ලංකා ආර්ථිකයේ, දේශීය නිෂ්පාදන කර්මාන්ත වල දායකත්වය ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගෙන යාමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අභිලාෂයෙන් කර්මාන්ත සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැපයීම කර්මාන්ත අමාත්‍යාංශයේ මූලික කාර්යයභාරයයි.

පවතින ආර්ථික අවපාතය හමුවේ වුවද දේශිය කර්මාන්තවල සුරක්ෂිතභාවය වෙනුවෙන් විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මැදිහත්වීම තුලින් නිෂ්පාදන කර්මාන්ත අංශයේ උන්නතිය උදෙසා අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් මෙම වසරේදීද විශිෂ්ඨ කාර්යය භාරයක් ඉටු කර ඇත.

තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා ඉවහල් වන ජාතික ප්‍රතිපත්තියක් සහ පස් අවුරුදු උපාය මාර්ගික ක්‍රියාකාරි සැලැස්ම (2023- 2027) අමාත්‍යාංශය විසින් සකස් කර ඇති අතර වේගවත් කර්මාන්ත සංවර්ධනයක් සඳහා අදාල වන පරිදි කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය කිරීමේ කටයුතුද මූලික වශයෙන් නිමකොට ඇත.

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් කේන්ද්‍රගත වී ඇති කර්මාන්ත සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා වූ වැඩසටහන් ගණනාවක් අමාත්‍යාංශය ක්‍රියාත්මක කර ඇත.

දේශීය ආර්ථිකයේ කොඳු නාරටිය බඳු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති රැසක්ද අමාත්‍යංශය මඟින් ක්‍රියාවට නංවා ඇත.

දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව සිදු කරන නවෝත්පාදන හා පර්යේෂණ හඳුනාගෙන අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන හා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වල සහයෝගය ඇතිව ඒවා වානිජකරණයට අවශ්‍ය පහසුකම් සැලසීමේ නව වැඩසටහනක් හඳුන්වාදී ඇත.

ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය, අගය එකතු කිරිම මෙන්ම අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් ලාභ ලබන සහ වානිජමය ශක්‍යතාවයකින් හෙබි ව්‍යවසායන් ලෙස ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රාශියක් ද අමාත්‍යාංශය මඟින් හඳුන්වා දී ඇත.

# අමාත්‍යාංශයේ දිශානතිය

## (2023 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා)

## 1. නිෂ්පාදන කර්මාන්ත සඳහා හිතකර පරිසරයක් සැකසීම

### 1.1 ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය සඳහා දැඩි අවශ්‍යතාවයක්ව පැවති ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය (NaPID) සකස් කර අමාත්‍ය මණ්ඩල සඳහා ඉදිරිපත් කර ඇති අතර එය සකස් කරමින් පවතින ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුවට (2023-2048) ඇතුලත් කිරීමට ආර්ථික ස්ථායීකරණය පුනර්ජීවන සහ වර්ධනය ඉහල නැංවීම පිලිබඳ කමිටුව තීරණය කර ඇත.

- කර්මාන්ත ප්‍රතිපත්තියට අදාල 2023 - 2027 දක්වා කාලය සඳහා වන පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම ද සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අමාත්‍යාංශය දැනටමත් ආරම්භ කර ඇත.

### 1.2 කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම.

- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත වත්මන් හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර මූලික කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දී ඇති අතර අවසන් කෙටුම්පත සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

### 1.3 විද්‍යුත් වාහන නිෂ්පාදනය සහ එකලස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම.

- **මෝටර් රථ නිෂ්පාදනය/ එකලස් කිරීම සහ මෝටර් රථ උපාංග නිෂ්පාදනයට අදාල ජාතික ප්‍රතිපත්තිය සැකසීම.**

  මීට අදාළ 2 වන කෙටුම්පත සකසා අවසන් කර ඇත. කෙටුම්පත අදාල පාර්ශවකරුවන් සමඟද සාකච්ඡා අවසන් කර ඇති අතර වාහන එකලස් කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂිතයි.

  ජාතික මෝටර් රථ සහ සංරචක නිෂ්පාදන ප්‍රතිපත්තිය සඳහා වූ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කරමින් පවතී.

- **සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) යාවත්කාලීන කිරීම.**

  වාහන එකලස් කිරීමේදී භාවිතා කරන දේශීයව නිෂ්පාදනය කරන ලද සංරචකවල මිල ගණන් ඇගයීම් කටයුතු සහ මෝටර් රථ නිෂ්පාදනය හා එකලස් කිරීමට අදාල ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින අතර වසර අවසන් වීමට පෙර සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) යාවත්කාලීන කිරීමට අපේක්ෂා කෙරේ.

- **මෝටර් රථ එකලස් කිරීම සහ මෝටර් රථ උපාංග නිෂ්පාදනයට අදාල නව ආයතනයන් සඳහා අනුමැතිය ලබාදීම.**

  සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) ක්‍රියාත්මක කිරීමෙන් පසු, රට තුළ නව වාහන මාදිලි හැට හතරක් (64) සහ මෝටර් වාහන එකලස් කිරීමේ ආයතන විසි නවයක් (29) අනුමත කරන ලදී. මේ අතරින්, 2023 වසර තුළ සැප්තැම්බර් දක්වා මෝටර් රථ එකලස් කිරීමේ ආයතන දහයක් (10) සහ නව වාහන මාදිලි දහහතරක් (14) සඳහා අනුමැතිය ලබා දී ඇත. සම්මත මෙහෙයුම් පටිපාටියට පසුව එකලස් කරන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව ඒකක 20,169කි. මේ අතර, 2023 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා රෝද හතරේ වාහන 457 ක් සහ රෝද දෙකේ වාහන 8,656 ක් ඇතුළුව ඒකක 9,113 ක් එකලස් කර ඇත.

- **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය එකාබද්ධව ඉලෙක්ට්‍රික් වාහන සඳහා අදාල වන මාර්ගෝපදේශ සැකසීම.**

  විද්‍යුත් වාහන සඳහා මාර්ගෝපදේශ (E-Vehicle Guideline ) පිළිබඳව පළමුවන කෙටුම්පතෙහි කරුණු පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා පත්කරන ලද කමිටු මඟින් යෝජනා ඇතුලත් වාර්තා ලබා දී ඇති අතර එම වාර්තා සැලකිල්ලට ගනිමින් සංශෝධිත මාර්ගෝපදේශ කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

## 2. නිෂ්පාදන කර්මාන්ත නඟා සිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

### 2.1 කර්මාන්තපුර සංවර්ධනය

- අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත කලාප/කර්මාන්තපුර ස්ථාපනය කිරීමේ විශේෂ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් හඳුනාගත් කඩිනමින් නිම කල හැකි අක්කර 1024 කින් යුත් කර්මාන්තපුරවල මූලික සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. මේ යටතේ පවතින කර්මාන්තපුර 33 ක සහ නව කර්මාන්තපුර 6ක (අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම, සූරියවැව, රිදීබැදිඇල්ල සහ වැල්ලවාය) සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ. මීට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යටතේ පවතින සහ නව කර්මාන්ත උද්‍යාන වලද සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ.

- විද්‍යුත් වාහන එකලස් කිරීම හා උපාංග නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් සහිත කර්මාන්තපුරයක් කටුනායක කටාන ප්‍රදේශයේ අක්කර 100 ක භූමි ප්‍රමාණයක ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කර ඇති අතර එම කර්මාන්ත කලාපය පිහිටුවීම සඳහා අවශ්‍ය පාරිසරික අනුමැතීන් (EIA) ලබා ගැනීමේ කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී.

## 3. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

### 3.1 කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් සැපයීම

- කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය) යටතේ 2023 වර්ෂය සඳහා රු. මි. 3660 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 10 ක් හරහා ව්‍යාපෘතින් 176ක් සඳහා රු. මි. 1753 ක ණය මුදල් ලබා දී ඇත.
- පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E –Friend) යටතේ 2023 වර්ෂය සඳහා රු. මි. 400 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 11 ක් හරහා ව්‍යාපෘතින් 07 ක් සඳහා රු. මි. 155 ක ණය මුදල් ලබා දී ඇත.

### 3.2 අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම, අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් 2023 ඔක්තෝබර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත 223 ක් සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 398 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

### 3.3 නිපුණතා සංවර්ධන වැඩසටහන්

නිපුණතා සංවර්ධන වැඩසටහන් යටතේ ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීම සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක් වශයෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර ඇත. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 29 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වේ.

### 3.4 Get Up - Start Up for a Wealthy Nation ජාතික වැඩසටහන

කර්මාන්ත අමාත්‍යාංශය විසින් රට තුළ කර්මාන්ත හා ව්‍යවසායකත්ව නවෝදයක් ඇතිකිරීමේ අරමුණෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) හා එක්ව සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහයෝගීතාවයෙන් “Get Up - Start Up for a Wealthy Nation” ජාතික වැඩසටහන 2022 ඔක්තෝබර් 26 දින පවත්වන ලදී.

මේ යටතේ පහත සඳහන් සුවිශේෂී කාර්යයන් සිදු විය.

i. ව්‍යවසායකයන් හා ආයෝජකයන් සඳහා ජංගම යෙදවුමක් ( IDB Mobile APP) හඳුන්වාදීම.
ii. කර්මාන්ත තොරතුරු වෙනුවෙන් 1995 නමින් හදිසි ඇමතුම් අංකයක් හා වට්ස්ඇප් (WhatsApp) අංකයක් හඳුන්වා දීම.
iii. ව්‍යවසාය සංවර්ධන වෙනුවෙන් Business Clinic වැඩසටහන හඳුන්වා දීම.

iv. 9 ශ්‍රේණියේ සිට ඉහල පාසල් සිසුන්ට ව්‍යවසායකත්ව දැනුම ලබාදීම වෙනුවෙන් School Entrepreneurial Circle වැඩසටහන ආරම්භ කිරීම.

v. මහා පරිමාණ ආයෝජකයන්ට සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ගේ කර්මාන්තවල ආයෝජනය කිරීම සඳහා අවස්ථාව ලබා දීම අරමුණු කොට ගෙන Investor Pool වැඩසටහන ආරම්භ කිරීම.

vi. ව්‍යවසායකයන් සඳහා අඩු පොලී යටතේ ණය පහසුකම් ලබාදීම වෙනුවෙන් HDFC බැංකුව සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම.

vii. සණස සංවර්ධන බැංකුව ( SDB ) සමග එක්වී සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ සැපයුම් දාමකරණය සඳහා ඩිජිටල් බැංකු තාක්ෂණය හඳුන්වාදීම.

viii. Dialog ආයතනය සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ කුඩා, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම, ව්‍යවසායකයින් සඳහා මගපෙන්වන මාර්ගෝපදේශක අත්පොතක් ලෙසින් Guide for a Wealthy Nation එළි දැක්වීම.

ix. German Industry & Commerce ආයතනය සමග තාක්ෂණික හා වෙළෙඳපොළ වෙනුවෙන් ගිවිසුම් ගතවීම මෙන්ම තවත් ආයතන ගණනාවක් සමග කර්මාන්ත නවෝදය වෙනුවෙන් විවිධ වූ එකගතාවයන්ට එළඹීම.

## 3.5 "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන

උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.2023 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, කොළඹ, මොරටුව, රුහුණු, සබරගමුව සහ පේරාදෙණිය යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 245 දෙනෙකු සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇති අතර, ප්‍රතිපාදන ලබා දීම සඳහා ව්‍යාපාර සැලසුම් 43 ක් ලැබී ඇත. එය පසුගිය වර්ෂයේ විද්‍යාර්ථයින් 79 දෙනෙකු වෙනුවෙන් පුහුණුව ලබා දී ඒ අතරින් ඉදිරිපත් වූ ව්‍යාපාර සැලසුම් 18ට සාපේක්ෂව 2023 වර්ෂයේ අත්කර ගත් සැලකිය යුතු ප්‍රගතියකි.

## 3.6 නිෂ්පාදන කර්මාන්තවල තත්ත්වය හා ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා පරීක්ෂණ පහසුකම් සැපයීම.

විද්‍යාතා ආයතනයේ මහපෙන්වීම සහ ක්‍රියාකාරිත්වය යටතේ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා ප්‍රමිතිය වර්ධනය කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සමඟ එක්ව තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාදීමේ වැඩසටහන යටතේ තත්ත්ව පරීක්ෂණ වාර්තා 200 ක් නිකුත් කර ඇති අතර ව්‍යවසායකයන් 300 ක් සඳහා තාක්ෂණ පුහුණු කිරීමේ වැඩමුළු පවත්වා ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ එක්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පද්ධති සහතිකකරණය, යහපත් නිෂ්පාදන භාවිතයන් පිළිබඳ GMP, ISO සහතික නිකුත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇත. මේ යටතේ GMP තත්ත්ව සහතිකකරණය සඳහා ඉල්ලුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් අතරින් 59 දෙනෙකුද ISO තත්ත්ව සහතිකකරණය සඳහා අයදුම්කරුවන් 77 දෙනෙකුද සුදුසුකම් ලබා ඇති අතර ඔවුන් සඳහා සහතිකකරණ ක්‍රියාවලිය සිදුකිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක වේ. අයදුම්කරුවන් 25 දෙනෙකු සඳහා මේ වන විටත් GMP සහතික ලබා දී ඇත. ඉතිරි ව්‍යවසායකයින් සඳහාද කඩිනමින් සහතික ලබා දීමට කටයුතු කෙරේ.

# 4. නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය

## 4.1 උපදේශක කමිටු පිහිටුවීම.

- දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව සපුරාලීම මත කර්මාන්ත අංශ සඳහා නව උපදේශක කමිටු 20ක් පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශයේ සහභාගීත්වය සහිතව පිහිටුවීමට කටයුතු කර ඇත. නව උපදේශක කමිටුවල ක්‍රියාකාරිත්වය හරහා ආනයනය සීමා කර තිබූ මෝටර් රථ උපාංග සහ නානකාමර උපාංග වැනි නිෂ්පාදන ක්ෂේත්‍රවල විශාල පිබිදීමක් ඇති වී ඇති අතර මෙම කමිටු මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ.

## 4.2 කර්මාන්ත ප්‍රවර්ධනය හා අලෙවිකරණය.

මේ යටතේ කර්මාන්ත ප්‍රදර්ශන සහ සංවාද සම්මන්ත්‍රණ (Symposium) පවත්වා ඇත.

### පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණ වැඩසටහන

විවිධ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන මට්ටමින් සිදුකර ඇති පර්යේෂණ සහ නව නිපයුම් සුදුසු කර්මාන්තකරුවන් හා එක්ව වාණිජකරණය කර අපනයන වෙළඳපොල වටිනාකම් වැඩිකිරීම සහ දේශීය වෙළඳපොළ වටිනාකම් වැඩි කිරීම මෙන්ම දේශීය වෙළෙඳපොල අවස්ථා උදාකර දීම අරමුණු කරගනිමින් වර්ෂය තුල පර්යේෂණ හා සංවාද සම්මන්ත්‍රණ පැවැත්වීය.

- 1 වන සංවාද සම්මන්ත්‍රණය (Symposium -1) ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය පිලිබඳ 2023 මාර්තු 30 සහ 31 දිනයන්හිදී වෝටර්ස් ඒජ් හිදී පවත්වන ලදී. එහිදී වාණිජකරණය සඳහා පර්යේෂණ සොයා ගැනීම් සහ නවෝත්පාදන 23 ක් ඉදිරිපත් වූ අතර එයින් තෝරාගත් නිෂ්පාදන 6 ක් සඳහා වාණිජකරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- 2 වන සංවාද සම්මන්ත්‍රණය (Symposium -2) රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳ 2023 ජූනි 22 ආරම්භ වූ ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයේ දෙවන දින, විශේෂිත සම්මන්ත්‍රණයක් ලෙස ජූනි මස 23 වන දින පැවැත්වූ අතර එමඟින් නව නිෂ්පාදන 3 ක් තෝරාගෙන වාණිජකරණය සඳහා කටයුතු කරමින් පවතී.

- 3 වන සංවාද සම්මන්ත්‍රණය (Symposium -3) රබර්, ප්ලාස්ටික් සහ තන්තු ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් 2023 ජූලි 26 වන දින කර්මාන්තකරුවන් 125කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් වෝටර්ස් ඒජ් හිදී පවත්වන ලදී. මෙහිදී ඉදිරිපත් වූ පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන 28 අතරින් නව නිපැයුම් 6 ක් තෝරාගෙන ඉන් 2 ක් මේ වන විටත් වාණිජකරණය සඳහා ගිවිසුම්ගතව ඇති අතර ඉතිරි 4 සඳහා වාණිජකරණ කටයුතු ආරම්භ කර ඇත.

- 4 වන සංවාද සම්මන්ත්‍රණය (Symposium - 4) රූපලාවන්‍ය, රෙදිපිළි සහ ඇඟලුම්, පාවහන් සහ ඒ ආශ්‍රිත පැළඳිය හැකි විලාසිතා උපාංග, ඖෂධීය නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිතව 2023 ඔක්තෝබර් මස 12වන දින වෝටර්ස් ඒජ් හිදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

### කර්මාන්ත ප්‍රදර්ශන

දේශීය කර්මාන්ත අන්තර්ජාතික වෙළඳපොලට ගෙනයාම ඉලක්ක කර ගනිමින් ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 2023 ජූනි 22 සිට 25 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී (BMICH) කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) සම්බන්ධීකරණයද සහිතව සාර්ථකව පවත්වන ලදී. මෙම දැවැන්ත ප්‍රදර්ශනයට නිෂ්පාදන අංශ **20** ක් නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටි **750** ක් ඇතුළත් වූ අතර දිවයින පුරා පිහිටි ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ කර්මාන්ත බොහොමයක් සම්බන්ධ වන ලදී.

(Virtual Exhibition**http://vindustryexpo.idb.lk/)**

ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

i. **ජූනි 22 ජාතික කර්මාන්ත දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම.**

ii. **ජාතික කර්මාන්ත සතියක් නම් කිරීම (ජූනි 22 - 28)**

සෑම වර්ෂයකම එම සතිය තුල රට පුරා කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීම තුලින් කර්මාන්ත නඟා සිටුවීම අපේක්ෂා කෙරේ. මේ යටතේ පළාත් මට්ටමින්ද කර්මාන්ත ප්‍රදර්ශන සංවිධානය කිරීම 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. 2023 සැප්තැම්බර් මස 1,2, සහ 3 යන දිනවලදී උතුරු පළාත් ප්‍රදර්ශනය යාපනය සංස්කෘතික මධ්‍යස්ථානයේදී පවත්වන ලද අතර මීලග ප්‍රදර්ශනය මධ්‍යම පළාතේ ඔක්තෝබර් මස 6,7,8 තෙදින තුල මහනුවර බෝගම්බර පැරණි බන්ධනාගාරයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

iii. **දේශීය කර්මාන්ත සංස්කෘතියක් නිර්මාණය කිරීම.**

දේශීය නිෂ්පාදන කර්මාන්තකරුවන් අතර සහසම්බන්ධතාවය ගොඩනැගීමේ අරමුණින් 2023 ජූනි 21 වන දින දේශියව එකලස් කරන ලද වාහන නිෂ්පාදන කර්මාන්තයේ නියැලෙන කර්මාන්තකරුවන් 100 කට වඩා වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් කොළඹ ගාලු මුවදොර සිට බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ කර්මාන්ත ප්‍රදර්ශන භූමිය දක්වා "ජාතික වාහන පෙරහැර" (National Vehicle Parade) පවත්වන ලදී.

iv. **පාසැල් තුල ව්‍යවසාය සංවර්ධන කව පිහිටුවීම. (School Industry Entrepreneurial Circle)**

මේ යටතේ "පාසල් ව්‍යවසාය සංවර්ධන කව" ජාතික වැඩසටහන පැවති ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව 2023 ජූනි 27 වැනි දින කොළඹ නාලන්දා විද්‍යාලයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන පිළිබඳ ගුරු පුහුණුවක් 2023 ජූනි 15 සහ 16 යන දිනවල මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී පාසල් 300 ක්ට වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි පවත්වන ලදී. මේ වන විට පාසල් ව්‍යවසායකත්ව කව 300 ක් ආරම්භ කර ඇති අතර 2024 දී එය 5000ක් දක්වා දියුණු කිරීම ඉලක්කය වේ.

- 2007 වර්ෂයේ සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2023 පෙබරවාරි මස 3, 4 සහ 5 යන දිනයන්හි දී දේශීය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ සහභාගීත්වය සහිතව බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී.
- ජාතික ශිල්ප සභාව මඟින් Crafting Ceylon ප්‍රදර්ශනය 2023 මාර්තු 23, 24 යන දෙදින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා 2214 ක නිර්මාණකරුවන් අතරින් නිර්මාණ 546 ක් තෝරාගෙන ඒ අතරින් සුපිරිතම නිර්මාණකරුවන් 100 ක් අපනයන අභිමුඛ ව්‍යවසායකයන් ලෙස සංවර්ධනයට දායකත්වය ලබා දී ඇත.
- "දියත උයන හස්ත කර්මාන්ත නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන වැඩසටහන" ("Shilpa Thursday") ශිල්පීන් 55 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2023 ජනවාරි මස 19 හා 26 යන දෙදින, පෙබරවාරි මස 2,9 හා 16 යන දිනයන්හිදී සහ මාර්තු මස 8, 9 යන දිනයන්හිදී සාර්ථකව පවත්වා ඇත.

- ඇසුරුම් සඳහා දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2023” ප්‍රදර්ශනය 2023 ඔක්තෝබර් මස 26,27 හා 28 යන දිනයන්හි දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

- බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන අදායම ඉහල නැංවීම, රැකියා අවස්ථා වැඩි කිරීම සහ සංචාරක කර්මාන්තයේ වර්ධනය ඉලක්ක කරගනිමින් බෝට්ටු නිෂ්පාදන සඳහා වූ බෝට්ටු සහ සමුද්‍ර ජාත්‍යාන්තර ප්‍රදර්ශනය 2023 ඔක්තෝබර් මස 27 වැනිදා කොලඹ වරාය නගර පරිශ්‍රයේදී පැවැත්වීමට සංවිධානය කර ඇත. කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ පැවැත්වීමට නියමිතව ඇති අතර තවත් ආයතන රැසකගේ දායකත්වය ද හිමි වේ

### 4.3 Industry 4.0 සඳහා උපායමාර්ගික පරිවර්තනය

- ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) සහ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් කණ්ඩායමක් සමඟ එක්ව නිෂ්පාදන කර්මාන්ත ඉලක්ක කර ගනිමින් කර්මාන්ත 4.0 සූදානම ස්වයං ඇගයීම් වැඩසටහන 2023 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) හා කර්මාන්ත අමාත්‍යාංශය එක්ව පවත්වන ලදී.

- **පර්යේෂණ සහ නව නිපැයුම් දත්ත පද්ධතිය**

  පර්යේෂණ සහ නව නිපැයුම් සංවාද සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් වූ නව නිපැයුම් ඇතුලත් කරමින් දත්ත පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇත.

## 5. ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීම

### 5.1 නව ක්‍රමවේද යටතේ නිෂ්පාදන අලෙවිය

- ලංකා ඛණිජ වැලි සමාගමේ ඛණිජ වැලි විකිණීම සඳහා නව විකුණුම් ක්‍රමවේදයක් හඳුන්වා දීමත් සමඟ ලංසුකරුවන්ට මාර්ගගතව මිල ගණන් ඉදිරිපත් කිරීමට හැකියාව පවතින අතර මිල ගණන් විවෘත කරන අවස්ථාවේදීම සුදුසුම ලංසුකරු පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කල හැකිය. ක්‍රමවේදය භාවිතා කර ප්‍රථම අලෙවිය සිදු කරන ලද අතර එමගින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 62,150 ක් සඳහා ඇ. ඩොලර් මිලියන 20.33 ක් ලබා ගැනීමට හැකි විය.

  දෙවන අලෙවිය මගින් සර්කෝන් 30,000 MT ක් වෙනුවෙන් USD 14.1ක ආදායමක් ලබා ගැනීමට හැකිවිය. එමගින් ලැබූ ආදායමෙන් රු. මි. 1726 ක මුදලක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරය වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

### 5.2 මැණික් අපනයන ආදායම ඉහල නැංවීම

- මැණික් සංචිත ඉහල නැංවීම සඳහා මැණික් කලාපයක් (මැණික් එම්පෝරියම්) පිහිටුවීමේ හැකියාව ගවේෂණය කිරීමේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතන සහ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඒකාබද්ධ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

- මැණික්, ස්වර්ණාභරණ සහ දියමන්ති නිෂ්පාදන අපනයනය කිරීම තුලින් 2023 සැප්තැම්බර් අවසන් වන විට ඇ.ඩො.මි. 420 ක පමණ ආදායමක් ජාතික ආර්ථිකයට ලබා දීමට හැකියාව ලැබිණි.

# ප්‍රධාන අංශ

# 01

# ප්‍රතිපත්ති සංවර්ධන අංශය

## 1.1 හැඳින්වීම

ශ්‍රම බලකාය සවිබල ගැන්වීම සහ නැගී එන කුසලතා සංවර්ධනය සඳහා වේදිකාවක් සැපයීම මගින් නව රැකියා උත්පාදනය, තාක්ෂණික දියුණුව සහ නවෝත්පාදන සඳහා කර්මාන්ත අංශය රටක ආර්ථික වර්ධනයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කාලෝචිතව සහ මනාව සකස් කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල මනා සංයෝජනය සහ එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තුළින් දේශීය කර්මාන්ත වර්ධනය කළ හැකිය. එකී ප්‍රතිපත්ති, රටේ දිගුකාලීන අරමුණු සමඟ පෙළගැස්වීමෙන් කාර්මික අංශයට අවශ්‍ය මඟ පෙන්වීම සහ මෙහෙයවීමට හැකියාව උදාවේ. ප්‍රායෝගික ප්‍රතිපත්ති මඟින් රටක කර්මාන්ත සාර්ථක වීමට අවශ්‍ය ස්ථායීතාවය, ඵලදායිතාව සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා තිරසාර ආයෝජනයන් සිදු කරයි. තවද, එවැනි ප්‍රතිපත්ති තුළින් පාරිසරික තිරසාරභාවය සහ සමාජ සාධාරණත්වය වැනි අභියෝගවලට ද විසඳුම් ලබාදිය හැකිය.

කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය මඟින් රට තුළ කාර්මික සංවර්ධනයේ ගමන්මග සැකසීම සහ එහි වර්ධනය සඳහා කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම අවසන් කර ඇත. මීට අමතරව, දේශීය මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා මෝටර් රථ එකලස් කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සැකසීම සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙයි. ඒ අනුව, ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ මෙම ප්‍රතිපත්ති නිවැරදිව හා ඵලදායී ලෙස රටේ නිෂ්පාදන අංශයේ අවශ්‍යතා සහ අභිලාෂයන් පිළිබිඹු වන බව සහතික කිරීමයි.

**කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි අභිවෘද්ධිය සඳහා සුදුසු උපායමාර්ගික දිශානතියක් නොමැති වීම සැලකිල්ලට ගෙන, අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් පුළුල් අදහස් විමසීමක් මත පදනම් වී, කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2022 වසරෙහිදී, සකස් කරන ලදී.

එකී කර්මාන්ත ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු 17 ට අනුකූලව සකස් කරනු ලැබුවේ, පොදුවේ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හිතකර පරිසරයක් සකස් කිරීමට මෙන්ම, ඉහළ ස්ථරවල ක්‍රියාත්මක වන කර්මාන්ත, කර්මාන්ත සංවර්ධනයේ 4.0 වන මට්ටම කරා ළඟා වීමට අවශ්‍ය පහසුකම් සැලසීමටය.

දීර්ඝ කාලීන ප්‍රතිපත්ති ලේඛණයක් වන කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ,පස් අවුරුදු උපායමාර්ගික සැලසුම් මාලාවක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරෙන අතර 2023 සිට 2027 දක්වා අදාල වන ඉන් පළමුවැන්න මේ වන විට සකස් කර ඇත .

**තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්**

ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින්, තීරුබදු ව්‍යුහයේ පවතින විෂමතා ඉවත් කිරීම මගින් දේශීය කර්මාන්ත වලට පහසුකම් සැලසීම, වර්ෂය පුරා තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම සහ තීරු බදු ප්‍රතිපත්ති සම්බන්ධ ක්‍රියාකාරකම්ද, ආනයන සීමා කිරීම් සම්බන්ධ කටයුතු ද මෙහෙයවනු ලබයි.

තීරුබදු ප්‍රතිපත්තිවලට අදාල අවශ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය සහ එකී දෙපාර්තමේන්තු ද, ශ්‍රී ලංකා රේගුව සහ මුදල් අමාත්‍යාංශය වැනි ආයතන වෙත කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීම වැනි කාර්යයන්ද මෙම අංශය විසින් සිදු කෙරේ.

**ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදනය, එකලස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (Standard Operating Procedure - SOP)**

මෝටර් රථ අංශය සඳහා නිෂ්පාදන බදු සහනය ලබා දීම නිර්දේශ කිරීම ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ තවත් ප්‍රධාන කාර්යභාරයකි. **සම්මත මෙහෙයුම් පටිපාටිය** (SOP) යනු දේශීයව වාහන එකලස් කිරීම සඳහා වන සියලුම මාර්ගෝපදේශ, රෙගුලාසි ක්‍රියා පටිපාටි සහ 'දේශීය අගය එකතු කිරීමේ න්‍යායය' අන්තර්ගත කොට කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අත්පොතකි.

ඒ අනුව, මෝටර් රථ කර්මාන්තය දියුණු කිරීම සහ රට තුළ නව රැකියා අවස්ථා ඇති කිරීම සඳහා දේශීයව නිෂ්පාදිත උපාංග සහිත වාහන දේශීයව එකලස් කිරීම ප්‍රවර්ධනය කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය SOP හරහා විශාල උත්සාහයක් දරයි.

**මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම**

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය මගින් මෝටර් රථ කර්මාන්තයේ ආයෝජන, නවෝත්පාදන, තිරසාරභාවය සහ ආරක්ෂාව සඳහා හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම, දේශීය සංරචක නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සහ ඩිජිටල්කරණය වැළඳ ගැනීම අරමුණු කරයි.

මෙම ප්‍රතිපත්තිය හරිත සංචලතා විසඳුම්, කුසලතා සංවර්ධනය සහ වගකිවයුතු ද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරමින් සමෘද්ධිමත් සහ ගෝලීය වශයෙන් තරඟකාරී මෝටර් රථ අංශයක්

පෝෂණය කිරීමට උත්සාහ කරයි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙන්, ආර්ථික වර්ධනයට සහ තිරසාරභාවයට දායක වෙමින් කර්මාන්තය ඉදිරියට ගෙනයාමට එය අපේක්ෂා කරයි.

## 1.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

පස් අවුරුදු උපායමාර්ගික සැලසුම් වලින් පළමුවැන්න , එහි එක් එක් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති විවිධ ආයතන හා අංශ විසින් 2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක කරන ලදී .

### කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම (Industry 4.0) කරා ළඟා වීමේ හැකියාව පිළිබඳව ස්වයං ඇගයීම

“ඩිජිටල්කරණය සහ කාර්මික පරිණාමය තුලින් හතරවන කාර්මික විප්ලවයට” යනු කර්මාන්ත ප්‍රතිපත්තියෙහි අන්තර්ගත ප්‍රතිපත්ති මූලධර්ම දහය අතරින් එකක් වන අතර ,උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් පරිච්ඡේදයක් මෙම ප්‍රතිපත්ති මූලධර්මය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් වී ඇත.

**කර්මාන්ත 4.0 නිෂ්පාදන කර්මාන්ත සඳහා සූදානම ස්වයං තක්සේරු වැඩසටහන**



බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයෙහි පර්යේෂක කණ්ඩායමක් විසින් ගොඩනගන ලද කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම (Industry 4.0) කරා ළඟා වීමෙහි සූදානම පිළිබඳව ස්වයං ඇගයීමේ වැඩසටහනක්, ඉහත කී ප්‍රතිපත්ති මූලධර්මයට අනුකූලව, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (Federation of Chambers of Commerce and Industry of Sri Lanka - FCCISL) හා ඒකාබද්ධ වී, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් විවිධ අනුඅංශයන් නියෝජනය කරන දේශීය නිෂ්පාදන කර්මාන්ත රැසක් අරභයා පවත්වන ලදී.

මෙලෙස මාර්ගගත මෙවලමක් මගින්, නිර්ණායක අටක් ඔස්සේ, දේශීය කර්මාන්තයන්හට කර්මාන්ත සංවර්ධනයෙහි හතරවන මට්ටම කරා ළඟා වීමේ හැකියාව පිළිබඳව ස්වයං ඇගයීමක් සිදුකිරීමේ හැකියාව ලැබුණු අතර, මෙකී ඇගයීමේ ප්‍රතිඵල, තාක්ෂණය ඉහල නැංවීම, නිපුණතා සංවර්ධනය හා පර්යේෂණ හා සංවර්ධන වැනි ක්ෂේත්‍රයන්හි ආයෝජනය කිරීම ආදී තීරණයන් ගැනීමේදී ප්‍රයෝජනවත් වනු ඇත.

### තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්

2023දී, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් අත්‍යවශ්‍ය නොවන ආනයන අඩු කිරීමට සහ තීරුබදු ගැටලු විසඳීමට උපකාර කරමින් දේශීය නිෂ්පාදනය දිරිමත් කරමින් රට තුළ කාර්මික සංවර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායක විය. මෙම අංශය දේශීය කර්මාන්ත සංවර්ධනයට අදාළව දේශීය කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. මීට අමතරව, තීරුබදු ප්‍රතිපත්තිය හරහා පරිසර හිතකාමී නොවන නිෂ්පාදන අඩු කිරීමට පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරයි.

දේශීයව එකලස් කරන ලද / නිෂ්පාදනය කරන ලද එච් එස් කේත 84 සහ 85 යටතේ වර්ගීකරණය කර ඇති විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා වන නිෂ්පාදන නිදහස් කිරීම් සඳහා වසර පුරා නිර්දේශ ලබා දීම සිදු කරනු ලැබේ.

දේශීය වශයෙන් 30% කට වඩා වැඩි වටිනාකමක් සහිතව එකලස් කර ඇති ශීතකරණ සහ රෙදි සෝදන යන්ත්‍ර වැනි විද්‍යුත් උපකරණ නව මාදිලි කිහිපයක් මේ වසර තුළ බිහිවිය. ඒ අනුව, කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලද සහයෝගය දේශීය කර්මාන්ත විසින් සැලකිය යුතු දේශීය රැකියා ප්‍රමාණය රටතුළ බිහිවිය.

**ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදනය, එකලස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP)**

රටට සහ අවසාන පාරිභෝගිකයින්ට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පසුගිය දෙවසරක අත්දැකීම් සහ සමහර ආයතන සහ නිෂ්පාදකයින් විසින් සූරාකෑමට ලක්වන සම්මත ක්‍රියා පටිපාටියෙහි ඇති හිඩැස් සහ අපැහැදිලිතා ඇතුළුව, වාහන නිෂ්පාදන / වාහන එකලස් කිරීම සහ වාහන උපාංග නිෂ්පාදනය සඳහා වූ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) මේ වන නැවත සමාලෝචනය සිදු කරමින් පවතී.

සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) ක්‍රියාත්මක කිරීමෙන් පසු, රට තුළ නව වාහන මාදිලි හැට හතරක් (64) සහ මෝටර් වාහන එකලස් කිරීමේ ආයතන විසි නවයක් (29) අනුමත කරන ලදී. මේ අතරින්, 2023 වසර තුළ සැප්තැම්බර් දක්වා මෝටර් රථ එකලස් කිරීමේ ආයතන දහයක් (10) සහ නව වාහන මාදිලි දහහතරක් (14) සඳහා අනුමැතිය ලබා දී ඇත. සම්මත මෙහෙයුම් පටිපාටියට පසුව එකලස් කරන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව ඒකක 20,169කි. මේ අතර, 2023 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා රෝද හතරේ වාහන 457 ක් සහ රෝද දෙකේ වාහන 8,656 ක් ඇතුළුව ඒකක 9,113 ක් එකලස් කර ඇත.

**මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම**

මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර ඇත අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් සැලැස්ම මේ වන විට සකස් කරමින් පවතී.

**වෙනත් ප්‍රතිපත්ති ආශ්‍රිත ක්‍රියාකාරකම්**

වෙනත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන විසින් සම්පාදනය කෙරෙන පාරිසරික, වෙළඳ, ප්‍රවාහන, බලශක්ති ආදී විවිධ ප්‍රතිපත්ති සඳහා, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් අඛණ්ඩව දායකත්වය දක්වනු ලබයි.

## 1.3 අනාගත සැලැසුම් 2024

**කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

අමාත්‍යාංශයේ විවිධ අංශයන් හා ආයතන වලට අමතරව, උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ වගකීම දරන බාහිර ආයතනයන්ගේද දායකත්වය ඇතිව, කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම.

**තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්**

පවතින ආර්ථික අර්බුදය හමුවේ දේශීය කර්මාන්ත සහ රටේ ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීම හෝ ස්ථාවරව පවත්වාගෙන යාම තුලින් 2023 දී ස්ථාවර තීරුබදු ව්‍යුහයක් සැකසීම සඳහා දායකත්වය අඛණ්ඩව ලබා දීමට අපේක්ෂා කෙරේ .ඒ අනුව, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් දේශීයව අගය එකතු කළ කර්මාන්ත සහ පරිසර හිතකාමී නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.

**ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදනය, එකලස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP).**

සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) 1.0 අනුවාදය දැනට සමාලෝචන ක්‍රියාවලියකට භාජනය කරමින් පවතින අතර පසුගිය වසර දෙක තුළ ගෘහස්ථ මෝටර් රථ එකලස් කිරීමේදී මුහුණ දුන් ගැටළු සහ ප්‍රායෝගික අත්දැකීම් සමාලෝචනය සලකා බලයි. සමාලෝචනයේ මූලික පරමාර්ථය වන්නේ පවතින SOP තුළ යම් අඩුපාඩු හෝ අපැහැදිලිතා හඳුනා ගැනීම සහ හිඩැස් නිවැරදි කිරීමයි.

2023 අවසානයට පෙර SOP සමාලෝචනය අවසන් කර 2024 මුල් භාගයේදී සංශෝධිත සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) අනුවාදය 2.0 දියත් කිරීමට සැලසුම් කර ඇත. එය SOP හි ගුණාත්මක භාවය සහ සඵලතාවය පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.

**මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම**

උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අවසන් කිරීමෙන් පසුව, මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2023 අවසානයේ කැබිනට් අනුමැතියට ඉදිරිපත් කරනු ඇත. අනුමැතියෙන් පසුව, මෝටර් රථ කර්මාන්තය තුළ ධනාත්මක වෙනස්කම් ආරම්භ කිරීමේ සහ වර්ධනය වර්ධනය කිරීමේ හැකියාව සහතික කරමින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ඇත.

**කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම**



# 02

# කර්මාන්ත සංවර්ධන අංශය

## 2.1. හැඳින්වීම

### ප්‍රධාන අරමුණු / පරමාර්ථ

සංවර්ධිත ප්‍රදේශවල පමණක් විසිරී ඇති කාර්මික අංශය, ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කර එමගින් ජාතික ආදායමට කාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම, කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශයේ කාර්ය භාරයයි. නව කර්මාන්තපුර පිහිටුවීමෙන් සහ පවතින කර්මාන්තපුර සංවර්ධනය තුළින් ප්‍රාදේශීය මට්ටමින් නව රැකියා අවස්ථා ඇති කිරීමෙන් මෙය සාක්ෂාත් කරගත හැකිය.

කර්මාන්ත සංවර්ධන අංශය විසින් ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත අංශයට අදාළ ආයෝජන දිරිමත් කිරීම, නව ආයෝජන අවස්ථා නිර්මාණය කිරීම, යටිතල පහසුකම් සැපයීම, ආයෝජකයින් සඳහා තාක්ෂණික සහාය සහ උපදේශන සේවා සැපයීම ආදිය තුළින් කර්මාන්ත අංශයේ සංවර්ධනය නඟා සිටුවීමට තවදුරටත් ප්‍රයත්න දරයි.

**නව කර්මාන්තපුර පිහිටුවීම සහ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය**

කර්මාන්ත සංවර්ධන අංශය මගින් කර්මාන්තපුරවල සංවර්ධන කටයුතු සිදු කරමින් ආයෝජකයන්ට ආයෝජන අවස්ථා ලබා දීම, රැකියා උත්පාදනය, අපනයන අගය එකතු කිරීම සහ ආනයන ආදේශන ප්‍රවර්ධනය කිරීම සිදු කරයි. 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා කාලය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 900 ක මුදලක් වෙන් කර ඇත.

2023 වර්ෂය තුළ නව කර්මාන්තපුර 8 ක් සංවර්ධනය කිරීම ඇතුළුව යටිතල පහසුකම් සංවර්ධන/වැඩිදියුණු කිරීමේ කාර්යයන්/වැඩ 12 ක් සිදු කලයුතු අතර ඉන් සංවර්ධන කාර්යයන් 3 ක් අවසන් කර ඇත. අනෙකුත් කාර්යයන්/වැඩ සක්‍රියව සිදුවෙමින් පවතින අතර ඒවා 2023 වසර අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. එක් කර්මාන්තපුරයක කටයුතු අවසන් කිරීමටත් අනෙක් කර්මාන්තපුර 5 හි වැඩ 2024 අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. ඉතිරි කර්මාන්තපුර 2 හි කටයුතු 2025 අවසන් වන විට නිම කෙරේ.

## 2.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

අක්කර 1024.25 කින් සමන්විත කර්මාන්තපුර 33 ක විදුලිය, ජලය සහ ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් සංවර්ධනය කර ඇත. කර්මාන්තපුර 33 හි මෙම සංවර්ධන කටයුතු වෙනුවෙන් රජය රුපියල් මිලියන 4,144.85 කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත. මීට අමතරව, පුද්ගලික අංශය විසින් කර්මාන්තපුරවල තම කර්මාන්ත ඒකක පිහිටුවීම සඳහා රු. මිලියන 61,353.49 ක් පමණ ආයෝජනය කර ඇත.

**සමුච්චිත ප්‍රගතිය - කර්මාන්තපුර**

**(අ) පවතින කර්මාන්තපුර**

| 2023 සැප්තැම්බර් මසට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 33 |
| සංවර්ධිත භූමි ප්‍රමාණය (අක්කර) (එනම් විදුලිය, ජලය සහ මාර්ග පද්ධතිය) | 1024.25 |
| මුළු ආයෝජනය (රු.මි.) | 65,498.35 |
| රජයේ ආයෝජනය (රු.මි.) | 4,144.86 |
| පුද්ගලික ආයෝජනය (රු.මි.) | 61,353.49 |
| වාණිජ නිෂ්පාදනයේ නියුතු කර්මාන්ත සංඛ්‍යාව | 353 |
| ඉදි කිරීම් අවස්ථාවේ ඇති කර්මාන්ත සංඛ්‍යාව | 37 |
| රැකියා අවස්ථා | 23,498 |
| කර්මාන්තපුරවල පවත්වනු ලැබූ ජංගම සේවා සංඛ්‍යාව | 12 |
| බදු ගිවිසුම සකස් කිරීමෙන් පසු එකතු කරගත හැකි හිඟ ඉඩම් බදු ප්‍රමාණය. (රු.මි.) | 81.80 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**(ආ) නව කර්මාන්තපුර**

| 2023 සැප්තැම්බර් මසට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| සංවර්ධනය කරනු ලබන කර්මාන්තපුර සංඛ්‍යාව | 8 |
| සංවර්ධනය වන භූමි ප්‍රමාණය (අක්කර) | 290.15 |
| රජයේ ආයෝජනය (ආසන්න වශයෙන්) (රු.මි.) | 142.05 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

**(1) නව කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කිරීම**

| | |
|---|---|
| ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු විසින් අනුමත කර ඇති නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 47 |
| අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 44 |
| නම වෙනස් කර ඇති කර්මාන්ත සංඛ්‍යාව | 9 |
| නිෂ්පාදන ක්ෂේත්‍රය වෙනස් කර ඇති කර්මාන්ත සංඛ්‍යාව | 5 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**(2) 2023 වර්ෂය සඳහා නව ව්‍යාපෘති/ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් සඳහා නිදහස් කරන ලද මුදල්**

මේ සඳහා 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා රුපියල් මිලියන 181.47ක් වෙන්කර ඇත.

**(අ) පවතින කර්මාන්තපුර සඳහා ආයෝජන**

| කර්මාන්තපුරය | සංවර්ධනය කාර්යය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) |
|---|---|---|
| ගලිගමුව | ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීම | 16.20 |
| උලපනේ | අතුරු මාර්ගයක් ඉදිකිරීම | 3.45 |
| වැලිඔය | පොම්පාගාරය සහ උපකරණ අලුත්වැඩියා කිරීම | 7.94 |
| පුත්තලම | නල ළිං සේදීම සහ අලුත්වැඩියා කිරීම | 0.23 |
| කරන්දෙණිය | අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම | 6.93 |
| නාලන්ද එල්ලාවල (අදියර I සහ II) | කාපට් පාරවල් සැකසීම | 14.57 |
| කළුතර | අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම | 7.50 |
| නාලන්ද එල්ලාවල (අදියර I සහ II) | මිනුම් | 0.67 |
| නාලන්ද එල්ලාවල (අදියර I සහ II) | ජලනල එලීම සඳහා කාණු කැපීම හා වැසීම | 11.96 |
| මිල්ලෑව | වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීම | 30.00 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

***කළුතර කර්මාන්තපුරය***

රුපියල් මිලියන 68.02 ක සමුච්චිත වියදමින් අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම් 65% ක් නිම කරන ලදී.

**අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම් - කළුතර කර්මාන්තපුරය**



***කරන්දෙණිය කර්මාන්තපුරය***

කරන්දෙණිය කර්මාන්තපුරය රුපියල් මිලියන 6.93 ක වියදමින් අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම අවසන් කරන ලදී.

**අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම් - කරන්දෙණිය කර්මාන්තපුරය**



**(ආ) දැනට ඉදිවන නව කර්මාන්තපුර**

***සූරියවැව කර්මාන්තපුරය***

මාර්ග සංවර්ධනය කිරීම හැර රුපියල් මිලියන 150.9 ක වියදමින් සූරියවැව කර්මාන්තපුරය සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර ඉඩම ආයෝජකයින් අතර බෙදා දීමට සූදානම්ව පවතී.

*සූරියවැව කර්මාන්තපුරය*



## 2.3. අනාගත සැලැසුම් 2024

### නව කර්මාන්තපුර සංවර්ධනය කිරීම

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අලුතපොල, දඹුල්ල, සඳමල්ගම, කටුනායක, රයිගම සහ වැල්ලවාය යන නව කර්මාන්තපුර වසර 2024 අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 50 ක (ත්‍රිකුණාමල කර්මාන්තපුරය - අදියර III) භූමි ප්‍රමාණයකින් යුත් නව කර්මාන්තපුරයක් 2024 දී සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

කර්මාන්ත සංවර්ධනයේ ඵලදායිතාවයක් ලබා ගැනීම අරමුණු කර ගනිමින් ඉදිරි වසර තුළ අවම වශයෙන් ආයෝජකයින් 50 දෙනෙකු සඳහා කර්මාන්තපුරවල ඉඩම් කොටස් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

## පවතින කර්මාන්තපුරයන්හි සංවර්ධන තොරතුරු 2023 සැප්තැම්බර් මස 30 දක්වා (සමුච්චිත)

| දිස්ත්‍රික්කය | කර්මාන්තපුර | ඉඩම් ප්‍රමාණය (අක්කර) | මුළු රාජ්‍ය ආයෝජනය (රු. මි.) | සමුච්චිත පුද්ගලික ආයෝජන (රු. මි.) | කර්මාන්ත සංඛ්‍යාව | සෘජු රැකියා | මුළු පිරිවැටුම (රු. මි.) |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | කොලොන්නාව | 7.00 | 36.17 | 639.30 | 14 | 623 | 101.04 |
| | රත්මලාන (අදියර 1 සහ 11) | 17.00 | 89.78 | 4085.00 | 18 | 1526 | 604.00 |
| | ටෙම්පල්බර්ග් (අදියර 1 සහ 11) | 48.00 | 180.58 | 4975.20 | 37 | 1790 | 747.75 |
| කළුතර | කළුතර | 50.00 | 118.54 | 1912.16 | 32 | 915 | 200.23 |
| | මතුගම | 50.00 | 174.43 | 5886.00 | 12 | 504 | 1016.33 |
| | මිල්ලෑව | 11.00 | 106.13 | 593.38 | 12 | 625 | 50.17 |
| | රයිගම්පුර | 24.00 | 390.09 | 0 | 0 | 0 | 0 |
| ගම්පහ | මිනුවන්ගොඩ | 15.00 | 44.12 | 2068.12 | 13 | 613 | 222.00 |
| | මහර | 2.50 | 14.05 | 324.20 | 7 | 169 | 175.60 |
| පුත්තලම | දන්කොටුව | 53.00 | 109.74 | 5192.60 | 31 | 1745 | 1194.28 |
| | පුත්තලම | 40.00 | 124.42 | 538.00 | 7 | 132 | 23.64 |
| | නුරානි | 15.84 | 12.58 | 740.90 | 5 | 498 | 138.02 |
| කුරුණෑගල | මාකඳුර (නැගෙනහිර) | 27.19 | 35.79 | 8320.00 | 2 | 703 | 792.19 |
| | මාකඳුර (බටහිර) | 65.56 | 95.94 | 2694.19 | 15 | 1038 | 1263.68 |
| | දඹදෙණිය | 10.15 | 38.36 | 663.00 | 3 | 990 | 296.21 |
| | නිකවැරටිය | 2.55 | 6.12 | 259.85 | 1 | 807 | 150.27 |
| පොළොන්නරුව | ලක්ෂඋයන (අදියර 1 සහ 11) | 63.90 | 176.04 | 3612.50 | 16 | 1152 | 890.75 |
| මාතලේ | නාලන්දාව | 24.70 | 77.28 | 2251.40 | 14 | 1214 | 412.44 |
| මහනුවර | උලපනේ | 25.00 | 138.86 | 4394.50 | 14 | 792 | 2088.726 |
| මාතර | උඩුකාව | 21.13 | 50.93 | 861.80 | 3 | 1372 | 375.10 |
| ගාල්ල | කරන්දෙණිය | 40.00 | 71.21 | 788.56 | 13 | 527 | 91.33 |
| හම්බන්තොට | බට - අත | 105.00 | 320.08 | 1982.33 | 7 | 402 | 317.60 |
| අම්පාර | නවගම්පුර | 20.00 | 45.83 | 178.70 | 5 | 44 | 19.30 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය (අදියර 1 සහ 11) | 50.00 | 511.07 | 1872.30 | 5 | 1485 | 114.75 |
| මඩකලපුව | තිරායිමඩු | 24.30 | 8.35 | 0 | 0 | 0 | 0 |
| රත්නපුරය | නාලන්ද එල්ලාවල (1) | 36.38 | 79.49 | 1567.65 | 21 | 384 | 43.03 |
| | නාලන්ද එල්ලාවල(11) | 45.00 | 126.35 | 853.85 | 26 | 313 | 85.15 |
| | ඇඹිලිපිටිය | 22.81 | 98.98 | 173.00 | 3 | 173 | 84.56 |
| කෑගල්ල | ගලිගමුව | 21.59 | 184.69 | 789.00 | 8 | 309 | 237.30 |
| මොනරාගල | බුත්තල | 18.35 | 118.76 | 2135.00 | 4 | 900 | 247.00 |
| බදුල්ල | ඌව පරණගම | 3.30 | 0.81 | 2.00 | 1 | 20 | 3.00 |
| මන්නාරම | මන්නාරම | 24.00 | 351.76 | 250.00 | 1 | 1082 | 1632.65 |
| මුලතිව් | වැලිඔය | 40.00 | 205.95 | 749.00 | 3 | 651 | 54.00 |
| වෙනත් | දැන්වීම් | | 1.55 | 0 | 0 | 0 | 0 |
| | **එකතුව** | **1,024.25** | **4,144.85** | **61,353.49** | **353** | **23,498** | **13,672.09** |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

## නව කර්මාන්තපුරයන්හි තොරතුරු 2023 සැප්තැම්බර් මස 30 දක්වා (සමුච්චිත)

| දිස්ත්‍රික්කය | කර්මාන්තපුර | ඉඩම් ප්‍රමාණය (අක්කර) | මුළු රාජ්‍ය ආයෝජනය (රු. මිලියන) |
|---|---|---|---|
| ගම්පහ | අළුතේපොල | 7.89 | 17.23 |
| | කටුනායක | 100.00 | 2.39 |
| මාතලේ | දඹුල්ල (I අදියර) | 24.00 | 22.07 |
| | දඹුල්ල (අදියර ii) | 40.00 | 14.96 |
| අනුරාධපුර | සඳමල්ගම | 16.00 | 15.86 |
| හම්බන්තොට | සූරියවැව | 20.00 | 41.82 |
| මොනරාගල | වැල්ලවාය | 9.25 | 8.28 |
| කුරුණෑගල | රිදීබැදිඇල්ල | 23.00 | 17.75 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය (iii අදියර) | 50.00 | 1.67 |
| | **එකතුව** | **290.14** | **142.05** |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

# 03

# ආංශික සංවර්ධන අංශය

# සංවර්ධන අංශ 01

## 3.1 හැඳින්වීම

අමාත්‍යාංශය යටතේ සේවා පහසුකම් සපයන ප්‍රධාන නිෂ්පාදන අංශ 21 අතරින් කෘෂිකාර්මික කර්මාන්ත සංවර්ධන කටයුතු සංවර්ධන අංශ 1 යටතේ පවතී. මෙම අංශය යටතේ සැකසූ ආහාර, තේ, කුළුබඩු, කොහු ආශ්‍රිත නිෂ්පාදන, ඇසුරුම් කර්මාන්ත, කිරි හා කිරි ආශ්‍රිත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### ප්‍රධාන අරමුණු

1. ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
2. දේශිය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

### ක්‍රියාකාරකම්

- ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම්කර ඇති සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාල ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැලසුම් හා උපාය මාර්ග පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අදාළ අංශයන්හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවායෙහි උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.

- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමගින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.

- දේශීය සහ විදේශීය කාර්මික ආයතන මගින් කර්මාන්ත සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැලසීම.

- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.

- භාණ්ඩ අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය තත්ත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

## 3.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**<u>ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්</u>**

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් සෘජු හා වක්‍ර වශයෙන් 2023 සැප්තැම්බර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත 223 ක් සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 398 සඳහා නිර්දේශ ලබා දී ඇත.

*කර්මාන්ත සඳහා TIEP පහසුකම් ලබා දීම (2023 සැප්තැම්බර් දක්වා)*

| කර්මාන්ත අංශය | ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව | 2023 සැප්තැම්බර් දක්වා කර්මාන්ත ගණන | 2023 වර්ෂය තුල නිකුත් කරන ලද ලිපි |
|---|---|---|---|
| සැකසූ ආහාර කර්මාන්ත<br>අගය එකතු කල කුළුබඩු කර්මාන්ත | 246 | 59 | 135 |
| ඇසුරුම් කර්මාන්ත | 301 | 55 | 100 |
| අගය එකතු කළ තේ කර්මාන්ත | 272 | 82 | 108 |
| එකතු කළ අගය කොහු කර්මාන්ත | 64 | 20 | 36 |
| වෙනත් කර්මාන්ත | 52 | 7 | 19 |
| මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත | 2 | 2 | 2 |
| Total | 935 | 223 | 398 |

*මූලාශ්‍රය:* **සංවර්ධන අංශ - I**

- ඒ අනුව කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම පිණිස භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී තීරුබදු සහන සැපයීම සඳහා අමාත්‍යාංශය සහය ලබාදෙනු ලැබේ. මෙමගින් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ තරඟකාරීත්වය වැඩි කිරීම මෙයින් සිදු කරයි.

### තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන්

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථකව නිම කරන කර්මාන්ත වෙනුවෙන් අදාල සහතික පත්‍ර සහ ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව රු.300,000/- (උපදේශන ගාස්තු ද ඇතුළුව) උපරිමයකට යටත්ව අදාල සහතික පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා සැකසූ ආහාර කර්මාන්ත අංශය, ඇසුරුම්කරණ කර්මාන්ත අංශය, අගය එකතු කළ තේ කර්මාන්ත අංශය, අගය එකතුකළ කුළුබඩු අංශය සහ කොහු කර්මාන්තය නියෝජනය වන පරිදි 2023 වර්ෂය සඳහා කර්මාන්ත 77 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත.

- ISO සහතිකකරණය සාර්ථකව නිමකරන කර්මාන්ත සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කරණු ලැබේ.

- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබා ගැනීමේ දී අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදේ. වැඩසටහන මෙම වසරේ විද්‍යා ඒකකය සමග ඒකාබද්ධව සිදුකරනු ලැබේ. වැඩසටහන සඳහා කර්මාන්ත 59ක් 2023 වර්ෂයේදී තෝරා ගන්නා ලදී.

### නිපුණතා සංවර්ධන වැඩසටහන්

- ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන සති අන්ත දින 22 කාල සීමාව තුළ ඩිප්ලෝමා පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ඇසුරුම් කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවයක් වන තාක්ෂණික ශිල්පීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමයි. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 29 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වේ.

### අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/Propack ප්‍රදර්ශනය 2023 අගෝස්තු මස 4,5,6 යන දිනයන් වල දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව නිමකරන ලදී.

**Profoods/Propack ප්‍රදර්ශනය**




මෙම ප්‍රදර්ශනය තුළින් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 13 සඳහා වෙන් කරන ලද විශේෂිත මණ්ඩපය මගින් සුළු හා මධ්‍ය පරිමාණ

කර්මාන්ත සඳහා විශේෂ සහන මත ප්‍රදර්ශන කුටි ලබාදීමට කටයුතු කර ඇත.

**Profoods/Propack ප්‍රදර්ශනය**



එසේම, මෙම ප්‍රදර්ශනයේ දී විශ්ව විද්‍යාල සහ කර්මාන්ත අතර සම්බන්ධතා ඇති කිරීමට සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීමේ අභිප්‍රායෙන් අමාත්‍යාංශය විසින් විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් සහභාගි කරවීමට ද කටයුතු කරන ලදී.

**ලංකා පැක් - 2023 ප්‍රදර්ශනය**



- ඇසුරුම් සඳහා දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට "ලංකා පැක් -2023" ප්‍රදර්ශනය 2023 ඔක්තෝබර් මාසයේ 26,27 හා 28 යන දිනයන්හි දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මෙම ප්‍රදර්ශනය සඳහා මධ්‍ය පරිමාණ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත සහභාගී වන අතර ඒ තුළින් ඔවුන්ගේ නිර්මාණශීලී නිෂ්පාදනයන් සඳහා උප කොන්ත්‍රාත් ලබා ගැනීමට අවශ්‍ය මූලික පසුබිම සැකසීම සහ නිෂ්පාදන ඇනවුම් වැඩිකර ගැනීමට හැකියාව සැලසෙනු ඇත.

- දේශීය කර්මාන්තකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම, අත්දැකීම් ලබාගැනීමේ අවස්ථා ඇති කිරීමත්, ශ්‍රී ලංකාවේ ඇසුරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම ප්‍රදර්ශනය පැවැත්වේ. ප්‍රදර්ශනය ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP) සහයෝගය ඇතිව අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබයි. මේ හා සමගාමීව ඇසුරුම් සම්මේලනයද පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

- සැකසූ ආහාර ආශ්‍රිත කර්මාන්ත අංශයන්හී පර්යේෂණ සොයා ගැනීම් සහ නවෝත්පාදන වාණිජකරණය සඳහා වූ සමුළුවක් 2023 මාර්තු 30, 31 දිනයන් හී බත්තරමුල්ල වෝටර්ස් ඒජ්හි දී සාර්ථකව නිම කරන ලදී.

**සැකසූ ආහාර ආශ්‍රිත කර්මාන්ත අංශයන්හී පර්යේෂණ සොයා ගැනීම් සහ නවෝත්පාදන වාණිජකරණය සඳහා වූ සමුළුව**




එම සමුළුව සඳහා පර්යේෂණ සොයා ගැනීම් සහ නවෝත්පාදන 163ක් ඉදිරිපත් කර තිබූ අතර කර්මාන්තකරුවන්ගේ සහභාගීත්වයෙන් මෙම සමුළුව සාර්ථකව පවත්වන ලදී.

**සැකසූ ආහාර ආශ්‍රිත කර්මාන්ත අංශයන්හී පර්යේෂණ සොයා ගැනීම් සහ නවෝත්පාදන වාණිජකරණය සඳහා වූ සමුළුව**





මෙහිදී ඉදිරිපත් කෙරුණු පර්යේෂණ හා සොයා ගැනීම් සහ නවෝත්පාදන අතරින් නවෝත්පාදන 06ක් මේ වන විට වාණිජකරණය සඳහා මූලික සාකච්ඡා වට ආරම්භ කර ඇත.

## 3.3 අනාගත සැලසුම් - 2024

1. කර්මාන්ත අංශවල උපදේශක කමිටු යෝජනා හා අදහස් පදනම් කරගනිමින් ඒ ඒ අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

2. සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තයේ සහ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන් සහ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන වලට සහය සැපයීම.

3. සැකසූ ආහාර අංශය, ඇසුරුම් කර්මාන්ත අංශය, තේ, කොහු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන හා කුළුබඩු කර්මාන්ත අංශයේ තත්ත්ව සහතික ලබා ගැනීම ඵලදායීතාවය සහ වෙළෙඳපොළ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමේ (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

4. සුළු පරිමාණ කර්මාන්තවල ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන ක්‍රියාවට නැංවීම.

5. අගය එකතු කරන ලද නිෂ්පාදන වල අපනයන වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

6. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා නූතන තාක්ෂණික ක්‍රම අත්පත්කර ගැනීම පිළිබඳව සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

7. ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඇසුරුම් තාක්ෂණය ඉහළ නංවා ගැනීම සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය.

# 04

# සංවර්ධන අංශ 02

## 4.1හැඳින්වීම

### ප්‍රධාන අරමුණ

දේශිය කර්මාන්ත උප අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමගින් උසස් නිමාවකින් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහිකරමින් ජාත්‍යන්තර වෙළෙඳපොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

### අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- සෙරමික්, ටයිල්, ග්‍රැනයිට්, උළු නිෂ්පාදන කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- වාහන එකලස් කිරීම් හා වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත
- තීන්ත, මුද්‍රන ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත
- ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත

**කාර්යයභාරය**

- කර්මාන්ත උප අංශ සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරිමේදී රාජ්‍ය අංශය, අධ්‍යාපනඥයින් සහ කර්මාන්තකරුවන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.
- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාල ගැටළු අවබෝධ කර ගැනිම සඳහා අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීම.
- දේශිය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීමේදී දේශිය හා විදේශිය වාණිජ මණ්ඩල, රාජ්‍ය අංශයට අයත් ආයතන, සමාගම් හා කර්මාන්ත සංවර්ධනයට ආධාර ලබාදෙන වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය.
- ඵලදායිතාවය ඉහල නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරිම සඳහා සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශිය හා විදේශිය පුහුණුව ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- විදේශ ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම, අමු ද්‍රව්‍ය ආනයනය කර දේශීය වටිනාකමක් එකතු කර නැවත අපනයනය කිරීම (TIEP) සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම, තාවකාලිකව ආනයනය සීමා කර ඇති, කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා නිර්දේශ ලබා දීම හා කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන හා බදු නිදහස් කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම වැනි කාර්යයන් හරහා කර්මාන්ත කරුවන්ට තම කර්මාන්තයන් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම.

## 4.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

රබර්, ප්ලාස්ටික් සහ තන්තු ආශ්‍රිත කර්මාන්ත අංශයෙහි පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන වානිජකරණය සඳහා වූ සමුළුවක් වෝටර්ස් එජ් හිදී පවත්වන ලදී. මෙම සමුළුව සඳහා පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන 28 ක් ඉදිරිපත්කර තිබූ අතර, 125 ට අධික කර්මාන්ත කරුවන්ගේ සහභාගීත්වයෙන් මෙම සමුළුව සාර්ථකව පවත්වන ලදී. අමාත්‍යාංශය මේ සඳහා රු. මිලියන 1.86 ක වියදමක් දරා ඇත. මෙහිදී ඉදිරිපත් කෙරුණු පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන 28 අතරින්, නවෝත්පාදන 05 ක් මේ වනවිට වානිජකරණය සඳහා වූ මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

**වෝටර්ස් එජ් හිදී පවත්වන ලද රබර්, ප්ලාස්ටික් සහ තන්තු ආශ්‍රිත කර්මාන්ත අංශයෙහි පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන වානිජකරණය සඳහා වූ සමුළුව**



### බෝට්ටු හා බෝට්ටු උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය

- **බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත සඳහා බේරුවල බෝට්ටු දියත් මගක් පිහිටුවීමේ ව්‍යාපෘතිය**

  අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගක් බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටු වීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

මෙය වසර 02 ක ව්‍යාපෘතියක් වන අතර, 2024 වර්ෂයෙහි අවසන් කිරීමට නියමිතය. මෙහි අපේක්ෂිත වියදම වන රු. මිලියන 80 ක මුදල අමාත්‍යාංශය විසින් දැරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ වශයෙන්, බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන ආදායම ඉහල යාම, රැකියා අවස්ථා ඉහල යාම හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට මෙය ඉවහල් වීම දැක්විය හැකිය.

- බෝට්ටු නිෂ්පාදන අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනයක් සහ කලාපීය සම්මන්ත්‍රණයක් මෙම වසරෙහි ඔක්තෝබර් මාසයේදී කොළඹ වරාය නගර පරිශ්‍රයේදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

  මෙම ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ අපේක්ෂා කරයි.

1. ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වන නව කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම
2. ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ රැස්වීම් සහ හවුල් ව්‍යාපාර අවස්ථා සඳහා ඉඩ සැලසීම
3. නව තාක්ෂණය ලබා ගන්නා කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම
4. අපනයන සහ නාවික සංචාරක ව්‍යාපාරයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීම

### මැටි සෙවිලි උළු නිෂ්පාදන කර්මාන්ත අංශය

- **රතු මැටි සෙවිලි උළු නිෂ්පාදන කර්මාන්ත සඳහා SLS සහතිකය ලබා ගැනීමේ වැඩසටහන**

දේශීය රතු මැටි සෙවිලි උළු නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම හා වෙළෙඳපොල අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගනිමින් රතු මැටි සෙවිලි උළු සඳහා SLSI වෙතින් ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අමාත්‍යාංශය අදාල කර්මාන්ත ආයතනයන්ට සහාය වීම මෙහිදී සිදුවේ. මෙම ව්‍යාපෘතිය යටතේ කර්මාන්තකරුවන් 10 දෙනෙක් සඳහා SLS ප්‍රමිතිය ලබා ගැනීමට වැයවන මුදලින් 50% ක් අමාත්‍යාංශය විසින් ලබා දීමට සැලසුම් කර ඇත.

### දේශීය කර්මාන්ත සඳහා සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන (RECP) ඇගයීම සහ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන

කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම අරමුණු කරගනිමින් අමාත්‍යාංශය, ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව සිදුකරන ව්‍යාපෘතියකි. විවිධ කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි තෝරාගත් කර්මාන්ත 20 ක් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

**ව්‍යාපෘතිය පිළිබඳ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන**



මෙම ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ අපේක්ෂා කරයි.

1. සම්පත් කාර්යක්ෂමතාව ඉහල යාම මගින් නිෂ්පාදන පිරිවැය අවම වීම හා එමගින් තරඟකාරීත්වය ඉහලයාම
2. නව වෙළඳපොලවල් හා ආයෝජන අවස්ථා බිහිවීම
3. කර්මාන්ත මගින් සිදුවන පරිසර දූශනය අවම වීම
4. කර්මාන්ත ශාලා තුල යහපත් පරිසරයක් බිහිවීම මගින් සේවක සෞඛ්‍ය ඉහල යාම

ධාරිතා ගොඩනැංවීමේ දෙදින පුහුණු වැඩසටහන




## 4.3 අනාගත සැලසුම් - 2024

- අගය එකතු කල නිෂ්පාදන සඳහා දේශිය කර්මාන්තකරුවන් වැඩි වශයෙන් යොමු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත අංශයේ නියුක්ත තාක්ෂණික ශිල්පීන්ගේ කුසලතා නංවාලීම සඳහා දේශිය හා විදේශිය පුහුණු පාඨමාලා සඳහා තාක්ෂණික ශිල්පීන් යොමු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා දේශිය කර්මාන්තකරුවන් උනන්දු කිරීම පිණිස එම ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා අවශ්‍ය මුල්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රබර් නිෂ්පාදන සඳහා ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතික ලබා දීමට අවශ්‍ය විද්‍යාගාර පහසුකම් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය තුල ඇති කර එමගින් ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතික ලබා දීමේ හැකියාව එම ආයතනයට ලබා දීම සඳහා වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත ආශ්‍රිත පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන වානිජකරණය සඳහා කර්මාන්ත කරුවන් හා නව නිපැයුම් කරුවන්ගේ සහභාගීත්වයෙන් සමුළුවක් පැවැත්වීම.
- කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සඳහා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත සඳහා සුදුසු සැපයුම් දාම කළමනාකරණ පද්ධතියක් බිහි කිරීම හා පවත්වාගෙන යාම සඳහා වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- වාහන බැටරිවල ගුණාත්මකභාවය ඉහල නැංවීම හා නව ආකෘති නිර්මාණය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටුවීමට යෝජිත, අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.

# 05

# සංවර්ධන අංශ 03

## 5.1 හැදින්වීම

### මූලික අරමුණු

ජාත්‍යාන්තර වෙළඳපොල තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදන සඳහා පහත සඳහන් කර්මාන්ත, උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

- පාවහන්, සම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත
- ඖෂධ කර්මාන්තය
- රූපලාවන්‍ය කර්මාන්තය
- ලෝහ ආශ්‍රිත කර්මාන්තය
- ඇඟළුම් ආශ්‍රිත කර්මාන්ත

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශ උපදේශක සහා රැස්වීම් කැදවීම, සංවර්ධන උපාය මාර්ග සාකච්ඡා කිරීම හා ඒවාට අවශ්‍ය උපදෙස් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත උපඅංශ සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- රේඛීය අමාත්‍යාංශ, වෙළඳ සංගම්, සම්මේලන හා විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රවල උන්නතියට කටයුතු කිරීම.
- තෝරාගනු ලැබූ කර්මාන්ත අංශයන්හි කුසලතා සංංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

- නිදහස් වෙලෙඳ ගිවිසුම් තුලින් තම වෙලඳපොල කොටස ඉහල නංවා ගැනීමට කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.
- අපනයන දිරිගැන්වීම සඳහා තාවකාලික ආනයන, අපනයන ක්‍රියාවලිය (TIEP) මගින් පහසුකම් සැලසීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය විදේශිය විශේෂඥයින් වෙනුවෙන් වීසා නිර්දේශ කිරීම.
- දේශිය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොල තරගකාරීත්වයට මුහුණ දීම සඳහා දේශිය නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- අබලි ලෝහ අපනයනය සඳහා නිර්දේශ ලබාදීම.
- ලෝහ ආශ්‍රිත කර්මාන්තකරුවන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සහයෝගය ලබා දීම.
- උක්ත කර්මාන්ත උප අංශවල කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය විදේශිය ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම.
- විවෘත ගිණුම් (Open Account) යටතේ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා නිර්දේශ ලබාදීම.

## 5.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2023 වර්ෂයේ පෙබරවාරි මස 3, 4 සහ 5 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා දේශිය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙලඳකුටි 108 ක් පමණ සංවිධානය කෙරිණි.
- තරුණයන් හා කාන්තාවන් සඳහා ව්‍යාපාර අවස්ථා ඇති කිරීමේ අරමුණින් තරුණයන් හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා පාවහන් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි. මෙය ව්‍යාපෘති තුනක් (03) ලෙස ගාල්ල, ඇල්පිටිය හා මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කෙරිණි.
- බෑග් නිෂ්පාදන ව්‍යවසායකයන්ගේ සැලසුම් සහ රටා සැකසීමේ කුසලතා වැඩිදියුණු කිරීම මගින් නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා බෑග් සහ පාවහන් නිෂ්පාදකයින් සඳහා සැලසුම් සහ තාක්ෂණික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන ව්‍යාපෘති හතරක් (04) ලෙස කළුතර, මාතර, කුරුණෑගල සහ යාපනය යන ප්‍රදේශ වල පවත්වා අවසන් කර ඇත.
- පවතින නිෂ්පාදන වෙලඳපොල පුළුල් කිරීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කුෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ රූපලාවන්‍ය නිෂ්පාදන සමාගම් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය සහය හරහා ශ්‍රී ලංකාවේ රූපලාවන්‍ය කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

- ගෝලීය අපනයනය දාමයට එක්වීම සඳහා පවතින නිෂ්පාදකයින්ගේ කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සම් සහ පාවහන් පිළිබඳ දැනට සිටින සේවකයන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත.

- ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන කර්මාන්ත අංශ පිලිබඳව සිදු කරනු ලබන පර්යේෂණ සොයාගැනීම් සහ නව නිපැයුම් වානිජකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ඒ අනුව, රූපලාවන්‍ය, රෙදිපිලි හා ඇඟළුම්, පාවහන් , සම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ, සුවතා නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජකරණය කිරීම සඳහා වූ වාණිජකරණ වැඩසටහන සංවර්ධන අංශ 3 මගින් 2023 ඔක්තෝබර් මස 12 දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

## 5.3 අනාගත සැලසුම් -2024

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2024 වර්ෂයේ ද පැවැත්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වීමට අපේක්ෂිතය.

- දේශීය ඇඟලුම් නිෂ්පාදකයින්ගේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් හා ඇඟළුම් වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් පමුණුව ප්‍රදේශයේ දේශීය ඇඟළුම් නිෂ්පාදකයින්ට පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- කර්මාන්ත ආයතනවල නිෂ්පාදන පිරිවැය අවම කිරීමට හා බලශක්ති කාර්යක්ෂමතාවය ඇති කිරීමට සම්පත් කාර්යක්ෂමතාව හා පිරිසිදු නිෂ්පාදන තක්සේරුවක් කර්මාන්ත ආයතන වලට ලබා දීමේ අරමුණින් ව්‍යාපෘතියක් National Cleaner Production Centre (NCPC) හා එක්ව කර්මාන්ත අමාත්‍යාංශය 2024 දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- තරඟකාරීත්වය සහ තිරසාර බව වැඩි කිරීම සඳහා දේශීය විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතනවල නිර්මාණය කරන ලද තාක්ෂණික නවෝත්පාදනයන් භාවිතා කිරීම දිරිමත් කිරීම සඳහා කර්මාන්තය ආශ්‍රිත පර්යේෂණ සොයාගැනීම් සහ නවෝත්පාදන වාණිජකරණය කිරීමේ ව්‍යාපෘතිය 2024 දී ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කල බැග් නිෂ්පාදන ව්‍යවසායකයන්ගේ සැලසුම් සහ රටා සැකසීමේ කුසලතා වැඩිදියුණු කිරීම මගින් නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා බැග් සහ පාවහන් නිෂ්පාදකයින් සඳහා සැලසුම් සහ තාක්ෂණික පුහුණු වැඩසටහන 2024 වර්ෂයේ දී ද පැවැත්වීමට නියමිතය.

- තරුණයන් හා කාන්තාවන් සඳහා ව්‍යාපාර අවස්ථා ඇති කිරීමේ අරමුණින් තරුණයන් හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා පාවහන් පුහුණු වැඩසටහනක් 2024 වර්ෂයේ දී ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

# 06

# කර්මාන්ත ලියාපදිංචි අංශය

## 6.1 හැඳින්වීම

1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ ශ්‍රී ලංකාව තුල පවතින සියලුම නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි කිරීම කර්මාන්ත ලියාපදිංචි අංශයේ ප්‍රධානතම ඉලක්කයයි. ඒ අනුව නිෂ්පාදන කර්මාන්තයක් සිදුකරන සෑම පුද්ගලයෙකුම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සිය කර්මාන්තශාලා ලියාපදිංචි කළ යුතු අතර අදාළ අවශ්‍යතාවයන් සපුරාලන කර්මාන්ත සඳහා අමාත්‍යාංශය විසින් සහතිකයක් නිකුත් කරනු ලබයි. එමඟින් කර්මාන්තකරුවන් විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලනු ඇත.

ලියාපදිංචි කර්මාන්ත පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ 09 යටතේ වර්ගීකරණය කර ඇත.

- 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන
- 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන
- 33-දැව සහ දැවමය නිෂ්පාදන
- 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු
- 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන
- 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන
- 37-මූලික ලෝහ නිෂ්පාදන
- 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ
- 39-අනෙකුත් නිෂ්පාදන

අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වීමෙන් සිය කර්මාන්ත සඳහා අනගි රාමුවක් සංවර්ධනය කර ගැනීමට කර්මාන්තකරුවන්ට අවස්ථාව හිමි වන අතර එමඟින් ඒ ඒ කර්මාන්ත අංශයන්හි වර්තමාන තත්ත්වයන්ද අධ්‍යනය කල හැකිය. තවද, අනාගතයේ දී නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අදාලව නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා කර්මාන්ත පිළිබඳ සවිස්තරාත්මක දත්ත සමුදායක් පවත්වා ගැනීමටද හැකි වනු ඇත

## 6.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

ඒ අනුව, 2023 **සැප්තැම්බර් මස** දක්වා නිෂ්පාදන කර්මාන්ත **3,686** ක ප්‍රමාණයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත.

**කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 2023 සැප්තැම්බර් දක්වා ලියාපදිංචි කර ඇති කර්මාන්ත පිළිබඳ තොරතුරු**

| අංශය | කර්මාන්ත ගණන |
|---|---|
| 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන | 766 |
| 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 628 |
| 33-දැව සහ දැවමය නිෂ්පාදන | 137 |
| 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු | 283 |
| 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 809 |
| 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 213 |
| 37-මූලික ලෝහ නිෂ්පාදන | 83 |
| 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ | 633 |
| 39-අනෙකුත් නිෂ්පාදන | 134 |
| **මුළු එකතුව** | 3686 |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*




*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

මෙම වසරේ දී දැනට භාවිතා වන Manual ක්‍රමය Online පද්ධතියක් බවට පත් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇති අතර මේ වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසාන වී ඇත. පද්ධති සංවර්ධනය අවසන් අදියරේ පවතින අතර මේ වසර අවසන් වීමට පෙර එය එළිදැක්වීම සිදු කිරීමට සැලසුම් කර ඇත.

- 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ සංශෝධන තුළ කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා නීතිමය ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත.

**කර්මාන්ත ලියාපදිංචිය පිලිබඳ තොරතුරු - 2023**

| මාසය | ලැබුණු අයදුම්පත් ගණන | නිකුත් කළ සහතික ගණන |
|---|---|---|
| ජනවාරි | 13 | 17 |
| පෙබරවාරි | 15 | 18 |
| මාර්තු | 48 | 16 |
| අප්‍රේල් | 23 | 24 |
| මැයි | 35 | 21 |
| ජුනි | 50 | 38 |
| ජුලි | 33 | 27 |
| අගෝස්තු | 43 | 17 |
| සැප්තැම්බර් | 24 | 40 |
| **මුළු එකතුව** | **284** | **218** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

- 2023 ජනවාරි 01 සිට 2023 සැප්තැම්බර් මස දක්වා මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් 284 ක් ලැබී ඇති අතර, ඒ අතරින් කර්මාන්ත 218 ක් විවිධ කර්මාන්ත අංශයන් අනුව මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත.

**විවිධ කර්මාන්ත අංශයන් යටතේ කර්මාන්ත ලියාපදිංචිය පිලිබඳ තොරතුරු - 2023**

| අංශය | කර්මාන්ත ගණන |
|---|---|
| 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන | 84 |
| 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 30 |
| 33-දැව සහ දැවමය නිෂ්පාදන | 07 |
| 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු | 10 |
| 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 36 |
| 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 12 |
| 37-මූලික ලෝහ නිෂ්පාදන | 01 |
| 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ | 33 |
| 39-අනෙකුත් නිෂ්පාදන | 05 |
| **මුළු එකතුව** | **218** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

- 2023 වර්ෂය තුල මේ දක්වා ලියාපදිංචි කොට ඇති කර්මාන්ත සංඛ්‍යාව තරමක් දුරට ඉහල ගොස් ඇති ඇති අතර එම අගය 2022 වර්ෂයට සාපේක්ෂව ඉහල අගයක් පෙන්නුම් කරනු ලබයි.




*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි අංශය*

## 6.3. අනාගත සැලසුම් - 2024

- අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ සමාජ මාධ්‍ය හරහා කර්මාන්ත ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම.

# 07

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## 7.1 හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III චක්‍රීය -අරමුදල් සහ පරිසර හිතකාමී II චක්‍රීය -අරමුදල් ණය යෝජනා ක්‍රමය නමින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි .

**1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III-චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය**

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාර වල ඵලදායිතාවය වර්ධනය කිරිම හෝ එකි ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය කිරිම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම, සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භකර ඇත.

**අරමුණු**

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.

- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10 ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව.

**2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ, එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11 ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව, ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසිං සමාගම වේ. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 7.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**(1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)**

මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 2600 ක් වෙන් කර දී ඇති අතර, සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 176 ක් සඳහා රුපියල් මිලියන 1753 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර මුළු ප්‍රතිපාදන වටිනාකමට මුදල් වෙන් කිරීම සිදු කර ඇත.

**(2) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 400 ක් වෙන් කර දී ඇති අතර, සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතින් 07 ක් සඳහා රුපියල් මිලියන 155 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර ඉතිරි මුදල් මෙම වසර තුළ දී නිදහස් කිරීමට අපේක්ෂිතයි.

## 7.3. අනාගත සැලසුම් - 2024

**(1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)**

2024 වර්ෂය සඳහා රු. මි. 3700 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් උප ව්‍යාපෘතීන් 250 ක් සඳහා ලබා දීමටත් එමඟින් නව රැකියා අවස්ථා 1,300 ක් පමණ ජනිත කිරීමටත් අපේක්ෂා කරයි.

**(2) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II**

2024 වර්ෂය සඳහා රු. මි. 1500 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් ව්‍යාපෘති 110 ක් සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ. එමඟින් සම්පත් ඉතිරි කිරීම, සම්පත් ප්‍රතිසාධනය, වෙනත් කර්මාන්ත සඳහා අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම, අප ජලය පිරිපහදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බලශක්ති ඉතිරි කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මූල්‍ය සහය ලබා දීම තුලින් පරිසර හිතකාමී කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ .

# 08

# පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

## පොදු ව්‍යාපාර අංශය

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර අංශය මඟින් මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන සියළුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වඩාත් ශක්‍ය හා තිරසර ආයතන බවට පත්කිරීමට අවශ්‍ය සහාය ලබාදෙනු ලැබේ. එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා, සියළුම වත්කම්වල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම තුලින් ආදායම උපරිම කිරීම සහ නවීන ව්‍යාපාරික උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම තුලින් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරව, මෙකී ව්‍යවස්ථාපිත ආයතනවල දෛනික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

## පොදු ව්‍යාපාර අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාර ආයතන පහත පරිදි වේ.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
2. කාර්මික සංවර්ධන මණ්ඩලය
3. ලංකා පිඟන් සංස්ථාව
4. කාර්මික තාක්ෂණ ආයතනය

**අංශය මඟින් සිදු කරන කාර්යයන්**

1. **රාජ්‍ය ව්‍යාපාරවලට අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම.**
2. **තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන**

දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල සමස්ථ හැකියාවන් සංවර්ධනය තුළින් විදේශ වෙළඳපොල සඳහා ප්‍රමිතිගත භාණ්ඩ නිෂ්පාදනයෙන් අපනයන වෙළඳපොල ජයගන්නා තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමත්, ඒ හරහා දේශීය ආර්ථිකයේ අපනයන ආදායම ඉහල නැංවීමත් අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන වැඩසටහනකි.

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ මේ වනවිටත් ක්‍රියාත්මකව සිටින, තම ව්‍යාපාර පුළුල් කරගැනීමට/දියුණු කරගැනීමට අවශ්‍යතාවය ඇති, එහෙත් ඒ සඳහා අත්දැකීම්/දැනුම /පුහුණුව ප්‍රමාණවත් නොවන සහ ව්‍යාපාරයේ පවතින ගැටළු හා ඊට සුදුසු විසඳුම් හඳුනාගැනීම අපොහොසත්ව සිටින තරුණ ව්‍යාපාරිකයින් අපනයන වෙළඳපොල තුල සක්‍රීය කොටස්කරුවන් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය සියලු සහය ලබාදීම මේ හරහා සිදුකෙරේ.

මෙම වැඩසටහන සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ඉහල සනත්වයක් සහිත ගම්පහ දිස්ත්‍රික්කය මූලික කරගනිමින් නියමු ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

එමෙන්ම, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, විදාතා ඒකකය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හා තවත් රාජ්‍ය ආයතනවල සහයෝගය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන අතර, වසර 3ක් තුළ වැඩසටහනේ ඉලක්කගත අරමුණු ළඟාකරගැනීමට අපේක්ෂිතය.

**ප්‍රතිව්‍යුහගතකරණ අංශය**

ප්‍රතිව්‍යුහගතකරණ අංශය මඟින් පහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර තිරසාර පැවැත්මක් සහිත පෙරට වඩා ලාභ ලබන ආයතන බවට පත් කිරීමටත් එම ආයතනවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය තව දුරටත් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමටත් අදාළ කාර්යයන් සිදු කරනු ලබයි.

**ප්‍රතිව්‍යුහගතකරණ අංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපාර**

- ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්
- සී/ස ජාතික කඩදාසි සමාගම
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
- සී/ස ලංකා සිමෙන්ති සමාගම
- ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී
- ලංකා ලේලන්ඩ් ලිමිටඩ්

**අරමුණු**

- ලාබ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව පවතින දැනට ක්‍රියාකාරීතත්ත්වයේ නොමැති රාජ්‍ය ව්‍යවසාය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම.
- දැනට පාඩු ලබන සහ ලාබ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව නොමැති රාජ්‍ය ව්‍යවසාය ඇවර කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- රාජ්‍ය ව්‍යවසායවල නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම, නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සහ අගය එකතු කිරීම තුළින් නිෂ්පාදන ප්‍රමාණය සහ ගුණත්වය ඉහළ නැංවීම හරහා ලාභය උපරිම කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ රාජ්‍ය ව්‍යවසායවල කටයුතු සඳහා දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින්ගේ දායකත්වය ලබා ගැනීම.

- දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබා දීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් මෙහෙයවීම.
- රාජ්‍ය ව්‍යවසායයන්හි භෞතික හා මානව සම්පත ඵලදායී ලෙස මෙහෙයවීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

**ප්‍රධාන කාර්යයන්**

1. **අංශය යටතේ පවතින ව්‍යවසායන්ට අදාල පරිපාලිත සහ සංවර්ධන කටයුතු**
2. **මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වලට අදාල කටයුතු**

- ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සඳහා අමාත්‍යාංශයේ සැලසුම් අංශය හා අදාළ රාජ්‍ය ව්‍යවසාය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය විසින් ව්‍යාපෘති යෝජනාව සකස්කර ඉදිරිපත් කළ පසු එය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සහ නිර්දේශ කර සැලසුම් අංශය වෙත යොමු කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය/එකඟතාව ලැබුණු පසුව ව්‍යාපෘති යෝජනාව අමාත්‍යාංශයීය වාර්ෂික අයවැය යෝජනා වලට ඉදිරිපත් කිරීම සඳහා සැලසුම් අංශය වෙත යොමු කිරීම.
- ජාතික අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනාව සඳහා අනුමැතිය ලැබුණු පසුව, ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යවසාය දැනුවත් කර එහි කටයුතු ආරම්භ කිරීමට දැනුම්දීම.
- ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු, ව්‍යාපෘති කමිටු, ශක්‍යතා අධ්‍යයන කමිටු, උපදේශන කමිටු පත්කිරීම සඳහා අදාළ රාජ්‍ය ව්‍යවසාය හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන අංශය සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය වෙත අවශ්‍ය මඟපෙන්වීම හා උපදෙස් ලබා දීම.
- ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් වන තෙක් සැලසුම් අංශය සමඟ එක්ව මාසිකව පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ප්‍රගතිය සමාලෝචනය කිරීම.

3. **රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති.**

- සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය, අදාළ රාජ්‍ය ව්‍යවසාය හා අනෙකුත් අදාළ සියළුම පාර්ශව සමඟ සාකච්ඡා කර තීරණ වලට එළඹීම.
- ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය ව්‍යවසාය සමඟ එක්ව ඊට අදාළ කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස්කර, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා පාලන අංශය වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති කමිටු පත්කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත නාම යෝජනා ඉදිරිපත් කිරීම.

- ව්‍යාපෘතියට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටුව පත් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම.

- ව්‍යාපෘති කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටු පත් කිරීමෙන් පසුව, ව්‍යාපෘති කමිටු රැස්වීම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ සියළු කටයුතු සම්බන්ධිකරණය කිරීම.

- ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

- ව්‍යාපෘති කමිටුවේ නිර්දේශ අනුව අභිලාෂය කැඳවීමේ ලියවිලි හා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි කැඳවීමට අදාළ පුවත්පත් දැන්වීම් සකස් කිරීම.

- අභිලාෂය පල කිරීමේ යෝජනා කැඳවීමේ ලියවිලි හා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි කැඳවීමට අදාළ කටයුතු සිදු කිරීම.

- අභිලාෂය කැඳවීමේ ලියවිලි ඇගයීම් කටයුතු, විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි වලට අදාළ තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම් සිදු කිරීම.

- පූර්ව ලංසු රැස්වීම පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ඇගයීම් කටයුතු මඟින් තෝරා ගනු ලබන සුදුසුම ආයෝජක සමාගම හා රාජ්‍ය ව්‍යවසාය විසින් අත්සන් කළ යුතු ගිවිසුම සකස් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු නීති අංශය හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදු කිරීම.

- ආයෝජක සමාගම තෝරා ගැනීමෙන් පසුව රාජ්‍ය ව්‍යවසාය හා ආයෝජක සමාගම අතර ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය සිදු කිරීම.

# 09

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

## 9.1 හැඳින්වීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හි උන්නතිය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්තිමය සහය ලබා දීම සඳහා මූලිකව කටයුතු කරනු ලබන අතර, එම කර්මාන්තයන් හි ප්‍රවර්ධනය සඳහා ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය ආදී ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඇති ආයතනයන් සමඟ ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

එහි දී කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම, අමුද්‍රව්‍ය පහසුව ළඟාකර දීම, කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා උදාකර දීම හා අනෙකුත් යටිතල පහසුකම් ලබාදීමට මෙම වසර තුළදී කටයුතු කර ඇත.

## 9.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### උණ බට ප්‍රවාහනය සඳහා නෛතික සහන සැලසීම සඳහා මැදිහත්වීම

උණ ශාකය ආශ්‍රිතව පාරම්පරික හස්ත කර්මාන්තයන් හි නිරතවන කර්මාන්තකරුවන්ට එකී අමුද්‍රව්‍ය ප්‍රවාහනයේ දී බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය කරුණක්ව පැවති මෙම අංශයේ මැදිහත්වීම මත වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් නිකුත්කරන ලද අංක 2346/02 හා 2023.08.21 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව "ගල්බම්බු" නම් උණ විශේෂය ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.

අනෙකුත් උණ විශේෂ ප්‍රවාහනය කිරීමේදී, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ අංක 01/2023 චක්‍රලේඛය ප්‍රකාරව "උණ සඳහා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම" සම්බන්ධයෙන් කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය විසින් 1996.12.06 දින නිකුත් කරන ලද අංක 17/96 චක්‍රලේඛයේ 05 වන ඡේදය යටතේ වූ 5.5 උපඡේදයට ඉනික්බිතිව එක් කර ඇති 5.6 උපඡේදයට අනුව, උණ වර්ගයට අයත් ශාකයේ හෙලන ලද ගස් 250ක් දක්වා ප්‍රමාණයකින් (පඳුරු නොව තනි ගස් වශයෙන්) ලබා ගන්නා දැව කඳන්/ කැබලි ප්‍රවාහනය සඳහා බලපත්‍ර ඉල්ලා සිටින අවස්ථාවක, අදාල ග්‍රාම නිලධාරී වාර්තාව ලබාගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කිරීමට නෛතික පසුබිම සැකසී ඇත. මේ සඳහා මෙම අංශය විසින් අවශ්‍ය මැදිහත්වීම සිදුකරන ලදී.

මෙයට අමතරව ,වාණිජ බෝගයක් ලෙස උණ ශාකය වඩා ප්‍රචලිත කිරීම සඳහා මෙම අංශය කටයුතු කරමින් පවති . එහිදී උණ අක්කර 1000 ක් වගා කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇත.

### සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය

#### ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපිත කිරීම

හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුමට ප්‍රමාණවත් තරම් අමුද්‍රව්‍යයන් සාධාරන මිලක් යටතේ අඛණ්ඩව සපයා ගැනීමේ ගැටළුව ජයගැනීම සඳහා 2021 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ වැඩසටහන, 2023 වසරේ දී ද ජාතික ශිල්ප සභාවේ සක්‍රීය දායකත්වය මත ක්‍රියාත්මක කරන ලදී.

එහිදී ජාතික ශිල්ප සභාව සතු නන්නපුරාව අමුද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානය සඳහා තෙකලා විදුලිය ලබා දීම , බුලත්සිංහල හා මනම්පිටිය අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම මෙම වසරේ දී සිදු කර ඇත .

#### ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන

ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා දේශීය විදේශිය අලෙවි අවස්ථා උදාකර දීම තුළින් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා 2023 වර්ෂයේදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

#### දේශීය අලෙවි අවස්ථා උදාකර දීම

- දියත උයන හස්තකර්මාන්ත නිෂ්පාදන අලෙවි" ප්‍රවර්ධන වැඩසටහන
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව 55 -
  පවත්වන ලද වෙළඳපොල අවස්ථා සංඛ්‍යාව 08
- කුරුණෑගල ""Made in Sri Lanka"" අළෙවි ප්‍රදර්ශනය
  පවත්වන ලද වෙළඳපොල අවස්ථා සංඛ්‍යාව 03
- Green Super අලෙවිසැලෙහි "ලක් ශිල්ප" සන්නාමය යටතේ නිර්මාණ අලෙවි කිරීම
- නාරාහේන්පිට රජවාස පරිශ්‍රයේ "ලක් ශිල්ප" අළෙවි සැලක් ආරම්භ කිරීම .
- නාරාහේන්පිට රජවාස පරිශ්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සතියේ සෑම සිකුරාදා, සෙනසුරාදා හා ඉරිදා දිනයන් හි පැවැත්වීමට පහසුකම් සැලසීම .
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව 15
- "Crafting Ceylon" අපනයන අභිමුඛ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන
  ශිල්පීන් 1553 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණ අතරින්, ජයග්‍රාහී නිර්මාණ 546ක් තෝරාගෙන, ඔවුන් සඳහා 2023 මාර්තු මස 23, 24 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී වෙළඳපොල අවස්ථාවන් උදාකරදෙන ලදී. එහිදී

තෝරාගත් ජයග්‍රාහකයින් 100ක් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම, ව්‍යාපාරික ඇණවුම් ලබා දීම, වෙළඳපොල සබඳතා නිර්මාණය කර දීම (B to B Meeting), ඇසුරුම්කරණය, විද්‍යුත් අලෙවිකරණය, ආදී විෂයන් පිළිබඳ වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

- තවද, ඊජිප්තු තානාපති කාර්යාලය මගින් සංවිධානය කරන ලද "Women Plus Bazaar" අළෙවි ප්‍රදර්ශනය සඳහා ජයග්‍රාහී ශිල්පීන් 54 දෙනෙකු සහභාගී කරවීම ද සිදුකරන ලදී.
- මහනුවර දළදා පෙරහැර ඉලක්ක කරගනිමින් YMCA හිදී පවත්වන ලද හස්ත කර්මාන්ත අලෙවිපොළ සඳහා ශිල්පීන් සහභාගී කරවීම.
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 15
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව අලෙවිකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම හා ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධව පුහුණුව ලබාදීමට වීඩියෝපට සකස් කිරීම.

❖ **විදේශීය අලෙවි අවස්ථා උදාකර දීම**

- 2023 පෙබරවාරි 2 සිට 18 දින දක්වා ඉන්දියාවේ "සුරාජ් කුන්ඩ් හැන්ඩික්‍රාෆ්ට් මේලා" සඳහා සහභාගී වීම.
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 10
- 2023 අප්‍රේල් 29 සිට මැයි 14 දින දක්වා තමිල්නාඩු රජයේ සංචාරක දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ "Chennai Vizha - 2023" සඳහා සහභාගී වීම.
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 08
- 2023 ජූනි මස 28 සිට ජූලි 03 දින දක්වා චීනයේ පැවැත්වූ "16th China Woodcarving and Bamboo Weaving Art and Crafts Expo" සඳහා සහභාගී වීම.
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව - 02

**දැව නිෂ්පාදන ආශ්‍රිත නිර්මාණ හා මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවීම**

මෙම වැඩසටහන තුළින් දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සිදුවේ.

මේ සඳහා කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයේ ඌණ උපයෝජිතව පැවති ගොඩනැඟිලි හා යන්ත්‍රසූත්‍ර භාවිතයට ගැනීම සිදු වූ අතර, එහි මූලික අලුත්වැඩියා හා වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම අවසන් කර ඇත.

එහි ඉතිරි කටයුතු සම්පූර්ණ කර මෙරට දැව කර්මාන්ත ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ප්‍රමිතිගත ශිල්පීන් බිහි කිරීම හා ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීම යන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

**ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම**

2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද ගම්මානයන් හා කර්මාන්තකරුවන් පිළිබඳ පසුවිපරම් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා ජාතික ශිල්ප සභාවේ සහය ඇතිව ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා ප්‍රතිලාභී කර්මාන්තකරුවන් 1459 දෙනෙක් සහභාගී කරගන්නා ලද අතර, මෙම සමීක්ෂණයෙන් ලබාගන්නා කරුණු හා දත්ත ඇතුලත් අනු වාර්තාවක් සකස් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

**දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම වෙනුවෙන් තාක්ෂණික පාසලක් ආරම්භ කිරීමට කොරියානු දූත පිරිසක් සමග සිදුකරන ලද විශේෂ නිරීක්ෂණ චාරිකාව**



**බතික් සහ අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය**

- බතික් නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ දැනට පවතින හා නව බතික් පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම අරමුණු කර ඇත. ඒ සඳහා මධ්‍යස්ථාන 15 ක් තෝරාගෙන ඇති අතර, ඉන් 6 කට අදාළව ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම සිදුකර ඇත.
- බතික් නිෂ්පාදකයින් සඳහා නව මෝස්තර නිර්මානකරණ හා නිෂ්පාදන විවිධාංගීකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 132කට අදාළව ප්‍රතිලාභීන් 1046 ක් හඳුනාගැනීම් සිදුකර ඇත.
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ගම්පහ සුරක්ෂා ආයතනය සහය ඇතිව පුහුණුවට අදාළ විෂය නිර්දේශය සකස් කිරීම සිදුකර ඇත.
- අත්‍යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදකයින් සඳහා නව මෝස්තරකරණ හා නිෂ්පාදන විවිධාංගිකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම
  පේෂකර්ම දෙපාර්තමේන්තුව වෙතින් පුහුණු වැඩසටහන සඳහා විෂය මාලාව ලබාගෙන ඇත. මේ සඳහා පළාත් 07කින් ප්‍රතිලාභි ලේඛණ ලැබී ඇති අතර පළාත් 03ක සමාලෝචන ක්‍රියාවලිය අවසන් කර ඇත.

**බත්තරමුල්ල ජාතික ශිල්ප සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී බතික් පුහුණු පාඨමාලවක් ආරම්භ කිරීම හා ඒ සඳහා නව ගොඩනැගිල්ලක් විවෘත කිරීම**



**බතික් පුහුණු පාඨමාලාව නිමකරන ලද අභ්‍යාසලාභීන්ට NVQ – III සහතික පිරිනැමීම**



- පොදු පහසුකම් මධ්‍යස්ථාන සහ ප්‍රතිලාභීන් වෙත යන්ත්‍රසූත්‍ර සහ අනෙකුත් උපකරණ ලබා දීම
  - මධ්‍යම පළාත - පොදු පහසුකම් මධ්‍යස්ථානයක් සඳහා විද්‍යුත් වයින්ඩින් යන්ත්‍රයක් සපයා ඇත
  - උතුරු පළාත - පොදු පහසුකම් මධ්‍යස්ථාන 02ක් සඳහා wrapping machine කට්ටල 02ක්, වයින්ඩින් යන්ත්‍ර කට්ටල 02ක් සහ ලූම් යන්ත්‍ර කට්ටල 20ක් ලබා දී ඇත
  - දකුණු පළාත - ප්‍රතිලාභීන් 17ක් සඳහා අඟල් 60 ලූම් යන්ත්‍ර ලබා දී ඇත
- පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ජාතික මෝස්තර මධ්‍යස්ථානය, මොරටුව විශ්ව විද්‍යාලය, SLINTEC ආයතනය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව බතික් සහ අත්‍යන්ත්‍ර නිෂ්පාදන සඳහා ස්වභාවික ඩයි වර්ග හඳුනාගැනීම සහ ස්වභාවික ඩයි වර්ග නිෂ්පාදන ක්‍රියාවලිය හඳුනාගැනීම සඳහා පර්යේෂණ කටයුතු ආරම්භ කර ඇති අතර, එයට අදාල සංකල්ප පත්‍රිකාව SLINTEC ආයතනය විසින් සකස් කරමින් පවතී.
  - ස්වභාවික නූල් නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සහ නියමු ව්‍යාපෘතියක් ලෙස කපු වගාව සහ දැත්ත පැල (Remie) වගාව සිදුකිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භකර ඇත.

## 9.3 අනාගත සැලැසුම් - 2024

මෙම අංශය වේවැල්, පිත්තල, මැටි, ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස තිබියදි ආරම්භ කරන ලද පහත සඳහන් සංවර්ධන වැඩසටහන් 2021 – 2025 දක්වා ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති හෙයින්, මෙම වැඩසටහන් 2024 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන**

- ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරීමේ වැඩසටහන

  මෙහිදී සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සඳහා උපයෝගී කොට ගන්නා අමුද්‍රව්‍ය ශාක අක්කර 352.5 ක වගා කිරීමට සැලසුම් කර ඇත.

- ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපිත කිරීම

  අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන 02 ක් නවීකරණය කොට කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සාධාරණ මිලක් යටතේ අඛණ්ඩ ලෙස සැපයීමේ පහසුකම් ළඟාකර දීම සඳහා සැලසුම් කර ඇත.

- ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

- ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන
  කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා පාරම්පරික හස්ත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා ප්‍රාදේශීය මට්ටමෙන්, පළාත් මට්ටමෙන් සහ ජාතික මට්ටමෙන් සේම අන්තර්ජාතික වශයෙන් වෙළඳපොල අවස්ථා උදාකර දීම මේ යටතේ සිදුකෙරේ.

- එහි දී කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල අවස්ථා උදා කර දීම, සැපයුම්දාම පහසුව, වෙළඳපොල සබඳතා ඇති කරලීම සැලසුම් කර ඇත.

- මෙයට අමතරව ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා ජාතික මට්ටමේ වෙළඳ ප්‍රදර්ශනයක් හා සම්මාන ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

- දැව නිෂ්පාදන ආශ්‍රිත නිර්මාණ හා මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවීම

**බතික් ,අත්යන්ත්‍ර සහ රෙදිපිළි කර්මාන්ත ප්‍රවර්ධනය**

විශේෂයෙන්ම බතික් සහ අත්යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා 2024 වර්ෂය තුළ දී බතික් හා අත්යන්ත්‍ර නිෂ්පාදන කර්මාන්තයේ නිරත අයවලුන් සඳහා;

- අපජල කළමනාකරණ පද්ධති ලබාදීම
- නව විලාසිතා නිර්මාණ සහ නිෂ්පාදන විවිධාංගීකරණ පුහුණු අවස්ථා ලබා දීම.
- බහුතර නිෂ්පාදකයින් පිරිසකට තම නිෂ්පාදන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය පහසුව සලසනු පිණිස පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම.
- බතික් සහ අත්යන්ත්‍ර නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන සමඟ ඒකාබද්ධව , පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත .

# 10

# ප්‍රාථමික කර්මාන්ත අංශය

## 10.1 හැඳින්වීම

අප රට සතු මැණික් සම්පත, පරිසරයද උපරිම ලෙස ආරක්ෂා කරගනිමින් නවීන තාක්ෂණය ද මුසු කරගනිමින් සුරක්ෂිතව ගොඩගෙන පුද්ගලික අංශය ද එක්කර ගනිමින් අගය වැඩිකිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙන්ම ස්වර්ණාභරණ කර්මාන්තය ද ප්‍රවර්ධන කරමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තිරසර සංවර්ධනය වෙනුවෙන් අප පෙරමුණ ගෙන සිටී.

ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන වටිනාකමින් 3% කට ආසන්න ප්‍රමාණයකට දායකත්වයක් දක්වන මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදී සිටින කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බදු සහනයන්, තාක්ෂණික සහායයන් ඇතුලු අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීමට කටයුතු කර ඇති අතර ඒ තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම අරමුණ වේ.

සංචාරක කර්මාන්තය සමඟද අත්වැල් බැඳ ගනිමින් ලොව අංක එකේ මැණික් ගැනුම්කරුවන් ගේ ගමනාන්තය බවට අප රට පත් කිරීම මෙන්ම දේශීයව හා විදේශීය ඉල්ලුමට සරිලන නවීන තාක්ෂණයෙන්, ගුණාත්මකභාවයෙන් හා මනා නිමාවකින් යුතු ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන කර්මාන්තයක් බිහි කිරීම අපගේ තිර අධිෂ්ඨානයයි.

## 10.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ආර්ථික දායකත්වය**

2023 සැප්තැම්බර් වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිෂ්පාදනය අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 361.28 ක් වන අතර, එය 2022 වර්ෂයේ සැප්තැම්බර් වන විට උපයා ගෙන ඇති අපනයන වටිනාකම වන ඇමරිකන් ඩොලර් මිලියන 294.92 කට සාපේක්ෂව එය 22% ක පමණ වර්ධනයකි.

| අපනයන වටිනාකම - 2023 සැප්තැම්බර් මසට | | |
|---|---|---|
| අපනයන නිෂ්පාදනය | අපනයන වටිනාකම (ඇ.ඩො. මිලියන) | % |
| මැණික් | 149.26 | 41% |
| ස්වර්ණාභරණ | 9.55 | 3% |
| දියමන්ති | 202.47 | 56% |
| මුලු වටිනාකම | 361.28 | 100% |

*මූලාශ්‍රය :ප්‍රාථමික කර්මාන්ත අංශය*

**බේරුවල ප්‍රදේශයේ මැණික් අපනයන කාර්යාලයක් විවෘත කරණු ලැබූ අවස්ථාව**



- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණ මේ දක්වා ගවේෂණය කර ඇත.

මෙම තත්ත්වය යටතේ නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් සේ හදුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී.

2023 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ශ්‍රී ලංකාවේ මැණික් සම්පත කාර්යක්ෂමව භාවිතා කිරීමේ ඉහළ විභවතාවයක් පවතින බැවින්, මෙතෙක් ප්‍රයෝජනයට නොගත් දිවයින පුරා පැතිර පවතින මැණික් සම්පත ප්‍රයෝජනවත් ලෙස වෙළඳපොළට එක් කිරීම සඳහා ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව, ආර්ථික අර්බුදයේ බලපෑම සටහන් කිරීම පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය යොමු කරන ලදුව, දැනට රටතුළ පවතින වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් සිඳී ඇති වැව් ආශ්‍රිතව පවතින මැණික් සම්පත පරිසර හිතකාමී, ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින්, විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ නෙළා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කර ඇත. එහි පළමු අදියර යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සමනළ වැව ජලාශය ආශ්‍රිත ප්‍රදේශයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මාඋස්සා කැළේ හා කාසල්රී ජලාශ ආශ්‍රිත ප්‍රදේශයේ මැණික් සම්පත නෙළා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පත් කොට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුනතාවය ඉහළ නැංවීම**

- 2023 වර්ෂය සඳහා ඉලක්ක ගත සිසුන් සංඛ්‍යාව 1130 ක් වු අතර, 2023 සැප්තැම්බර් මස වන විට සිසුන් 1126 දෙනෙකු බඳවා ගෙන ඇත. මේ වන

විට පාඨමාලා නිම කළ සිසුන් ප්‍රමාණය 313 ක් වන අතර ඉතිරි සිසුන් තවදුරටත් පාඨමාලාව හදාරමින් සිටී.

- දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 14 කදී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ විවිධ පුහුණු පාඨමාලා 15 ක් පමණ පවත්වමින් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රමය සැපයීමට කටයුතු කරමින් සිටී.

- ඉහත කුඩා ප්‍රමාණයේ මැණික් කැපීමේ තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් ඒ සඳහා වන පුහුණු ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම පුහුණු ඒකකය මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ රත්නපුර පුහුණු මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබා දිම සඳහා පියවර ගැනිම.**

  මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී සිටින ගැටලු හා ඔවුන්ගේ යෝජනා සඳහා විසඳුම් ලබා දිම සඳහා නිරන්තරයෙන් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.

**ලග්ගල ප්‍රදේශයේ මැණික් ව්‍යාපාරිකයින්ට බලපා ඇති ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීම සඳහා පැවැත්වූ සාකච්ඡාව**



- **ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

  අදාල පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ඇතුලත් කරමින් සංශෝධිත පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කරන ලද අතර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

  මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව 2023 වර්ෂයේ ලැබුණු පැමිණිලි 35 න් 16 ක් සඳහා පිලිතුරු සපයා ඇති අතර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

- 2023 වර්ෂයේදී මේ වන විට මැණික් කැණීම් සම්බන්ධයෙන් අභියාචනා 14 ක් ලැබී ඇති අතර, ඒවා විභාග කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය නගාසිටුවීමේ අරමුණින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මකව පවතින අතර, ඒ සඳහා වන ඒකාබද්ධ වාර්තාව සහ ආංශික උපායමාර්ගික පත්‍රය සකස් කරමින් පවතී. 2023 ඔක්තෝබර් මස එය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කිරීමට නියමිතය.

- විදේශිකයින් විසින් අනවසරයෙන් සිදු කරන මැණික් වෙළඳාම පාලනය කිරීමේ අරමුණින් ඒ සඳහා වන යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකුවේ එකඟතාවය ලබා ගැනීමට යොමු කර ඇත.

- 2023 ජනවාරි මස ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමට කටයුතු කරන ලද අතර, විදේශීය රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මණ්ඩප සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින් යොමු කිරීමට පියවර ගෙන ඇත.

- ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය නගා සිටුවීම සඳහා තායිලන්ත මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ සංවිධානයේ සහයෝගය ලබා ගැනීම පිලිබඳ සාකච්ඡා සිදු කරමින් පවතී.

## 10.3 අනාගත සැලසුම් - 2024

- මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2024 වර්ෂයේදී ඇ.ඩො. බිලියනය දක්වා වැඩි කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ජාත්‍යන්තර මට්ටටමේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- මැණික් තාපකරණය, අගය වැඩි කිරිම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම හා බඳවාගන්නා පුහුණුලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට කටයුතු කිරිම.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.

- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොළවල් හඳුනාගැනීම හා එම වෙළඳපොළවල් සමග ගිවිසුම් ගතවීම.

- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරිම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.

# 11

# සැලසුම් අංශය

## 11.1 හැඳින්වීම

කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමණය සඳහා ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘතීන්, සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, ප්‍රගති සමාලෝචනය සහ සුපරීක්ෂණය මඟින් ඵලදායී ව්‍යාපෘති හඳුනා ගැනීමට සහය ලබා දීම සැලසුම් අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

වාර්ෂිකව අනුමත අයවැය ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සොයාබැලීම, අදාළ ප්‍රගති වාර්තා සකස් කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමත් අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ රාජ්‍ය ව්‍යවසයන්හි ප්‍රගතිය හා සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් සැලසුම් අංශය මඟින් සිදු කරනු ලැබේ.

## 11.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2023 වර්ෂය සඳහාද සකස් කරන ලදී.
- ප්‍රගති සමාලෝචන/නියාමන සැලැස්ම 2023 සකස් කරන ලදී.
- අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය 2024 සකස් කිරීම (රු.මි. 10ට අඩු ව්‍යාපෘති තක්සේරු කිරීම ඇතුළුව).
- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ (Strategic Implementation Road Map 2023-2027) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම (මාර්ගෝපදේශ, ආකෘතිපත්‍ර සකස් කිරීම ආදිය).

- ජනාධිපති ලේකම් කාර්යාලයේ මහ පෙන්වීම යටතේ අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ සහ ආයතනවලට කාර්ය සාධන දර්ශක (KPI) සහ ආයතන සභාපතිවරුන් සමඟ කාර්යසාධන ගිවිසුම් අත්සන් කොට ඒවා කාර්තුමය වශයෙන් පසුවිපරම් කිරීමේ ක්‍රියාදාමයක්ද ක්‍රියාත්මක කරනු ලබයි.

- තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අංක 9 සඳහා මෙහෙයුම් කමිටුව ආයතන 21 කට වැඩි ගණනක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කර ඇති අතර කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් SDG – 9 සඳහා වන උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතින අතර එය කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම - සංවර්ධන අංශ, සංස්ථා, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසායන් ඇතුලත්ව සැලසුම් කරන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සැලසුම් කල පරිදි පවත්වා ඇත.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ තීරණ ගැනීමට අවශ්‍ය දත්ත නොමැතිවීමේ ගැටළුවට විසඳුමක් ලෙස සංඛ්‍යා ලේඛන දත්ත අත්පොත වාර්ෂිකව පිළියෙළ කර ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යාංශය මඟින් 2022 වර්ෂයේදී පියවර ගන්නා ලදී. ඒ අනුව 2022 වර්ෂයේ දත්ත අත්පොත, 2023 වර්ෂයේ මුල් භාගයේ ප්‍රකාශයට පත් කරන ලදී. අත්පොත සඳහා අමාත්‍යාංශයේ කර්මාන්ත වර්ගීකරණය අනුව උප අංශ 20 පදනම් කර ගනිමින් දත්ත ඒකරාශී කිරීම සිදු වේ. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුව සහ මහ බැංකුව වැනි ආයතන මුලාශ්‍ර කරගනිමින් හඳුනා ගනු ලබන දත්ත, වර්ෂ කිහිපයක දත්ත සමඟ සංසන්දනාත්මකව ගැලපීමද සිදු කෙරේ. 2023 වර්ෂය පදනම් කරගත් දත්ත අත්පොත මේ වන විට පිළියෙළ කරමින් පවතින අතර එය කඩිනමින් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

- රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යය සමාලෝචන විශ්ලේෂණ වාර්තා කර්මාන්ත අමාත්‍යාංශයේ වෙබ් පිටුවේ පල කර ඇත.

- 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත 2023.06.06 දින ඉදිරිපත් කරන ලදී.

- 2023 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ සියලු කටයුතු අවසන් කර ඇත. (අයවැය කාරක සභා අවස්ථාව සඳහා)

- දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පවත්වන ලදී.

- අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු පිලිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් වාර්තා මාසිකව, කාර්තුමය මෙන්ම විශේෂ අවස්ථා පදනම් කරගෙන විවිධ ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර ඇත.

## 11.3 අනාගත සැලැසුම් - 2024

- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟට (Strategic Implementation Road Map 2023-2027) අනුකූලව අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

- ප්‍රගති සමාලෝචන/නියාමන සැලැස්ම වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.

# 12

# පාලන අංශය

## 12.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ ප්‍රධානතම අංශයක් ලෙස ක්‍රියාත්මක වන පාලන අංශය, සෑම වර්ෂයක් ආරම්භයේදීම අමාත්‍යාංශයේ සමස්ථ අරමුණු හා පරමාර්ථවලට අනුරූපීව පාලන අංශය සඳහා සකස් කර ගන්නා ලද අරමුණු හා පරමාර්ථ අනුව වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරයි.

ඒ අනුව මෙම වර්ෂය තුලදී පාලන අංශය විසින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු විශේෂිත වූ අංශ කිහිපයක් හඳුනා ගන්නා ලදි. ඒ අනුව ඉටුකරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

1) නිසි පුහුණු අවශ්‍යතා සපුරාලීම තුලින් කාර්යමණ්ඩලය බලගැන්වීම හා නීතිමය ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම තුලින් අවශ්‍ය අවස්ථාවලදී අමාත්‍යාංශයට හා ආයතනවලට අවශ්‍ය නිතීමය උපදෙස් ලබා දීම.

2) නඩත්තු අංශයේ හා ප්‍රවාහන අංශයේ ක්‍රියාවලිය මනා ලෙස පවත්වාගෙන යාම තුලින් එම අංශවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

3) කාර්යමණ්ඩලයේ මානසික හා චිත්තවේගී යහපැවැත්ම වැඩිදියුණු කිරීම උදෙසා වැඩසටහන් සංවිධානය කිරීම.

4) දෛනික තැපැල බෙදාහැරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම.

5) නවීන හා බලශක්තිය ඉතිරි කරන භෞතික පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

6) අමාත්‍යාංශයේ විදුලිය , ජලය වැනි ජංගම වියදම් අඩු කර ගැනීමට පියවර ගැනීම.

7) ක්‍රියාවලි තුල හා මානව ප්‍රාග්ධනය තුල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

## 12.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

පාලන අංශය මගින් සිදුවන ප්‍රධාන කාර්යයක් ලෙස කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවශ්‍යතා සලසා දීම ගෙනහැර දැක්විය හැකිය. අමාත්‍යාංශයේ සියලු ශ්‍රේණිවල නිලධාරීන් ආවරණය වන පරිදි මෙම වර්ෂය තුලත් දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට අපට හැකිවුණි.

පසුගිය කාලපරිච්ඡේදවල පැවති කෝවිඩ් තත්ත්වය හා අනෙකුත් හේතුමත විදේශ පුහුණු අවස්ථා මෙම අමාත්‍යාංශය වෙත නොලැබුණු නමුත් මෙම වර්ෂය තුලදී එයද සාමාන්‍යකරණය වී විදේශ පුහුණු වැඩසටහන් ද අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත ලැබුණි.ඒ අනුව ඒවාට සහභාගීවන නිලධාරීන් වෙනුවෙන් ද පාලන අංශය මගින් අවශ්‍ය පහසුකම් හා මගපෙන්වීම ලබා දෙන ලදි.

අමාත්‍යාංශයේ නඩත්තු හා ප්‍රවාහන ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා එම විෂයන්වල ගැටළු සහගතතැන් හඳුනා ගෙන ඒවා නිවැරදි කර ඵලදායීතාවය ඉහල නැංවීමට අදාල කළමණාකරණ පද්ධතියක් පිහිටුවීමට හැකිවිය.

## 12.3 අනාගත සැලැසුම් - 2024

අමාත්‍යාංශයේ අංශයක් ලෙස ඉටු කරනු ලබන කාර්යයන් හා සැලසුම් මගින් අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය සාධනය ඉහල නැංවීම.

# 13

# ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## 13.1 හැඳින්වීම

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම්වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය ඒකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී සුපිළිපන් ක්‍රමවේදයන් භාවිතය දිරිගැන්වීම, ඉහල වෙළෙඳපළ ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාබ ලැබෙන කාර්මික සංවර්දනයක් තහවුරු කර ගැනීම යන අමාත්‍යාංශයේ මෙහෙවර ලගා කර ගැනීමට අදාලව අවශ්‍ය මූල්‍යමය සහයෝගය මුදල් අමාත්‍යාංශය හා අනෙකුතක් ආයතන හා සම්බන්ධවී අඛණ්ඩව ලබා දීම අරමුණු කරගත් මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩල සැකැස්ම හා ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයට ලැබෙන සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වවුචර් පත් ITMIS පරිගණක පද්ධතියට ඇතුලත් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම හා හම වවුචර්පත් සඳහා මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය, චක්‍රලේඛ වලට අනුව ගෙවීම් කිරීම.

2. GPS පරිගණක පද්ධතිය මඟින් අමාත්‍යාංහයේ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කිරීම හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ නිලධාරීන්ට ආපදා ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබා දීමට කටයුතු කිරීම

3. මු.රෙ 135 ප්‍රකාරව මූල්‍ය පාලනය පිළිබඳ වාර්ෂිකව බලතල පැවරීම සකස් කිරීම.

4. අමාත්‍යාංශයට ලැබෙන සියලුම විගණන විමසුම් හා වාර්තා විගණන විමසුම් ලේඛනයට ඇතුලත් කර අදාල තොරතුරු විගණකාධිපතිට හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.

5. අමාත්‍යාංශයේ සියලුම පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ වත්කම් මිලදි ගැනීම වැය විෂයන්ට අදාල වාර්ෂික අයවැය සකස් කිරීම.

6. ප්‍රාදේශිය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල සියලුම මූල්‍ය පාලන කටයුතු සිදු කිරීම.

7. දෛනික ලැබීම් හා ගෙවීම් CIGAS පරිගණක පද්ධතියෙහි යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම හා මාසික ගිණුම් සාරාංශය ඇතුළු සියලුම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

8. CIGAS පරිගණක පද්ධතිය හරහා ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.

9. අමාත්‍යාංශයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කිරීම.

10. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම හා ඒ සම්බන්ධ වාර්තා විගණකාධිපති වෙත යැවීම.

11. ප්‍රසම්පාදනයට අදාළ පහත කාර්යන් ඉටු කිරීම
    - E-Promise පද්ධතිය හරහා වෙළෙඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
    - අමාත්‍යාංශයට අවශ්‍ය සියළුම කාර්යාල ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
    - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.
    - ජාතික ප්‍රසම්පාදන කොමිෂමට අවශ්‍ය වාර්තා නිසි පරිදි සකස් කර යැවීම
    - අමාත්‍යාංශ ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම
    - ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානයන්හි ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.

## 13.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- අයවැය චක්‍රලේඛ 01/2023 අනුව රජයේ වියදම් පාලනයට අදාළව අයවැයෙන් පුනරාවර්තන වියදම් සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන වලින් 6% ඉතිරි කිරීම.
- 2022 භාණ්ඩ අපහරණයට අදාළව අළුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි වාහන අපහරනය කර රු.මිලියන 26 ක මුදලක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කිරීම.
- ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ්හි නව ටෙන්ඩර් පටිපාටියක් සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

# දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

# 14

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

## 14.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතාවයෙන් යුතු මානව සම්පත බිහිකිරීම ඇතුළුව, එම ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ සහ ක්‍රියාමාර්ග ගැනීම, සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති පේෂකර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පාසැල් මගින් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකිරිමට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

01. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.

02. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම.
    - උපදේශකයින් හා කාර්ය මණ්ඩලය
    - ශ්‍රමිකයින්

03. නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම.
    - අගය එකතුකළ
    - නිෂ්පාදන විවිධාංගීකරණය

04. අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම) .

05. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයං රැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනන්.
- මෝස්තර සම්පාදන වැඩසටහන්.
- පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්.
- පේෂකර්මාන්ත විෂය ආශ්‍රිත පුහුණු කිරීමේ වැඩසටහන්.
- පේෂපාසැල් සිසු සිසුවියන් ඉලක්ක කරගත් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

06. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තයේ නව ප්‍රවණතා සහ ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන පැවැත්වීම.

07. ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත තරඟාවලිය පැවැත්වීම.

08. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු.

09. ක්ෂේත්‍රයට අදාල සංරක්ෂණ කටයුතු.

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

1. පර්යේෂණ, පුහුණු ,මෝස්තර හා සේවා ආයතනය, කටුබැද්ද
2. පේෂකර්මාන්ත කෞතුකාගාරය කටුබැද්ද
3. පේෂකර්මාන්ත පුහුණු පාසැල් -14
4. මෝස්තර පුහුණු පාසැල් -02
5. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආයතන - 03

සියළු පරිපාලන කටයුතු පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයාලය මගින් සිදුවන අතර එය පාලන අංශය, ගිණුම් අංශය හා පුහුණු හා සංවර්ධන අංශය වශයෙන් අංක 03 කින් සමන්විතය.

## 14.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

1. 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා පේෂ කර්මාන්ත පුහුණු ආයතන වල දැනට සිසු සිසුවියන් 112 ක් පූර්ණකාලීනව පාඨමාලා හදාරමින් ඇත.
2. 2022/2023 අධ්‍යයන වර්ෂයේ පාඨමාලා හැදැරූ සිසුන් 150 දෙනෙකුගෙන් 98 දෙනෙකු දැනට මෙම ක්ෂේත්‍රයේ රැඳී සිටියි.
3. සේවාස්ථ පුහුණු පාඨමාලා යටතේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත මෝස්තර පුහුණු වැඩමුළු 15 ක් පවත්වා ඇති අතර පුහුණුලාභීන් 283 දෙනෙකු පුහුණුව ලබා ඇත.
4. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 10 ක් මගින් ප්‍රතිලාභීන් 77 ක් පුහුණුව ලබන අතර, අලව්ව, මහව, මහර, පොල්පිතිගම, පාතහේවාහැට, මිනිපේ කිරි ඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.
5. කටුබැද්ද පර්යේෂණ ,මෝස්තර , පුහුණු හා සේවා ආයතනයේ නව ව්‍යාවසායකයින් 11 දෙනෙකු සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. එම ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්ව දැනුම වර්ධනය සඳහා 2023-09-18 දින ජාතික ව්‍යාවසාය සංවර්ධන අධිකාරියේ සභාපති ඇතුළු කාර්යය මණ්ඩලයේ සම්පත්දායකත්වයෙන් පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.
6. ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව පවත්වනු ලබන පළාත් අත්‍යන්ත්‍ර රෙදිපිළි තරඟයේ විනිශ්චය කටයුතු ආරම්භ කළ අතර 2023-09-13 නැගෙනහිර පළාත් තරඟ විනිශ්චය සිදුකරන ලදී. අනෙකුත් පළාත් සඳහා වන තරඟ විනිශ්චය කටයුතු හා

අත්‍යන්ත්‍ර රෙදි පිළි ජාතික මට්ටමේ අවසන් විනිශ්චය කටයුතු 2023 ඔක්තෝම්බර් 27 දිනට පෙර අවසන් කිරීමට නියමිතය. ඒ අනුව ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය, අලෙවි සල්පිළ හා ජාතික මට්ටමේ සම්මාන ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් මස 01 ,02,03 යන දිනවල පැවැත්වීමට නියමිතය.

7. ජාතික වෘත්තීය මට්ටමේ කුසලතා සඳහා වන පූර්ව ඉගෙනීම හඳුනා ගැනීම (RPL- Recognition of Prior Learning) සුදුසුකම් ලබාදීමේ වැඩසටහන් 02 ක් සබරගමුව පළාත හා ඌව පළාත් පේෂකර්ම උපදේශක නිලධරයන් සඳහා පවත්වන ලදී ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා RPL සුදුසුකම ලබා දෙන ලදී.

8. වයින්ඩින් යන්ත්‍රයක් නවීකරණය කොට ඇත. කපු නූල් සඳහා වර්තමානයේ ඇති හිගයට පිළියමක් ලෙස කපු හා පොලියෙස්ටර් මිශ්‍රිත නූල් ආශ්‍රයෙන් නවෝත්පාදනයන් 08 ක් සිදුකර ඇත. ඉදිරියේ දි මෙය කර්මාන්තකරුවන්ට හඳුන්වාදීමට නියමිතය .

9. වටපුළුව පේෂ කර්මාන්ත පුහුණු ආයතනයේ අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර ගැටඹේ පේෂකර්මාන්ත පුහුණු ආයතනයේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

2023 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින් වෙන් කරන ලද පුනරාවර්තන වියදම් රු.මි. 411 න් 2023 සැප්තැම්බර් මසට රු.මි. 153.53ක් වියදම් වී ඇති අතර එය වියදමේ ප්‍රතිශතයක් ලෙස 37.35% කි. එසේම වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් රු.මි. 59න් සැප්තැම්බර් මසට රු.මි. 4.07ක් වියදම් වී ඇති අතර එය වියදමේ ප්‍රතිශතයක් ලෙස 6.9% කි.

## 14.3 අනාගත සැලැසුම් - 2024

**(01) පේෂකර්මාන්ත සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම්**

1. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 05ක් ආරම්භ කිරීම.
2. උක්ත ව්‍යාපෘති මඟින් පේෂකර්මාන්තයේ සක්‍රියව නියැලී සිටින වියන්නියන් 100 ක් බිහි කිරීම.
3. කර්මාන්තයේ දැනට නිරතව සිටින කර්මාන්තකරුවන් 25 දෙනෙකු නගා සිටුවීම.
4. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ව්‍යවසායකයින් 15 දෙනෙකු බිහි කිරීම.

**(02) අත්‍යන්ත්‍ර ක්ෂේත්‍රය සඳහා පුහුණුව හා හැකියා වර්ධනය සඳහා ක්‍රියාකාරකම්**

1. පේෂ කර්මාන්ත පුහුණු ආයතන මඟින් පේෂකර්මාන්තයේ සක්‍රියව නියැලි සිටින වියන්නියන් 150 ක් බිහි කිරීම.
2. පේෂකර්ම පුහුණු ආයතන 14 හි නව පාඨමාලා හඳුන්වාදීම.
3. සති අන්ත වේග පාඨමාලා (Speed Courses) හඳුන්වාදීම.
4. පේෂකර්ම පුහුණු ආයතන NVQ 4 මට්ටමට උසස් කිරීම.
5. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
6. RPL යටතේ NVQ සුදුසුකම ලබාදීම.

**(03) සේවාස්ථ පුහුණු**

1. විශේෂ අත්‍යන්ත්‍ර මෝස්තර පාඨමාලා 25 ක් පැවැත්වීම මගින් පේෂකාර්මිකයින් 500 ක් පුහුණු කිරීම.
2. පේෂපාසැල් සහ මෝස්තර ආයතනවල සිසුන් සඳහා ආකල්ප සංවර්ධනය සහ පෞරුෂ වර්ධන වැඩසටහන් පැවැත්වීම.
3. නිෂ්පාදන විවිධාංගීකරණ පාඨමාලා හඳුන්වාදීම.
4. පළාත් රාජ්‍ය, සමුපකාර හා පෞද්ගලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන් හා නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

**(04) පේෂකර්මාන්ත ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**

1. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කර අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම සහ ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා ජාතික ප්‍රදර්ශනය සහ සම්මාන උළෙල 2024 වසරේ පැවැත්වීම.
2. අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල් 02 ක් පැවැත්වීම.
3. නව මෝස්තර 20 ක් ක්ෂේත්‍රයට හඳුන්වා දීම.
4. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත කර්මාන්තකරුවන් 80 දෙනෙකු සඳහා අලෙවි සල්පිල් සංවිධානය මඟින් අලෙවි පහසුකම් සැපයීම.

**(05) පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන**

1. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත උපකරණ, උපාංග වැඩිදියුණු කිරීම.
2. විදේශිය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් ස්වභාවික වර්ණ උපයෝගී කර ගත් අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**(06) පේෂකර්මාන්ත ගොඩනැගිලි සංවර්ධනය**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය පාසල් ගොඩනැගිලි වල හඳුනාගත් අලුත්වැඩියාවන් පහත පරිදි වේ.

1. කිරම, සමන්තුරේ හා බෝයගනේ පේෂකර්මාන්ත පුහුණු ආයතනවල අළුත්වැඩියා කටයුතු.
2. කටුබැද්ද පර්යේෂණ, මෝස්තර ,පුහුණු හා සේවා ආයතනයේ අළුත්වැඩියා කටයුතු.

# 15

# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව (ROC)

## 15.1 හැඳින්වීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරනු ලබයි.

### අරමුණු

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමිති ආඥාපනත - 123 වන අධිකාරිය
- 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත
- 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීම.

### ප්‍රධාන කාර්යයන්

- පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, සීමා රහිත සමාගම් ,සහ ලැයිස්තුගත සමාගම් සංස්ථාපනය කිරීම.
- විදේශීය සමාගම් සහ අක්වෙරළ සමාගම්, සමිති, පොදු කොන්ත්‍රාත්, උකස්බැඳුම්කර, ඍණපත්‍ර, ගණන් පරීක්ෂකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම.

- සමාගම් පනත සහ සමිති ආඥා පනත අනුව සමාගම් සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාල ලේඛන ලියාපදිංචි කිරීම.
- සමාගම් ඈවර කිරීම හා විසුරුවා හැරීම
- සමාගම්/සමිති වලට අදාල සියළුම තොරතුරු යාවත්කාලීන කිරීම
- සහතික පිටපත් නිකුත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබා දීම.
- ලේඛන තහවුරු කිරීම.
  - ගාස්තු එකතු කිරීම හා සැසඳීම.
  - රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත අවශ්‍ය තොරතුරු, සහතික පිටපත් ලබා දීම හා අවශ්‍ය සහාය ලබා දීම

### විශේෂ ජයග්‍රහණ

- ව්‍යාපෘති කළමණාකරණ ආයතනය විසින් 2023 වසරේදී සංවිධානය කරන ලද 6 වන ජාතික ව්‍යාපෘති කළමණාකරණ විශිෂ්ඨතා සම්මාන උලෙලේදී "Winner of the Best Managed Government project" සහ "Overall Best Managed Government Project with National Significance"යන සම්මාන දෙකම දිනාගැනීමට සමත් විය.
- සමාගම් ලේකම්වරුන් පිළිබඳ නව රෙගුලාසි මාලාවක් හඳුන්වා දෙමින් 2023 අංක 01 දරණ සමාගම් (ලේකම්වරුන් පිළිබඳ) නියෝග මාලාව ගැසට් කිරීමට හැකිවීම.
- නීතියේ සිදුවූ ඉහත වර්ධනයට සමගාමීව සමාගම් ලේකම්වරුන්ට නව සමාගම් පනත යටතේ ලියාපදිංචි වීමට පහසුකම් සලසනු පිණිස E-Rocපද්ධතියේ සමාගම් ලේකම්වරු ලියාපදිංචියට අදාල මොඩියුලය (Module) වෙනස්කර නව මොඩියුලයක් ක්‍රියාත්මක කරවීම.
- Colombo Port City Economic Commission Act යටතේ වරාය නගර (Port City) සීමාවේ ව්‍යාපාර කටයුතු කිරීම ආරම්භ කරන අක්වෙරළ සමාගම් ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා වන විශේෂ මොඩියුලයක් E-Roc පද්ධතිය මගින් දියත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශයත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවත් අතර ඇතිකරගෙන ඇති කාර්යසාධන ගිවිසුම ප්‍රකාරව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පුහුණු සැසි නියමිත කාල වකවානු තුල පැවැත්වීමට හැකි වීම.

## 15.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය

#### අරමුදල් ගිණුම

| | 2023.01.01 සිට 2023.09.30 දක්වා |
|---|---|
| මුළු ආදායම (රු.) | 736,848,257.43 |
| මුළු වියදම(රු.) | 125,725,785.03 |
| අතිරික්තය (රු.) | 611,122,472.40 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

#### ඒකාබද්ධ අරමුදල

| | 2023.01.01 සිට 2023.09.30 දක්වා |
|---|---|
| මුළු ආදායම (රු.) | 163,651,112.05 |
| මුළු වියදම(රු.) | 57,675,326.97 |
| අතිරික්තය (රු.) | 105,975,785.08 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

**නව සමාගම් සංස්ථාපනය කිරීම**

| | 2023.01.01 සිට සැප්තැම්බර් මස දක්වා |
|---|---|
| නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 21,267 |
| අනුමත කළ සංඛ්‍යාව | 20,814 |
| ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව | 60 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

**විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව**

| | 2023.01.01 සිට සැප්තැම්බර් මස දක්වා |
|---|---|
| සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 19 |
| ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 4 |
| අධිකරණයෙන් ඇවර කිරීම | 3 |
| පනතේ 394 යටතේ නම කපා හැරීම | 288 |
| ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම | 1 |
| විදේශ සමාගම්වල නාමය කපා හැරීම | 15 |
| එකතුව | 330 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

**2023.01.01 දින සිට සැප්තැම්බර් මස දක්වා ලියාපදිංචි කර ඇති සමිති සංඛ්‍යාව - 20**

**පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම.**

| | ප්‍රමාණය | ආදායම (රු) |
|---|---|---|
| 2023.01.01 දින සිට සැප්තැම්බර් මස දක්වා | 15,713 | 34,830,000.00 |

*මූලාශ්‍රය: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව*

## 15.3 අනාගත සැලැසුම් - 2024

- Electronic Signature හඳුන්වා දීම
- සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම
- නාමය අනුමත කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම
- වරාය නගර සංවර්ධන කොමිසම වෙත ඇදී එන ආයෝජකයන් ආශ්‍රයෙන් අක් වෙරළ සමාගම් ලියාපදිංචි කර ගැනීම
- ජාතික හැඳුනුම්පත තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වා දීම
- දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම
- අවසාන ආයෝජකයින් හට ආකර්ශනීය සේවාවක් ලබා දී ඉහළ වෙළඳ ප්‍රජාවක් බිහිකර එමගින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

# 16

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

## 16.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරා සිටින සිය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබා දීමට කාර්මික සංවර්ධන මණ්ඩලය සහතික වේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

### මණ්ඩලයේ අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

### ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන්

- කළමනාකරණ සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා සැපයීම.
- දේශීය කර්මාන්ත සඳහා ඉංජිනේරු සේවා, වැඩමුළු සහ වාත්තු පහසුකම් සැපයීම.
- ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සේවා සැපයීම සහ දැනට ආරම්භකර ඇති ව්‍යාපාර සඳහා ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම.
- කාර්මිකයන්, සේවාදායකයින් සහ කාර්යය මණ්ඩලය සඳහා කාර්මික තොරතුරු බෙදාහැරීම.
- දේශීය නිෂ්පාදනයෙන් හටගන්නා අබලි ලෝහ ද්‍රව්‍ය අපනයනය සඳහා නිර්දේශ ලබා දීම.
- දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ සංයෝග මෙන්ම කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම සැපයීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.
- දේශීය වාත්තු කර්මාන්තය දියුණු කිරීමට පහසුකම් සැලසීම සහ අගය එකතු කළ ලෝහ නිෂ්පාදන අපනයනය සඳහා නිර්දේශ සහ සම්බන්ධීකරණය සැපයීම.

## 16.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### වාර්ෂික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය

මෙරට සම්භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාදීමේ අරමුණින් පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය දහතුන්වැනි වරටත් සංවිධානය කර තිබුණි. කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළුව කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් එක්ව මෙම ප්‍රදර්ශනය සංවිධානය කරනු ලබන අතර වර්තමානය වන විට ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන දින දර්ශනයේ වාර්ෂික උත්සවයක් බවට මෙම ප්‍රදර්ශනය පත්ව ඇත.

**සම්භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත**



### "කර්මාන්ත 2023" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සෙසු රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ සියලුම ආයතනවල සහයෝගයෙන් මෙම උත්සවය සංවිධානය කරන ලදී. "කර්මාන්ත **2023**" හි ප්‍රධාන අරමුණ වනුයේ අපනයන කේන්ද්‍ර කරගත් නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම සඳහා දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම වේ. මෙම දැවැන්ත ප්‍රදර්ශනයට නිෂ්පාදන අංශ **20** ක් නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටි **750** ක් ඇතුළත් වූ

අතර දිවයින පුරා පිහිටි ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ කර්මාන්ත බොහොමයක් සම්බන්ධ වන ලදී.

**"කර්මාන්ත 2023" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය**




## 'පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව' වැඩසටහන

පාසල් මට්ටමින් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා **IDB** ආයතනය අධ්‍යාපන අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. මෙය ක්‍රියාවට නැංවීමේ මූලික අරමුණ වන්නේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්තිමත් පුද්ගලයකු ගොඩනැගීම සඳහා ව්‍යවසායකත්ව සංස්කෘතියක් මෙරට ගොඩනැගීමයි.

**'පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව' වැඩසටහන**




## ජාතික ආහාරපාන ආශ්‍රිත සමුළුව - 2023

කර්මාන්ත අමාත්‍යාංශය, IDB සහ UNIDO සමඟ එක්ව, ආහාර සහ පාන ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලෝක වෙළඳපොළට සාර්ථකව ප්‍රවේශ වීමට ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා අවශ්‍ය මගපෙන්වීම සැපයීමේ අරමුණින් ජාතික ආහාරපාන ආශ්‍රිත සමුළුව (2023) සංවිධානය කරන ලදී. කර්මාන්ත හා වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් මෙය පැවැත්විණි. මෙම සාකච්ඡාවේදී ශ්‍රී ලංකාවේ එළවලු සහ පලතුරු අපනයන විභවය සහ ලෝකයේ අවශ්‍යතා හඳුනා ගනිමින් මෙම අංශයේ අපනයන වැඩිදියුණු කිරීම පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරන ලදී.

**ජාතික ආහාරපාන ආශ්‍රිත සමුළුව - 2023**




## කලාපීය කර්මාන්ත ප්‍රදර්ශන

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත වර්ධනයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් කර්මාන්ත අමාත්‍යාංශය හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කලාපීය මට්ටමින් පැවැත්වීමට සංවිධානය කරන ලද ප්‍රදර්ශන මාලාවේ ප්‍රථම ප්‍රදර්ශනය යාපනයේදී පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය පවත්වන ලද දින තුන තුළ පුළුල් නිෂ්පාදන සහ සේවා ක්ෂේත්‍ර ආවරණය කරමින් විවිධ කර්මාන්ත අංශවල සහභාගීත්වය ලබා ගැනීමට හැකියාව හිමිවිය. මෙම අවස්ථාව වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

**කර්මාන්ත 2023 – යාපනය**



| කාර්මික ජනපද ක්‍රියාකාරකම | 2023/09/30 දිනට ප්‍රගතිය |
|---|---|
| කාර්මික ජනපද සංඛ්‍යාව | 16 |
| වාණිජ නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලී සිටින කර්මාන්ත ගණන | 279 |
| කර්මාන්ත ක්ෂේත්‍ර ගණන | 20 |
| රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 8595 |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2023*

**භෞතික ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | 2023/09/30 දිනට ප්‍රගතිය |
|---|---|
| නව කර්මාන්ත ඇති කිරීමට සහය වීම (කර්මාන්ත සංඛ්‍යාව) | 73 |
| පවතින කර්මාන්ත දියුණු කිරීමට සහය වීම (කර්මාන්ත සංඛ්‍යාව) | 205 |
| පවත්වන ලද තාක්ෂණික පුහුණු වැඩසටහන් | 646 |
| පවත්වන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 312 |
| ලෝහ ආශ්‍රිත කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස ලෝහ අවශේෂ සැපයීම (මෙට්‍රික් ටොන්) | 547 |
| රබර් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා රබර් සංයෝග සැපයීම(කි.ග්‍රෑම්) | 24,323 |
| ආහාර රසායනාගාරය මගින් ආහාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (සංඛ්‍යාව) | 524 |
| ලක්කම් අලෙවි මධ්‍යස්ථානය හරහා අලෙවි පහසුකම් ලබාදීම (ආයතන) | 336 |
| ඉංජිනේරු සේවා සැපයීම (අභ්‍යන්තර සහ බාහිර) | 697 |
| ආයෝජකයින් සඳහා IDB හි කාර්මික ජනපදයන්හි වෙන් කර ඇති සංවර්ධිත බිම් කොටස් ගණන | 583 |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2023*

**සේවාවන්**

| විස්තර | 2023/09/30 දිනට ප්‍රගතිය |
|---|---|
| තොරතුරු, උපදෙස් සහ උපදේශන බෙදා හැරීම | 270 |
| ඉංජිනේරු සහය (බාහිර) | 545 |
| අලෙවිකරණ සහය | 724 |
| මූල්‍ය ආධාර සඳහා සම්බන්ධීකරණය | 182 |
| තාක්ෂණික සහාය | 1,613 |
| **එකතුව** | **3,334** |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2023*

**පුහුණු වැඩසටහන්**

| විස්තර | 2023/09/30 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| තාක්ෂණික පුහුණු වැඩසටහන් | 646 | 12,820 |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණ ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | 312 | 13,667 |
| **එකතුව** | **958** | **26,487** |

*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2023*




*මූලාශ්‍රය : IDB ප්‍රගති වාර්තාව – 2023*

## මූල්‍ය ප්‍රගතිය

- පුනරාවර්තන සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා **2023** වර්ෂයේ වෙන් කර ඇති මුළු මුදල පිළිවෙලින් රු.මි. **517** සහ රු.මි. **94,** වේ. අදාල වෙන්කිරීම් තුලින් **2023** සැප්තැම්බර් මස අවසන් වන විට පුනරාවර්තන වියදම් සඳහා **60%**ක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා **80%**ක් වශයෙනුත් දරා ඇත.
- සංවර්ධන කටයුතු සඳහා වර්ෂයේ ප්‍රතිපාදන රු.මි. **40** ක් වන අතර මේ වන විට එමගින් **90%** කට ආසන්න මුදලක් වැය කර ඇත.
- රු.මි. **60**ක මුදලක් **2023** වසර සඳහා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති අතර, ඉන් **65%** ප්‍රාග්ධන අයවැය හරහා වියදම් කර ඇත.
- දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා මුළු ප්‍රතිපාදන රු.මි.**100**ක් වන අතර, **2023** සැප්තැම්බර් මස අවසන් වන විට ව්‍යාපෘති සඳහා **30%**ක පමණ ප්‍රමාණයක් වියදම් කර ඇත.

## 16.3 අනාගත සැලසුම් - 2024

### 1) නව ව්‍යාපෘති

- ජාතික මෙවලම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- මෝටර් රථ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- පාසල් කාර්මික ව්‍යවසායකත්ව කව පැවැත්වීම.
- ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම.
- වාලච්චේන සම් ආශ්‍රිත කර්මාන්ත සඳහා කාර්මික උද්‍යානයක් පිහිටුවීම.

### 2) අඛණ්ඩව ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පීඩන යාත්‍රා සහ බොයිලේරු සංවර්ධනය සඳහා පරීක්ෂණ, සංවර්ධන සහ පුහුණු පහසුකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- ප්‍රධාන සහ කුඩා කාර්මික ජනපද වැඩිදියුණු කිරීම.
- පිළිගත් ආහාර රසායනාගාරයක් පිහිටුවීම.

## 2023 සැප්තැම්බර් 30 වන දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද වල සාරාංශය

| අනු අංකය | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය | මුළු බිම් කොටස් ගණන | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය (රු. මි.) | මෙහෙයුම් කර්මාන්ත | පුද්ගලික ආයෝජන (රු. මි.) | වාර්ෂික පිරිවැටුම (රු. මි.) | රැකියා (ගණන) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඒකල | ගම්පහ | 92 | 105.37 | 56 | 36669.50 | 25779.00 | 2759 |
| 2 | පල්ලෙකැලේ | මහනුවර | 111 | 99.62 | 65 | 13181.60 | 18750.60 | 2010 |
| 3 | පානළුව | කොළඹ | 29 | 63.90 | 22 | 1154.90 | 1304.20 | 499 |
| 4 | හොරණ | කළුතර | 66 | 15.65 | 14 | 998.51 | 4295.80 | 1469 |
| 5 | වවුලුගල | කළුතර | 14 | 19.90 | 13 | 261.10 | 459.00 | 195 |
| 6 | පුස්සැල්ල | රත්නපුරය | 29 | 15.21 | 11 | 2140 | 126.17 | 135 |
| 7 | ගලිගමුව | කෑගල්ල | 12 | 13.90 | 10 | 132.00 | 145.50 | 129 |
| 8 | බුත්තල | මොනරාගල | 22 | 20.00 | 6 | 22.50 | 85.00 | 78 |
| 9 | කොටගල | නුවරඑළිය | 58 | 6.90 | 9 | 274.70 | 173.60 | 120 |
| 10 | කළුදේවල | මාතලේ | 45 | 49.60 | 14 | 164.80 | 420.00 | 260 |
| 11 | මිහින්තලේ | අනුරාධපුර | 38 | 5.04 | 3 | 3.70 | 20.00 | 20 |
| 12 | නාගම්පහ | අනුරාධපුර | 44 | 24.00 | 0 | 5.00 | 4.50 | 3 |
| 13 | පන්නල - පළමු අදියර | කුරුණෑගල | 34 | 69.89 | 18 | 398.50 | 609.39 | 297 |
| | පන්නල - 2 වන අදියර | | 9 | | 1 | 30.00 | 28.00 | 10 |
| 14 | ලුණුවිල | පුත්තලම | 18 | 4.90 | 12 | 83.90 | 175.00 | 203 |
| 15 | පුන්තෝඩම් | වවුනියාව | 64 | 30.57 | 18 | 53.50 | 153.50 | 165 |
| 16 | අච්චුවේලි - 1 වන අදියර | යාපනය | 23 | 192.00 | 7 | 417.40 | 275.00 | 235 |
| | අච්චුවේලි - 2 වන අදියර | | 25 | 41.57 | 1 | 120.00 | 96.00 | 40 |
| සමස්ත එකතුව | | | **733** | **778.02** | **280** | **54185.61** | **52900.26** | **8627** |

*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*

# 17

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

## 17.1 හැඳින්වීම

මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශයට විශේෂ අවධානයක් යොමු කරමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම සිදු කරයි. එමගින් ව්‍යවසායකයින්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සැපයීම, අලෙවිකරණ සම්බන්ධතා, පර්යේෂණ සහ සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සේවාවන් සපයනු ලබයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, වාර්තා තබා ගැනීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම යනාදි ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථාද ලබාදෙයි.

## 17.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### 1. “උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය” වැඩසටහන (“ව්‍යාපාරයට බුද්ධිය”)

උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලද අතර එය “උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය” වශයෙන් නම් කරන ලදි. උපාධිධාරීන් ව්‍යාපාර ලෝකයට අවතීර්ණ වීම දිරිගැන්වීම හා ඔවුන් සාර්ථක ව්‍යාපාරිකයින් වශයෙන් ඉදිරියට ගෙන ඒම මෙම වැඩසටහනේ අරමුණයි. ජාතික

ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2022 වර්ෂය වනවිට උපාධිධාරී ව්‍යවසායකයින් 200ක් ව්‍යාපාරික ලෝකයට හඳුන්වා දී ඇත.

2023 වර්ෂයේදී කොළඹ, කැලණිය, ජයවර්ධනපුර, මොරටුව, රුහුණු, සබරගමුව සහ පේරාදෙණිය යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 245 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇති අතර, ප්‍රතිපාදන නිකුත් කිරීම සඳහා ව්‍යාපාර සැළසුම් 43ක් ලැබී ඇත.

**ව්‍යවසායකත්ව පුහුණුව**

| විශ්වවිද්‍යාලය | පුහුණු උපාධිධාරීන් |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 44 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 31 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 56 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 32 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 18 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 48 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 16 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 15 |
| රජරට විශ්වවිද්‍යාලය | 37 |
| මුළු ගණන | 332 |

*මූලාශ්‍රය - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය*

**උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය**





## 2. ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශිෂ්ට දායකත්වයක් සපයා ඇති ව්‍යවසායකයින්ට පිලිගැනීමක් ලබාදීම, ඇගයීම හා දිරිමත් කිරීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පළාත් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලැබේ.2023 වර්ෂය තුළ සම්මාන ප්‍රදානෝත්සව පහක් පැවැත්වීමට හා ව්‍යවසායකයින් සඳහා සම්මාන 100 ක් පිරිනැමීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කර ඇති අතර සහාය සංවිධාන සමඟ ගිවිසුම් අත්සන් කර බස්නාහිර, දකුණ, උතුරු මැද, සබරගමුව සහ ඌව පළාත්වල පැවැත්වීමට සැලසුම් කර ඇත.

## 3. ව්‍යාපාර පර්ෂද/ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් (MSMEs) ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයේ හා විවිධාංගීකරණයේ පෙර ගමන්කරුවන් වශයෙන් සැලකිය හැක. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හුදෙකලා තත්වයකට පත්ව ඇති අතර අගය දාමය තුළ ස්වාධීනව කටයුතු කිරීමට ඔවුන්ට සිදුව ඇත. තරඟකාරීත්ව පීඩනයට අඛණ්ඩව මුහුණ දීම සඳහා සිය ධාරිතාව වර්ධනය කරගැනීම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දුෂ්කර කාර්යයකි. මෙම ගැටළුවට පිලියමක් වශයෙන්, පර්ෂද/ක්ෂේත්‍ර ප්‍රවේශය මත පදනම්ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම ක්‍රියාවට නංවා ඇති අතර, මෙම පර්ෂද/ක්ෂේත්‍ර -පදනම් ප්‍රවේශය තුළ ව්‍යවසායකයින්ට විවිධ වාසි සලසා ඇත. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පර්ෂදවලට පුහුණු අවස්ථා ලබාදීම, තාක්ෂණික නවෝත්පාදන සඳහා සහාය, මූල්‍ය සඳහා පහසු ප්‍රවේශය මෙන්ම ආයතනික සහාය ලබාගැනීමේ අවස්ථා සලසා තිබීම ඒ අතරින් කිහිපයකි. තව ද, එක් එක් ප්‍රදේශයන්හි පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල ව්‍යාපාරයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා (BDS) සැපයීමේදී දැරීමට සිදුවන වියදමට වඩා අඩු වියදමකින් මෙම ව්‍යාපාර පර්ෂදයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට රාජ්‍ය ආයතනවලට හා

අනෙකුත් සහයෝගීතා ආයතනයන්ට අවස්ථාව සැලසී ඇත.

2023 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය මගින් අධිකාරිය වෙත ව්‍යාපාර පර්ෂද යෝජනා 16 ක් ලැබී ඇති අතර, ඒ අතරින් ව්‍යපෘති යෝජනා 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගෙන ඇත. (පර්ෂද යෝජනා 02 ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.) ILO ව්‍යාපෘතිය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපාර පර්ෂද 4 ක් ස්ථාපිත කර ඇත. (ඇඟලුම් සහ බතික් පදනම් කර ගත්)

## 4. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ද්වාරය

මෙම වැඩසටහන තුළින් ශ්‍රී ලාංකේය නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා උදාකර දීම උදෙසා කාර්යක්ෂම හා ඵලදායී වෙළඳ ද්වාරයක් ස්ථාපිත කිරීමට හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මෙකී වෙළඳ ද්වාරය තුළ ලියාපදිංචි කිරීම මගින් වෙළඳ පොළ අවස්ථා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ව්‍යාපාර හා ව්‍යාපාර අතර (B2B), ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ (MSMEs) ව්‍යාපාර හා මහා පරිමාණ ව්‍යාපාර මෙන්ම ඔවුන්ගේ හවුල්කරුවන් හා පාරිභෝගිකයින් අතර (B2C) ගණුදෙනු ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකර ගැනීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මගපෙන්වීම යටතේ ඩිජිටල් වේදිකාවක් තනා දීමයි. මෙම වෙළඳ ද්වාරය 2021 දෙසැම්බර් මස ආරම්භ කරන ලදි.

2023 සැප්තැම්බර් මස වනවිට විකුණුම්කරුවන් 1074 ක් ලියාපදිංචි කර ඇති අතර සැපයුම්කරුවන් 157 දෙනෙක් ලියාපදිංචි කර ඇත.

## 5. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ප්‍රදර්ශන

ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ඉහළ අගය එකතු කිරීමකින් යුත් අව්‍යාජ ශ්‍රී ලාංකේය නිශ්පාදන ප්‍රවර්ධනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය එළිදක්වන ලදි. ඊට සමගාමීව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලාංකීය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වාදීම සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම සැළසුම් කර ඇත. 2023 වර්ෂය තුළ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්කවල වෙළඳ ප්‍රදර්ශන 02ක් පවත්තන ලදි. යාපනය සහ ගම්පහ වෙළඳ ප්‍රදර්ශන ප්‍රදර්ශන සංවිධානය කරමින් ඇත. ඊට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ප්‍රාදේශීය මට්ටමින් සුළු පරිමාණ ව්‍යවසායක වෙළඳ ප්‍රදර්ශන 702 ක් පවත්වා ඇති අතර ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳ කුටි ලබා දී ඇත.

## 6. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය යටතේ වරලත් වෙළඳසැල් ප්‍රවර්ධනය කිරීම.

"මේඩ් ඉන් ශ්‍රී ලංකා" වරලත් වෙළඳසැල් ප්‍රමුඛ පෙළේ පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගන්නා ස්ථානවල ස්ථාපිත කරනු ලබන අතර, එම වෙළෙඳ කුටි පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යනු ඇත. මෙම යාන්ත්‍රණය ක්ෂුද්‍ර. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට රට පුරා අලෙවිකරණ සම්බන්ධතා වැඩිදියුණු කරගැනීමට ඉවහල් වනු ඇත. තව ද, "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය සහිත සැපයුම්කරුවන්ට තම නිෂ්පාදන වරලත් වෙළඳසැල් තුළ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සැලසෙන අතර එමගින් ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීමට අවස්ථාව සැලසේ.

2023 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් වරලත් අළෙවි සැලක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා සුදුසු හවුල්කරුවෙකු හඳුනා ගැනීමට කටයුතු කරමින් සිටී.

## 7. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය පිරිනැමීම සහ ප්‍රවර්ධනය

දේශීය සම්පත් යොදා ගනිමින් දේශීයව සිදුකරන ව්‍යාපාර කෙතරම් තිබුණද ආනයනික නිෂ්පාදන හා සසඳන විට දේශීය නිෂ්පාදන සඳහා නිසි පිළිගැනීමක්

නොතිබුණු බැවින් ආනයනය කරන ලද නිෂ්පාදන සඳහා පාරිභෝගිකයින් ප්‍රමුඛත්වය ලබා දී තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය නිෂ්පාදනයන්ට වඩා ආනයනික නිෂ්පාදන ගුණාත්මකභාවයෙන් ඉහල බවට පිලිගැනීමක් පාරිභෝගිකයින් තුළ ඇති වූ අතර, දේශීය නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් පහත වැටිණි. එබැවින්, දේශීය නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය නිරූපණය කිරීම උදෙසා ලාංඡනයක් ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පියවර ගන්නා ලදි. වාර්ෂිකව අවම වශයෙන් ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා ලාංඡනය පිරිනැමීම මෙහි ඉලක්කය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂය සඳහා ව්‍යවසායකයින් 50 දෙනෙකුට ලාංඡනය පිරිනැමීමට සැලසුම් කර ඇත.

## 8. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දත්ත පද්ධතිය

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පිළිබඳ සියලු දත්ත එක් පද්ධතියක් මගින් ලබා ගත හැකි පරිදි සකස් කරන ලද දත්ත ගබඩාවක් කිසිදු ආයතනයක් විසින් සකක් කොට නොමැත. සියලු දත්ත ඇතුලත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ දත්ත ගබඩාවක් නොමැති වීම කර්මාන්ත අංශයේ උපායමාර්ගික තීරණ සකස් කිරීමේදී සැලකිය යුතු අන්දමේ බලපෑමක් සිදුකරන කරුණකි. මෙමගින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන්ට ව්‍යවසායකයින් පිළිබඳ දත්ත මෘදු පිටපත් කිරීමට හා තොරතුරු වරින් වර යාවත්කාලීන කිරීමට ඉඩ සලසයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කරන ලද අතර, ඊට ව්‍යවසායකයින් 260,000 ක් පිළිබඳ දත්ත ඇතුලත් කර ඇත.

## 9. ව්‍යවසායකත්ව සංසදය

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද තුළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය සේවා සපයන ආයතනයන්හි නියෝජිතයින් එක්ව කටයුතු කරන අතර, දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසදයේ සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම් විසින් දරනු ලබයි. තව ද, ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදයේ සභාපතිත්වය ප්‍රාදේශීය ලේකම් විසින් දරනු ලබන අතර, ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යවසායකයින් සහ සියලු ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවර්ධන සේවා සපයනු ලබන්නන් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදය නියෝජනය කරයි. එලෙසම දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතයින් දිස්ත්‍රික් සංසදය නියෝජනය කරනු ලබයි. තව ද, ජාතික මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් උපාය මාර්ගිකව ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම උදෙසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව උපදේශන සභාව ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම, අදාල අමාත්‍යාංශ නියෝජනයන් සහ රාජ්‍ය ආයතන නියෝජිතයන් ඇතුළු පෞද්ගලික අංශය නියෝජනය කරන්නාවූ කිහිපදෙනෙකු ද ඇතුලත්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පහසුකරණ සංසදයක් ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද 331 ක් පවත්වා අවසන් කර ඇත. ව්‍යාපාරික ගැටළු 603ක් විසඳා ඇත.

## 10. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ප්‍රාදේශීය ව්‍යසායකයින්ට ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණය හා මූල්‍ය කළමනාකරණය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීමේ ව්‍යාපාරික ගැටලු පවතින බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන අතර, ඔවුන් එවැනි

ගැටලුවට මුහුන පාන ව්‍යවසායකයින් හඳුනාගනිමින් ඔවුන්ගේ ගැටලුවලට අදාළ විසඳුම් සෙවීමට කටයුතු කරනු ලබයි.

2023 වර්ෂය තුළ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් 21,313 දෙනෙකු පුහුණු කර ඇති අතර, නව ව්‍යාපාර 696 ක් ආරම්භ කර ඇත. ව්‍යාපාර 735 ක් පුළුල් කර ඇත. අවශ්‍යතා අනුව අනෙකුත් සහයෝගයන් ලබා දී ඇත.

### 11. “ SME සම්බන්ධක” මාර්ගගත වේදිකාව

“SMEconnect.lk” වේදිකාවට අරමුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ‘කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ණය රේඛාව” ව්‍යාපෘතිය මගිනි. කර්මාන්ත අමාත්‍යාංශයේ සමීප අධීක්ෂණය යටතේ වේදිකාවේ සහ කළමනාකාරිත්වයේ ප්‍රාථමික හිමිකාරිත්වයේ වගකීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් භාරගත යුතුය.

වේදිකාවේ පරමාර්ථය වන්නේ රට පුරා කාන්තා ව්‍යවසායකයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ව්‍යවසායකයින්ට සහ ව්‍යවසායකත්ව සංවර්ධනයට සහය දැක්වීම සඳහා අදාළ සහ යාවත්කාලීන තොරතුරු සහ සම්පත් වෙත ප්‍රවේශය සැපයීමයි. smeconnect.lk වේදිකාව මූලික වශයෙන් කාන්තා ව්‍යවසායකයින්ගේ පහත අවශ්‍යතා සපුරාලයි.

1. දැනුම බෙදාගැනීම (ඉගෙනීම)
2. උපදේශනය
3. ජාලකරණ අවස්ථා

පරිශීලක 945 ක් හා උපදේශකයින් 90 ක් ලියාපදිංචි වී ඇත. උපදේශක සැසි 27 ක් පවත්වා ඇත. සාර්ථක අවස්ථා 13ක් ඇතුළත්ය.

## 17.3 අනාගත සැලසුම් - 2024

- වෘත්තීය පුහුණු ආයතන සමඟ තරුණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන් සඳහා ව්‍යවසායකත්වය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන සහතික පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- “One Stop Shop” සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.
- ලුහු ඉංජිනේරු සහ ඉදිකිරීම් ක්ෂේතයේ (වඩු සහ පෙදරේරු) නිරත වුවන් සඳහා ව්‍යවසායකත්ව සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ත්‍රිරෝද රථ හිමියන් ව්‍යවසායකයින් බවට පත් කිරීමෙන් ඔවුන්ගේ ජීවනෝපාය තත්ත්වය වැඩිදියුණු කිරීම.
- පාසල් ව්‍යවසායකත්ව අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# 18

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)

## 18.1 හැඳින්වීම

### කහටගහ මිනිරන් පතල

කහටගහ මිනිරන් පතල වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ මදුරාගොඩ පිහිටා ඇති අතර එය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් මඟින් කළමනාකරණය කරනු ලැබේ. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවන ලද පොදු සීමිත සමාගමක් වන අතර එහි හිමිකාරිත්වය සම්පූර්ණයෙන්ම රජය සතුවේ.

කහටගහ පතල සතු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 102 කි.

### කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන

ඉහල කාබන් ප්‍රතිශතයක් සහිත ස්ඵටිකරූපී ඉල්ලම් මිනිරන් වාණිජ මට්ටමෙන් සපයන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම කහටගහ පතල සම්පූර්ණ ස්ඵටික වශයෙන් පවතින 99%කට වඩා වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත ඉතා පිරිසිදු ස්වභාවික ඉල්ලම් මිනිරන් සැපයීමට සමත් අතර ලෝක වෙළෙඳපොලේ සුවිශේෂී පිලිගැනීමක් පවතී.

### මිනිරන් අපනයනය

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම යනු අපනයන ඉලක්ක කරගත් සමාගමක් වන අතර වර්ෂ 2023/24 දී එහි ප්‍රධාන අපනයන රට වූයේ ජපානයයි.

### අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි උපරිම අගය වැඩි කිරීම."

## 18.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**නිෂ්පාදනය 2008-2023**




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2023/24, අප්‍රේල් 1 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා මුළු ග්‍රැෆයිට් (කැණීම් කල ප්‍රමාණය) නිෂ්පාදනය 175M/T වේ. එය 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සැලකූ විට මුළු මිනිරන් නිෂ්පාදනය 226 M/T වේ

මූල්‍ය වර්ෂය සඳහා සාමාන්‍ය නිෂ්පාදන ඉලක්කය මසකට 65 - 70 M/T විය. ඉලක්කය රඳා පවතින්නේ එම අවස්ථාවේ විවෘතව පවතින ඉල්ලම් වල සරුබව, ඒවා පිහිටා ඇති මට්ටම් (ගැඹුර), මිහිතුල කම්කරුවන්ගේ සංඛ්‍යාව සහ පතලේ අනෙකුත් සංවර්ධන කටයුතු යන කරුණු මතය.

### අලෙවිය

KGLL විසින් 2023 අප්‍රේල් 1 සිට සැප්තැම්බර් 30 දක්වා 40 M/T අපනයනය කරන ලද අතර එය 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සැලකූ විට 144 M/T අපනයන ප්‍රමාණයකි.

ජාත්‍යන්තර මිනිරන් වෙළඳපොලේ ස්වභාවය නිසා විකුණුම් නිතර උච්චාවචනය වේ. එසේම, කෘත්‍රිම මිනිරන් ආදේශක වෙළඳපොලට ඇතුල්වීම නිසා ස්වභාවික මිනිරන් අලෙවිය විශාල ලෙස පහත වැටීමට පටන් ගෙන ඇත.

### අලෙවිය 2008-2023




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

### ආදායම




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2023/24 වත්මන් මූල්‍ය වර්ෂය තුළ, 2023 අප්‍රේල් 1 සිට සැප්තැම්බර් 30 දක්වා, ආදායම රු. මිලියන. 18.322 කි. එසේම, 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා ආදායම රු. මිලියන 81.89 කි.

### ලාභය




***මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්***

2023/24 වත්මන් මූල්‍ය වර්ෂය තුළ, 2023 අප්‍රේල් 1 සිට සැප්තැම්බර් 30 දක්වා, ශුද්ධ බදු පෙර අලාභය රු. මිලියන. 1.8 කි. එසේම, 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා ශුද්ධ බදු පෙර ලාභය රු. මිලියන 31.43 කි.

### තොගය

මුදල් සහ බැංකු ශේෂය හැරුණු විට, 2023 සැප්තැම්බර් 30 වන දිනට දැනට පවතින තොග මෙ.ටොන් 1177.47 ට අදාළව වෙළඳපල කොටස්වල වටිනාකම රුපියල් මිලියන 428.12 කි.

### ශ්‍රම බලකාය

පුහුණු පතල් කම්කරුවන් 57 දෙනෙකු සහ වෙනත් අදාල තාක්ෂණික කාර්යය මණ්ඩලය ඇතුළුව මුළු ශ්‍රම බලකාය 108 ක් වේ.

### කහටගහ පතලේ වත්මන් ප්‍රගතිය

- පතලේ වර්තමාන කැණීම් ක්‍රමවේදයන් සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම. ඒ සඳහා පලපුරුදු ජ්‍යෙෂ්ඨ වරලත් ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.
- ඊට අමතරව පුරප්පාඩුව පැවති කැණීම් ඉංජිනේරු තනතුර සුදුසුකම් සහිත කැණීම් ඉංජිනේරු වරයෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම.
- සේවක ශ්‍රමය උපරිම ඵලදායීතාවයකින් අදාළ අංශ වෙත කළමනාකරණය කොට යොමු කිරීමට කටයුතු කර ඇති අතර කැණීම් කටයුතු වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව සිදු කෙරේ.
- අනවශ්‍ය වියදම් සහ අනර්ථකාරී ක්‍රියාකාරීත්වයන් නවතා නිසිලෙස කළමනාකරණය කර දීම.
- නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය බඳවා ගැනීම් හඳුනාගෙන ඒ සඳහා මිහිතුලට අවශ්‍ය කම්කරුවන් බඳවා ගැනීම.
- පතල් පරිශ්‍රයේ පිරිසැකසුම් යන්ත්‍රාගාරයක් **(Froth flotation plant)** ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- දෙවැනි ආවාටය (2nd Shaft) කැණීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- කිසිදු වැඩ වර්ජනයක්/උද්ඝෝෂණයක් නව සභාපතිවරයා යටතේ මේ දක්වා සිදු වී නොමැති අතර සේවක විනය මේවන විට උපරිම මට්ටමක පැවතීම සතුටුදායක කරුණකි. එය නිෂ්පාදන සඵලතාවයට සෘජුවම බලපායි.

**වර්තමාන සහ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්**

**පතල් කැණීම සහ මිහිතුල සංවර්ධනය සහ ගවේෂණය**

නව ඉල්ලම් සොයා ගැනීම සඳහා දියමන්ති Diamond විදුම් වැඩ සටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර අඩි 1,132 මට්ටමින් නව ගවේෂණ ව්‍යාපෘතියක් සිදු කෙරෙමින් පවතී

**දෙවැනි ආවාටය කැණීම**

නව ඉංජිනේරුවරුන්ගේ උපදේශන සේවය, අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ නිෂ්පාදන ක්‍රියාවලිය හා මිනිරන් සංචිත නව ක්‍රමවේදයන් යටතේ පුළුල් කරමින් අඩි 1132 මට්ටමේ සිට අඩි 240 ක් පමණ නතර කර ඇති 2 වන පතුවළේ (Second Shaft) සංවර්ධන වැඩ නැවත ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී.

**පතල් උපකරණ**

කැප් ලාම්පු, විදුම් කටු වැනි පතල් කැණීමේ උපකරණ ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත. විංච් සඳහා භාවිතා කරන කේබල, jack hammer විදුම් යන්ත්‍ර සහ අමතර කොටස් ආදිය ද ඉහළ සම්පීඩිත වායු ඉල්ලුමක් සැපයීම සඳහා 1000 CFM නව වායු සම්පීඩක යන්ත්‍රයක් මඟින් සම්පීඩක වායු පද්ධතිය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

**වැඩබිම්**

අඩි 1,132 මට්ටමේ සිට අඩි 2,080 මට්ටමත් මිනිරන් නිෂ්කාශණය කිරීමේ නව වැඩපලවල් ආරම්භ කර ඇත. එසේම සිරස් ධාවකය (horizontal drive) අඩි 2080 මට්ටමින් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.

**අගය එකතු කිරීම ( Froth flotation plant)**

වර්තමානයේ අගය වැඩි කිරීමේ ව්‍යාපෘතීන් සඳහා ලෝක වෙළෙඳපොලේ කහටගහ මිනිරන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, එවන් අගය එකතු කිරීමේ වැඩසටහනක් ලෙස පිරිසැකසුම් යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට සූදානම් කරමින් පවතී.

## 18.3 අනාගත සැලැසුම් - 2024

- මෙම වසරේ සාමාන්‍ය නිෂ්පාදන ඉලක්කය මසකට මෙ. ටො. 65-70 වන අතර එය මසකට මෙ. ටො. 75-80 දක්වා ගෙන ඒමට තවදුරටත් සැලසුම් කර ඇත.
- නව ගැනුම්කරුවන් සොයා බලා අපේක්ෂිත ආදායම වැඩිකර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

# 19

# ජාතික කඩදාසි සමාගම (NPCL)

## 19.1 හැඳින්වීම

ආරම්භයේ දී පැවති ජාතික කඩදාසි සංස්ථාව පසුව 1982 අංක: 17 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව සී/ස ජාතික කඩදාසි සමාගම වශයෙන් සංස්ථාපනය වී ඇති අතර, මේ වන විට 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

වාලච්චේන කඩදාසි කම්හල හා ඇඹිලිපිටිය කඩදාසි කම්හල සී/ස ජාතික කඩදාසි සමාගම යටතේ පවතී.

### කාර්ය සාධනය

- 2014 දෙසැම්බර් මස සිට නවතා තිබූ වාලච්චේන කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු අංක: අමප/20/0561/224/015 හා 2020.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති අනුමැතිය පරිදි 2020 ජූලි මස සිට සී/ස ජාතික කඩදාසි සමාගම විසින් නැවත ආරම්භ කර ඇත.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම (අක්කර 111 රූඩ් 02 පර්චස් 33ක) දීර්ඝ කාලීන බදු පදනම මත වසර 30ක කාල සීමාවක් සඳහා සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දීමට අංක: අමප/21/1015/320/032 සහ 2021.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2021.10.13 දින සිට වසර 30ක කාල සීමාවක් සඳහා ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම් කොටසට අදාළව දීර්ඝ කාලීන බදු ඔප්පු සකස්කර සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දී ඇත.

- 2012 වර්ෂයේ සිට නවතා දමා තිබූ ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සී/ස ජාතික කඩදාසි සමාගම හා ආයෝජක සමාගම වන KSPA Embilipitiya Paper Mills (Pvt) Ltd අතර ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් වසර 30ක කාල සීමාවකට අදාළ ගිවිසුම 2022.03.09 දින අත්සන් කර ඇත. කම්හලෙහි විසන්ධි කර ඇති විදුලි සැපයුම නැවත ලබා දීමෙන් පසුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය.

- වර්තමානයේ සී/ස ජාතික කඩදාසි සමාගම Craft Paper, Manila Papers, Cover Paper සහ Writing Paper නිෂ්පාදනය කරමින් වඩා හොඳ කාර්ය සාධනයක් සිදු කරයි. තවද ඇසුරුම් කර්මාන්ත සඳහා මුද්‍රණ කඩදාසි සහ එතීමේ කඩදාසි (55gsm - 100gsm) නිෂ්පාදනය කරනු ලබයි.

**සම නිෂ්පාදන අලුතින් හඳුන්වා දෙන ලදී.**

- අභ්‍යාස පොත්
- CR පොත්
- Foolscap
- Ruled Sheets
- පිරිකර

## 19.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදනය හා උපයන ලද ආදායම**

| මාසය | නිෂ්පාදනය (මෙ.ටො.) | ආදායම (රු.මි.) |
|---|---|---|
| ජනවාරි | 225.00 | 49.05 |
| පෙබරවාරි | 149.30 | 40.32 |
| මාර්තු | 203.90 | 31.85 |
| අප්‍රේල් | 126.68 | 25.56 |
| මැයි | 129.43 | 30.10 |
| ජුනි | 104.48 | 29.82 |
| ජූලි | 193.48 | 34.92 |
| අගෝස්තු | 129.00 | 40.25 |
| සැප්තැම්බර් | 185.40 | 39.90 |
| **එකතුව** | **1446.67** | **321.77** |

*මූලාශ්‍රය : ජාතික කඩදාසි සමාගම*

**ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම මගින් ලැබෙන ප්‍රතිලාභ**

- ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල : රු.බිලියන 3.5කි.

- සිදු කිරීමට අපේක්ෂිත දෛනික කඩදාසි නිෂ්පාදනය (පල්ප් මත පදනම් වූ කඩදාසි) : මෙ.ටොන් 250 කි.

- සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලැබෙන වාර්ෂික පිරිවැටුම (Annual Turnover) පහත පරිදි ගණනය කරනු ලබයි.
  වාර්ෂිකව සිදු කරන නිෂ්පාදන X 3%
  (Transfer Price X 3%)

- සී/ස ජාතික කඩදාසි සමාගමේ ප්‍රධාන කාර්යාලය සහ වාලච්චේන කඩදාසි කම්හලෙහි කාර්යාලයේ යටිතල පහසුකම් වැඩිකිරීම.

## 19.3 අනාගත සැලැසුම් - 2024

- වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදන යන්ත්‍ර (Paper Machine & Board Machine) අළුත්වැඩියා කර මාසික කඩදාසි නිෂ්පාදනය වැඩි කිරීම.

- වාලච්චේන කඩදාසි කම්හලෙහි වහලය මත සූර්ය පැනල පද්ධතියක් (Solar Power System) ස්ථාපිත කිරීම.

- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ ඒකාබද්ධව එරාවූර් කර්මාන්තපුරය සඳහා පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය සිදු කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ වාලච්චේන කඩදාසි කම්හල් පරිශ්‍රයෙහි විවිධාංගීකරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.

- ප්‍රධාන කාර්යාලයේ සහ වාලච්චේන කඩදාසි කම්හලේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

- රජය හරහා වාලච්චේන කඩදාසි කම්හල සඳහා දේශීය හෝ විදේශීය ආයෝජකයින් සඳහා පහසුකම් සැපයීම.

- ණය ගැතියන් සහ වගකීම් නිරවුල් කිරීමට කටයුතු කිරීම.

# 20

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් (LMSL)

## 20.1 හැඳින්වීම

බර ඛනිජවැලි කැනීම් හා පිරිසැකසුම් කිරීම සඳහා ලංකා ඛනිජවැලි සංස්ථාව 1957 වර්ෂයේදී පිහිටුවන ලදී. මෙම සංස්ථාව 1992 වර්ෂයේදී පූර්ණ රජය සතු සීමාසහිත සමාගමක් බවට පරිවර්තනය කරන ලද අතර "ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්" යන නමින් හඳුන්වනු ලැබිණි.

### කාර්යභාරය

- දළ වැලි කැණීම පිරිසැකසීම සහ භෞතික ගුණත්වයන් අනුව ඉල්මනයිට රූටයිල්, සර්කෝන් ගානට් මොනසයිට්,කෘෂට් සර්කෝන්, හයි ටයි ඉල්මනයිට් යනාදී වශයෙන් බර ඛනිජ වැලි වෙන් කිරිම.
- ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම් මඟින් බර ඛනිජ වැලි අපනයනය කිරීම.
- නව බර ඛනිජ වැලි නිධි හඳුනා ගැනීම සහ ගවේශනය කිරීම.
- එම නිධි වල පවතින බර ඛනිජ වැලි ඉවත්කර ගැනීම සඳහා වන මූලික පාරිසරික අධ්‍යයනයන් හෝ පාරිසරික බලපෑම අධ්‍යනයක් සිදු කිරීම.
- එසේ හඳුනාගන්නා බර ඛනිජ වැලි නිධි වල ආර්ථිකමය ශක්‍යතාවය අධ්‍යනය කිරීම.
- ආයතනය සතු බර ඛනිජ වැලි නිධි ප්‍රමාණය පුළුල් කරගැනීමට කටයුතු කිරීම.

## 20.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### නිෂ්පාදනය

| නිෂ්පාදන අයිතමය | නිෂ්පාදනය මෙ.ටො |
|---|---|
| ඉල්මනයිට් | 35,026.50 |
| නන් මැග්නටික් හෙවි මිනරල් කොන්සන්ටේට් | 19,642.10 |
| ෆයිනල් ටේලින්ස් ලොට් 02 | 7,800.00 |
| පහළ ශ්‍රේණියේ සර්කෝන් කෘඩ් | 7,798.60 |
| හයිඩ්‍රොසයිස් ෆයින්ස | 2,734.40 |
| රූටයිල් | 1,727.00 |
| හයි ටයි ඉල්මනයිට් | 1,605.00 |
| සර්කෝන් | 355.24 |
| ස්ක්‍රීන් ඕවර්සයිස් කොන්සන්ටේට් | 253.70 |
| මැග්නටයිට් | 230.95 |
| කෘඩ් මොනසයිට් | 13.40 |
| **එකතුව** | **77,186.89** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*




*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

### අලෙවිය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා

| අලෙවි අයිතමය | අලෙවි මෙ.ටො |
|---|---|
| ඉල්මනයිට් | 1.50 |
| කෘඩ් මොනසයිට් | 500.003 |
| සර්කෝන් | 51.20 |
| හයි ටයි ඉල්මනයිට් | 1,520.00 |
| සර්කෝන් කොන්සන්ට්‍රේට් | 30,000.00 |
| **එකතුව** | **32,072.70** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

### නිමිතොගය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා

| නිෂ්පාදන අයිතමය | තොගය මෙ.ටො |
|---|---|
| ඉල්මනයිට් | 69,045.77 |
| රූටයිල් | 2,552.60 |
| හයි ටයි ඉල්මනයිට් | 7,590.95 |
| සර්කෝන් | 746.32 |
| **එකතුව** | **79,935.64** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

| නිෂ්පාදන අයිතමය | තොගය මෙ.ටො |
|---|---|
| කෘඩ් මොනසයිට් | 715.39 |
| පහළ ශ්‍රේණියේ සර්කොන් කෘඩ් | 4,684.80 |
| ෆයිනල් ටේලින්ස් ලොට් 01 | 1,518.60 |
| ෆයිනල් ටේලින්ස් ලොට් 02 | 28,911.60 |
| මැග්නටයිට් | 3,192.11 |
| ස්ක්‍රීන් ඕවසයිස්කොන්සන්ට්‍රේට් | 6,745.33 |
| නන් මැග්නටික් හෙවි කොන්සන්ට්‍රේට් | - |
| හයිඩ්‍රොසයිස්ඩ් ෆයින්ස් | 6,091.53 |
| **එකතුව** | **51,859.19** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

**2023 සැප්තැම්බර් 30 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| විස්තරය | රු. '000 |
|---|---|
| දළ ආදායම | 4,453,400 |
| අඩුකලා : වැට් බදු | (138) |
| ශුද්ධ ආදායම | 4,453,262 |
| අඩුකලා: විකුණුම් පිරිවැය | (457,208) |
| දළ ලාභය | 3,996,054 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 45,894 |
| අඩුකලා : | |
| පරිපාලන වියදම් | (218,708) |
| බෙදා හැරීම් වියදම් | (4,525) |
| වෙනත් මෙහෙයුම් වියදම් (යන්ත්‍රාගාරය හා කොඩ්බෙ) | (433,054) |
| මෙහෙයුම් ලාභය | 3,385,661 |
| මූල්‍ය ආදායම | 1,851,017 |
| ආදායම් බදු වලට පෙර ලාභය/අලාභය | 5,236,678 |
| අඩුකලා : ආදායම් බදු | (1,571,003) |
| ආදායම් බදු අඩු කල පසු ශුද්ධ ලාභය/අලාභය | 3,665,675 |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්*

01. පහත සඳහන් ප්‍රදේශයන්හි ඛනිජවැලි සහිත (ජාලක ඒකක) ගවේෂණය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යංශයෙන් බලපත්‍ර ලබා ගැනීම සඳහා අදාළ ලේඛන භාර දී ඇත.

   * නිලාවේලි - ග්‍රිඩ් 15
   * හම්බන්තොට - ග්‍රිඩ් 02
   * පානම - ග්‍රිඩ් 08
   * කිරින්ද -මාගම - ග්‍රිඩ් 07

   නමුත් GSMB ආයතනය අදාළ බලපත්‍ර මෙතෙක් නිකුත් කර නොමැත.

02. නිලාවේලි සිට වෙම්මලේ මුහුදු තීරයෙන් පිටත ඛනිජ වැලි ජාලක ඒකක 63ක් සඳහා ගවේෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යංශය වෙත අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ඇත. අදාල කාර්ය 100% ක් අවසන් වුවද මෙතෙක් බලපත්‍රය නිකුත් කර නොමැත.

03. පොදුවාකට්ටු ප්‍රදේශයේ කැනීම් කිරීම සඳහා (අක්කර 1250) පාරිසරික බලපත්‍ර ලබා ගැනීම සඳහා EIA වාර්තාව සම්පූර්ණ කර ඇත.

04. ලංකා මිනරල් සැන්ඩ්ස් ආයතනයේ සංවිධාන ව්‍යුහය නැවත සැකසීම හා වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇත.

05. විදුලි පද්ධතිය නවීකරණය කිරීම සඳහා උපදේශක වරයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

06. සූර්ය බල ශක්ති ව්‍යාපෘතිය අනුමැතිය සඳහා ප්‍රසම්පාදන කමිටුවට යොමු කර ඇත.

07. Wet High Intensity Magnetic Separator - WHIMS යන්ත්‍රය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කර ඇත.

08. රසායනාගාර ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු මේ වසරේ සම්පූර්ණ කර ඇති අතර ජාත්‍යන්තර තත්ව සහතිකය ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

09. ඩ්‍රයර් යන්ත්‍රය හා හයිඩ්‍රොසයිසර් යන්ත්‍රය නැවත සවි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

10. පළමු ජංගම යන්ත්‍රාගාරය පුල්මුඩේ යන්ත්‍රාගාර භූමියේ ස්ථාපිත කර ඇත.

11 Zircon Powdering යන්ත්‍රාගාරය සඳහා සැපයුම්කරුවෙක් සොයා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

12. රූටයිල් හා සර්කෝන් බෑග් කිරීමේ යන්ත්‍රය මිලදී ගැනිම සඳහා සැපයුම්කරුවෙකු සොයා ගෙන ඇති අතර එය ප්‍රදානය කිරීමේ අදියරය පවතී.

13. HRIS පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු 50%ක් අවසන් කර ඇත.

14. පුල්මුඩේ යන්ත්‍රාගාරයේ හා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා SLIDA ආයතනය මගින් පරිඝණක පාඨමාලාවක් පවත්වා අවසන් කර ඇත.

15. ආයතනය විසින් සර්කොන් කන්සන්ට්‍රේට් මෙ.ටො. 30,000 ක FOB පදනමින් නැව් ගත කිරීම අවසන් කර ඇත.

16. කෝකිලායි කැනීම් බලපත්‍රය හෙක්ටයාර 1.3 ක් සඳහා වසරක කාල සීමාවක් සඳහා ලැබී ඇත.

## 20.3 අනාගත සැලැසුම් - 2024

01. කෝකිලායි යන්ත්‍රාගාරය රු.මි.7,500 ක ආයෝජන වටිනාකමකින් ආරම්භ කිරීම.

02. පොඩුවකට්ටු ජංගම යන්ත්‍රාගාරය ආරම්භ කිරීම.

03. ඛනිජ වැලි අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය සමග එක්ව අභිලාශය කැඳවීමේ ක්‍රියාවලිය නිම කිරීම.

04. ඛනිජවැලි වල ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

05. ඛනිජ වැලි CIF පදනමින් නැව්ගත කිරීම ආරම්භ කිරීම.

06. යාන්ඔය බංගලාව වානිජ කටයුතු සඳහා යෙදවීම.

07. ඛනිජවැලි අලෙවිය සඳහා Made to order සංකල්පය හඳුන්වා දීම.

08. පුල්මුඩේ යන්ත්‍රාගාරයේ NVQ පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.

# 21

# ලංකා පිඟන් සංස්ථාව (CCC)

## 21.1. හැඳින්වීම

ජාතික කුඩා කර්මාන්ත සංස්ථාව ගඩොල් සහ ටයිල් ඒකකය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය කාර්මික සංස්ථාවේ ගඩොල් සහ ටයිල් ඒකකය 1972 දී ලංකා පිඟන් සංස්ථාවට ස්ථාපිත විය.

1990 ජනවාරි මාසයේ දී සංස්ථාවේ පිඟන් භාණ්ඩ අංශය පෞද්ගලීකරණය කරන ලද අතර සංස්ථාවේ ගඩොල් සහ උළු ඒකකය ''ලංකා පිඟන් සංස්ථාව'' නමින් දිගටම පවත්වාගෙන ගියේය.

මහියංගනය කර්මාන්ත ශාලාව 2023 ජනවාරි සිට නැවත ආරම්භ කර ඇත. නිෂ්පාදනය ආරම්භ කර ඇත. මහියංගනය කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කිරීමත් සමඟ එරගම කර්මාන්ත ශාලාව සමඟ කටයුතු කර ඇත.COVID 19 හි බලපෑම් සහ ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අර්බුදය, රටේ ඉදිකිරීම් කර්මාන්තයට දැඩි ලෙස බලපා ඇත. මෙම කරුණු සමඟ නිවාස හා අනෙකුත් ගොඩනැගිලි ඉදිකිරීමට බාධා එල්ල වී ඇති අතර ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස අඩු වී ඇත. සංස්ථාවේ ප්‍රධාන නිෂ්පාදනය වන්නේ සෙවිලි උළු ය. එබැවින්, මෙම ඉල්ලුම පහත වැටීම සංස්ථාවේ විකුණුම් ආදායමට දැඩි ලෙස බලපා ඇත. දැනට අලෙවියකින් තොරව නිමි භාණ්ඩ තොග විශාල ප්‍රමාණයක් ඇත.

## ගඩොල් හා උළු කර්මන්තශලාවන්හි පිහිටීම් හා ධාරිතාවය

| කර්මාන්තශාලාව | ස්ථානය | දේපළ (අක්කර) | තත්වය |
|---|---|---|---|
| එරගම | අම්පාර | 232 | නිෂ්පාදන කටයුතු සිදු වේ. |
| මහියංගණය | මහියංගණය | 94 | නිෂ්පාදන කටයුතු සිදු වේ. |
| උස්වැව | ඇඹිලිපිටිය | 19 | 2024 වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. |
| යටියන | මාතර | 06 | යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාකොට 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. කම්කරු හිඟය ගැටලුවක් වන අතර අඩු කම්කරුවන් ප්‍රමාණයකින් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතයි. |
| බිංගිරිය | බිංගිරිය | 03 | කම්හලේ යන්ත්‍ර සූත්‍ර ගඩොල් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හැකියාව ඇත. |
| වැළඩ | කුරුණෑගල | 09 | කම්හලේ යන්ත්‍ර සූත්‍ර අනෙකුත් කර්මාන්තශාලා වලට මාරු කර යවා ඇත. |
| ඇලයාපත්තුව | අනුරාධපුරය | 33 | ගඩොල් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හැකියාව ඇත. |
| ඔඩ්ඩුසුඩාන් | මුලතිව් | 13 | කම්හලේ යන්ත්‍ර අලුත්වැඩියාව 90% කින් පමණ අවසන් කර ඇති අතර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු 60% කින් පමණ අවසන් කර ඇත. 2024 වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. |
| බංගදෙණිය | බංගදෙණිය | 07 | ඉඩම පමණි. |
| එකතුව | | 416 | |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

### 21.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට
**නිෂ්පාදනය**

2023 ජනවාරි මාසයේ සිට නිෂ්පාදන කටයුතු ක්‍රියාත්මක වන්නේ මහියංගනය සහ එරගම කර්මාන්තශාලා පමණි.

**ගඩොල් හා උළු නිෂ්පාදනය**

| මාසය | එරගම නිශ්පාදන ඒකක ගණන 2023 | මහියනංගණය නිශ්පාදන ඒකක ගණන 2023 |
|---|---|---|
| ජනවාරි | 107488 | 3652 |
| පෙබරවාරි | 101094 | _ |
| මාර්තු | 81956 | 16085 |
| අප්‍රේල් | 15127 | _ |
| මැයි | 35093 | 7 |
| ජූනි | 80866 | 12323 |
| ජූලි | 65858 | 11937 |
| අගෝස්තු | 46210 | 30442 |
| එකතුව | **533692** | **74446** |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*




*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*




*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

**මහියංගනය - විකුණුම් වටිනාකම (රුපියල්)**

| මාසය | 2022 | 2023 |
|---|---|---|
| ජනවාරි | 100,096.70 | 30,313.30 |
| පෙබරවාරි | 12,952.41 | 125,625.40 |
| මාර්තු | 204,426.00 | 343,921.00 |
| අප්‍රේල් | 168,868.00 | 999,137.63 |
| මැයි | 455,130.20 | 278,210.45 |
| ජුනි | 354,893.50 | 1,065,086.65 |
| ජුලි | 0 | 651,383.24 |
| අගෝස්තු | 0 | 835,401.02 |
| එකතුව | **1,296,366.81** | **4,329,078.69** |

***මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව***

එරගම කර්මාන්තශාලාවේ නිෂ්පාදනයේ මුළු ඒකක ඒකක ගණන 533692 කි. ජනවාරි සිට මාර්තු දක්වා ඉහල නිෂ්පාදනයක් සිදු වූ අතර එයට සාපේක්ෂව අප්‍රේල් මැයි මාසයන්හි නිෂ්පාදනය අඩුවිය. අප්‍රේල් සිට ජුනි මාසය දක්වා නැවතත් නිෂ්පාදන ප්‍රමාණයේ ක්‍රමික ඉහල යැමක්ද ජුනි මාසයේ සිට ක්‍රමයෙන් අගෝස්තු මාසය දක්වා නිෂ්පාදන ඒකක වල අඩුවීමක්ද දක්නට ලැබේ.

2023 ජනවාරි සිට අගෝස්තු මස දක්වා මුළු ඒකක 74446 ක් මහියංගනය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කර ඇත .2023 අගෝස්තු මස දක්වා මහියංගනය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනයේ වැඩි වීමක් තිබූ අතර එය අගෝස්තු මාසයේදී ඒකක 30000 කට වඩා වැඩි නිෂ්පාදනයකි.

## සංස්ථාවේ කාර්‍යසාධනය

කාර්‍යසාධන දර්ශකය: නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් නිෂ්පාදනවල විවිධත්වය වැඩි කිරීමට කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස "ඉන්ටර්ලොක් ගඩොල්" නිෂ්පාදනය හඳුන්වා දී ඇත.

2023 ජනවාරි මාසයේදී මහියංගනය කම්හල නැවත විවෘත කිරීමත් සමඟ මෙම "ඉන්ටර්ලොක් ගඩොල්" නව නිෂ්පාදනය හඳුන්වා දීමද සිදුවිය.

ඒ අනුව මහියංගනය කම්හල 2023 ජනවාරි මාසයේදී ආරම්භ කල අතර නැවත ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ නිෂ්පාදන ඒකක සංඛ්‍යාව සහ එමඟින් විකුණුම් ආදායම වැඩි කිරීමයි.

**එරගම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන පිරිවැය**

| කර්මාන්ත ශාලාව | මාසය | නිෂ්පාදන පිරිවැය රු. 2022 | නිෂ්පාදන පිරිවැය රු. 2023 |
|---|---|---|---|
| එරගම | ජනවාරි | 3,009,042.00 | 3,882,816.00 |
| | පෙබරවාරි | 2,680,626.00 | 3,588,574.00 |
| | මාර්තු | 3,082,630.00 | 3,219,445.00 |
| | අප්‍රේල් | 2,760,518.00 | 1,201,837.00 |
| | මැයි | 3,657,262.00 | 2,342,138.00 |
| | ජුනි | 4,002,898.00 | 2,714,604.00 |
| එකතුව | | **19,192,976.00** | **16,949,414.00** |

***මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව***




***මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව***

වත්මන් වර්ෂයේ මුල් මාස 06 ට සාපේක්ෂව 2022 වසරේ නිෂ්පාදන පිරිවැය සැලකිල්ලට ගත් කල එය රු. 2,243,562.00 අඩු වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 11.69% කි. පසුගිය වසරේ මහියංගනය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනයක් සිදුවී නොමැත.

## 21.3 අනාගත සැලසුම් - 2024

ලංකා පිඟන් සංස්ථාව 2012 වර්ශයේ සිට ප්‍රතිව්‍යුහගත කිරීමට ලංකා රජය විසින් තීරණය කර ඇත. මෙම තත්වය මත සංස්ථාවට නව නිශ්පාදන ක්‍රියාමාර්ග ගත නොහැකිය. එමනිසා ආයතනය වර්තමාන නිශ්පාදන ක්‍රියාපිළිවෙතම ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වේ.

# 22

# කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

## 22.1 හැඳින්වීම

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) යනු 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ හා සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් 01 දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. කාර්මික තාක්ෂණ ආයතනය 1955 අංක 15 දරණ පාර්ලිමේන්තු පනත (CISIR පනත) යටතේ රටේ කාර්මික සංවර්ධනයට සහාය වීම සඳහා 1955 දී පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තිකයා වේ. කාර්මික තාක්ෂණ ආයතනය රජය සතු රටේ ප්‍රමුඛතම සහ විශාලතම විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන සහ සේවා සංවිධානය වන අතර එය බහු විද්‍යාත්මක කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. තවද කාර්මික තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ පිහිටි දකුණේ තිරසාර සංවර්ධනය සහ විද්‍යා හා තාක්ෂණ කොමිසමේ (COMSATS) විශිෂ්ටතා මධ්‍යස්ථානයද වේ.

ආයතනයේ මූලික කර්තව්‍ය වන්නේ පර්යේෂණ සහ සංවර්ධන, උපදේශන, තාක්ෂණ හුවමාරුව, පුහුණුව, පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවා සැපයීම හරහා කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. කාර්මික තාක්ෂණ ආයතනයේ කලමනාකරණකාරිත්වය ජාතික තත්ත්ව ප්‍රතිපත්තියට අනුකූලව සේවාලාභීන්ට වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව උසස් සේවාවන් සපයමින් පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවා සඳහා ප්‍රවීණතා පරීක්ෂණ (PT) සපයන්නෙකු ලෙස (ISO 17025:2017 සහ ISO 17043:2010) රසායනාගාර තත්ත්ව

කළමනාකරණ පද්ධතිය සහ පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ තොරතුරු සඳහා (ISO 9001:2015) තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය පවත්වාගෙන යාමට කැපවී සිටී. සේවා මධ්‍යස්ථානය, සේවාලාභීන්ට ඉහළම වෘත්තීය ප්‍රමිතීන්ගෙන් යුත් සේවාවන් සපයයි.

කාර්මික තාක්ෂණ ආයතනය තාක්ෂණික අංශ, පර්යේෂණ සහ සංවර්ධන සහ තාක්ෂණික සේවා ලෙස කාණ්ඩ ගත කරන ලදී .

පර්යේෂණ හා සංවර්ධන අංශය, ශාකසාර තාක්‍ෂණය, ආහාර තාක්‍ෂණය,ජෛව තාක්‍ෂණය,පරිසර තාක්‍ෂණය,ද්‍රව්‍ය තාක්‍ෂණය සහ තාක්‍ෂණික ව්‍යවසායක සංවර්ධන, නිෂ්පාදන සහ සැපයුම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වැනි අංශවලින් සමන්විත වේ.

පර්යේෂණ සහ සංවර්ධන අංශය ඉල්ලුම මත පදනම් වූ, ජාතික වැදගත්කමකින් යුත් බහුවිධ පර්යේෂණ සහ සංවර්ධන නවෝත්පාදනයන් පෝෂණය කිරීම,තාක්ෂණ හුවමාරු කිරීම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSME) සහ ආරම්භක කාර්මික සංවර්ධනය, අපනයන වර්ධනයට සහ දේශීය අගය එකතු කිරීම සඳහා මගපෙන්වීමට සහය වේ.

තාක්ෂණික සේවා අංශය රසායනික හා ක්ෂුද්‍රජීවී, අවශේෂ විශ්ලේෂණ, කාර්මික මිනුම්, විද්‍යුත් තාක්ෂණ, ද්‍රව්‍ය තාක්ෂණ, ඖෂධ, ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් පරීක්ෂණ වැනි රසායනාගාරයවලින් සමන්විත වේ.

## 22.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### භෞතික ප්‍රගතිය

පර්යේෂණ සහ සංවර්ධන (R&D) ව්‍යාපෘති 43 ක් පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම පර්යේෂණ සහ සංවර්ධන මුලපිරීම් නව නිෂ්පාදන,ක්‍රියාවලි සහ ක්‍රමවේද සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ව්‍යාපෘති ඉලක්ක කරනුයේ ආනයන ආදේශනය, අපනයන ව්‍යාප්තිය, දේශීය අගය එකතු කිරීම, ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ නව කර්මාන්ත සංවර්ධනයයි. මෙම ව්‍යාපෘති මගින් නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ ක්‍රම 50 කට අධික ප්‍රමාණයක් සංවර්ධනය කර ඇත.

2023 වර්ෂයේ දී නව ව්‍යාපාර දියත් කිරීමට MSMEs සවිබල ගන්වමින් සහ පවතින ව්‍යාපාරවල හැකියාවන් සහ විෂය පථය පුළුල් කරමින් විවිධ කර්මාන්ත දියුණු කිරීම සඳහා තාක්ෂණයන් 40 ක් සාර්ථකව හුවමාරු කරන ලදී. මෙම තාක්ෂණයන් ආහාර පාන වර්ග, ඖෂධ පැළෑටි මත පදනම් වූ රූපලාවන්‍ය නිෂ්පාදන සහ අතිරේක සහ ගෘහ ආරක්ෂණ නිෂ්පාදන ඇතුළු පුළුල් පරාසයක අංශයන් වෙත හුවමාරු විය. කර්මාන්ත වෙත මාරු කරන ලද ප්‍රධාන ආහාර තාක්ෂණයන් අතරට අඹ ඇතුළු පලතුරු විජලනය කිරීම, පල්ප් සැකසීම, පොල් සීනි, කිතුල් ශක්ති ජනක බීම සහ මාළු ඇඹුල්තියල් සහ අපනයන කර්මාන්ත සඳහා පසු අස්වනු අපනයන කිරීම සඳහා අනුගමන කළයුතු ක්‍රියාමාර්ග (export protocol) ලබා දීම ඇතුළත් වේ. ද්‍රව්‍ය මත පදනම් වූ තාක්‍ෂණ හුවමාරු තුල තාක්ෂණයන්ට සන්නායක මිනිරන් සහ ග්‍රැෆීන් ඔක්සයිඩ් ද ඇතුළත් වේ. ITI ආයතනය විසින් සංවර්ධනය කරන ලද දේශීයව වගා කරන ලද අර්තාපල් වලින් ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් සෑදීමේ තාක්ෂණය බණ්ඩාරවෙල ප්‍රදේශයේ අර්තාපල් වගාකරුවන්ගේ සංගමයක් හරහා සාර්ථකව වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසයකයින් සඳහා තාක්ෂණික සහාය ලබා දීම සඳහා විදාතා සහ ග්‍රාමීය ආධාරක මුලපිරීම් ඇතුළු වැඩසටහන් 500කට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී. තවද, කාර්මික කුසලතා සහ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා විවිධ කර්මාන්තවලින් 250 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

කාර්මික තාක්‍ෂණ ආයතනයෙහි තාක්ෂණික සේවා අංශය, මූලික වශයෙන් ප්‍රතීතනය ලත් රසායනාගාර භාවිතා කරමින් අපනයනය ඉලක්ක කරගත් අංශ ඇතුළු කර්මාන්ත සඳහා පරීක්ෂණ සහ ක්‍රමාංකන වාර්තා

13,000 ක් සාර්ථකව නිකුත් කර ඇත. 2023 වර්ෂයේදී කාර්මික තාක්ෂණ ආයතනය සහ රාජ්‍ය ආයතනය විසින් අවට වායු තත්ත්ව තක්සේරුව, සමුච්චිත විමෝචනය අධීක්ෂණය, වායු දූෂණ පාලනය සහ අවම කිරීම, අපජලය පිරිපහදු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ජල තත්ත්ව අධ්‍යයනය, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය සහ මූලික සමීක්ෂණ ඇතුළු පුළුල් පරාසයක පාරිසරික තාක්‍ෂණ විෂයයන් හරහා උපදේශන සේවා 700 ක් සිදු කරන ලදී. මීට අමතරව, ශබ්ද සහ කම්පන තක්සේරු අධ්‍යයනය, අවම කිරීමේ උපාය මාර්ග සහ අනාවැකි විශ්ලේෂණ සම්බන්ධයෙන් උපදේශන සේවා සිදු කරන ලදී. රට තුල විදුලිබල හා බලශක්ති, මහාමාර්ග, කාර්මික මෙහෙයුම් සහ නාවික කර්මාන්තය ඇතුළු පුළුල් පරාසයක අංශ සඳහා මෙම සේවාවන් ලබා ගත හැකි විය .2023 වර්ෂයේදී, ITI විසින් විවිධ විෂයයන් යටතේ කොන්ත්‍රාත් ව්‍යාපෘති 70 ක් සාර්ථකව සිදු කරන ලදී.

පර්යේෂණ සහ සංවර්ධන (R&D) සඳහා ජාත්‍යන්තර අරමුදල් හවුල්කාරිත්වය GIZ සහ IFC වැනි ආයතන සමඟ සුරක්ෂිත විය. මීට අමතරව, තිරසාර සෞඛ්‍ය ආහාර සඳහා පලතුරු සහ එළවළු (FRESH) මුලපිරීම හා සම්බන්ධ පර්යේෂණ සේවා සඳහා පහසුකම් සැලසීම සඳහා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලය සමඟ නව විදේශීය සහයෝගීතාවයක් ස්ථාපිත කරන ලදී.

පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ තොරතුරු සේවා මධ්‍යස්ථානය සඳහා ISO 9001:2017 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය පවත්වාගෙන යාම සඳහා ආයතනය අඛණ්ඩව කරන ලදී. ITI හි දැනට පවතින රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය, ISO/IEC 17025:2017 සහ ISO 17043:2010 ප්‍රවීණතා පරීක්ෂණ (PT) සපයන්නන්,තාක්ෂණික සේවා අංශය සඳහා පවත්වාගෙන යනු ලබයි. ආසන්න වශයෙන් නව පරීක්ෂණ ප්‍රමිතීන් 40ක් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතනය කරන ලදී. කාර්මික මිනුම් විද්‍යාගාරය අඛණ්ඩව ISO/IEC17025:2017 ස්කන්ධය, මානයන්, පරිමාව, විද්‍යුත්, බලය, පීඩනය සහ උෂ්ණත්ව මිනුම් සඳහා රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ ජාතික මිනුම් විද්‍යායතනය,තායිලන්තය, KRISS, දකුණු කොරියාව සහ PTB, ජර්මනිය, NIST, USA, Danak, Danmark, හරහා SI ඒකක සඳහා මිනුම්වලට අනුකූලව සොයා ගැනීමේ හැකියාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

2023 දී, පර්යේෂණ ලිපි 20 ක් ඉහළ බලපෑමක් ඇති විනිසුරු සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද අතර දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ක්‍රියාපටිපාටිවල සාරාංශ 30 ක් ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අමතරව පේටන්ට් බලපත්‍ර තුනක් ලබාගෙන ඇති අතර විද්‍යාත්මක සම්මාන 03ක් එම කාලසීමාව තුළදී ලැබිණි. 2023 මාර්තු 23 වැනි දින BICOST හිදී 2017 සහ 2021 අතර කාලයක් සඳහා NASTEC විසින් S&T ආයතන අතර හොඳම කාර්ය සාධන සම්මානය කාර්මික තාක්ෂණ ආයතනය විසින් ලබා ගන්නා ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය, ඇසුරුම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ රසායනාගාරය විවෘත කිරීම, සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර මෙම පහසුකම සඳහා යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා වෙළඳ ආශ්‍රිත සහකාර ව්‍යාපෘතිය යටතේ UNIDO වෙතින් සහය ලැබිණි. මීට අමතරව, වෙනම උත්සවයකදී, Pharmaceutical Testing Laboratory, Petroleum and Lubricant Testing Laboratory සහ S&T ව්‍යාපාර මධ්‍යස්ථානය විධිමත් ලෙස 2023 වර්ෂයේදී විවෘත ලදී. ආහාර ආශ්‍රිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපායකයන්ගේ වැඩමුළුව, ඇසුරුම්කරණය වැඩි දියුණු කිරීම, ලේබල් කිරීමේ භාවිතය සඳහා රටපුරා වැඩමුළු මාලාවක් පැවැත්වීමට UNIDO සහ BESPA ව්‍යාපෘතිය සමඟ ITI හවුල් විය.

## මූල්‍ය ප්‍රගතිය

වගුව 1 මගින් 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය සඳහා ITI හි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. මෙම කාලසීමාව තුළ ITI විසින් සම්මත සේවා, උපදේශන සේවා, තාක්ෂණ හුවමාරු සහ කොන්ත්‍රාත් ව්‍යාපෘති වැනි විවිධ ප්‍රභාවයන්ගෙන් උපයාගත් මුළු ආදායම රුපියල් මිලියන 290.67ක් විය. පුහුණු හ අනෙකුත් ප්‍රභාවයන් (රූප 1 සහ 2) මගින් දක්වා ඇත. මෙම කාලය තුළ ආයතනය රුපියල් මිලියන 115.6 ක ශුද්ධ හිගයක් ඇති කළේය. 2023 සම්පූර්ණ වසර දෙස බලන විට මුළු ආදායම රුපියල් මිලියන 432.5 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම අපේක්ෂිත ආදායමේ වැඩිවීම ආයතනයේ මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරේ ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 28 කට සාපේක්ෂව රුපියල් මිලියන 180 ක ශුද්ධ අතිරික්තයක් ලැබී තිබුණි.

**වගුව 1 - 2017 සිට 2023 අගෝස්තු දක්වා ජනනය කරන ලද ආදායම විශ්ලේෂණය කිරීම**

| Income Source | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023(upto Aug,2023) | 2023(Annualised) |
|---|---|---|---|---|---|---|---|---|
| | Rs Mn | Rs Mn | Rs Mn | Rs Mn | Rs Mn | Rs Mn | Rs Mn | Rs Mn |
| Standard Services(SS) | 178.79 | 196.60 | 172.05 | 147.92 | 171.35 | 180.02 | 177.81 | 266.72 |
| Consultancy Services(CS) | 20.71 | 22.80 | 28.53 | 25.40 | 29.54 | 39.16 | 30.01 | 45.02 |
| Technology Transfer(TT) | 2.77 | 3.20 | 7.51 | 11.45 | 13.09 | 23.16 | 1.49 | 2.24 |
| Contract Projects(CP) | 26.08 | 29.30 | 56.86 | 18.60 | 15.84 | 24.47 | 16.67 | 25.01 |
| Customised Services(CTS) | 18.83 | 17.30 | 19.71 | 16.39 | 25.26 | 22.93 | 17.43 | 26.15 |
| Training Programme(TR) | 13.80 | 19.90 | 18.10 | 10.72 | 4.52 | 18.25 | 11.73 | 17.60 |
| Hand Sanitizer Unit | | | | 27.86 | 61.24 | 0.07 | | - |
| Other Income | 43.24 | 34.70 | 31.94 | 25.85 | 26.58 | 60.51 | 35.53 | 49.53 |
| **Oparating Income** | **304.22** | **323.80** | **334.70** | **284.19** | **347.42** | **368.57** | **290.67** | **432.24** |
| Government Recurrent Grants | 240.00 | 240.00 | 250.00 | 270.33 | 279.80 | 290.00 | 260.00 | 400.00 |
| **Total Income** | **544.22** | **563.80** | **584.70** | **554.52** | **627.22** | **658.57** | **550.67** | **832.24** |
| **Operating Expenses** | 546.78 | 551.66 | 588.70 | 553.90 | 579.61 | 631.06 | 435.00 | 652.50 |
| **Total Expenses with Depreciation** | 714.07 | 744.43 | 813.23 | 754.10 | 824.59 | 841.40 | 556.20 | 834.30 |
| **Surplus/(Defecit) without Depreciation** | (2.56) | 12.14 | (4.00) | 0.62 | 47.61 | 27.51 | 115.67 | 179.74 |
| **Government Capital Grants** | **17.00** | **303.00** | **121.00** | **105.00** | **53.97** | **61.00** | - | - |




රූපය 1

*මූලාශ්‍රය: කාර්මික තාක්ෂණ ආයතනය*




| | Standard Services(SS) | Consultancy Services(CS) | Technology Transfer(TT) | Contract Projects(CP) | Customized Services(CTS) | Training Programme(TR) | Hand Sanitizer | Other Income |
|---|---|---|---|---|---|---|---|---|
| 2017 | 178.79 | 20.71 | 2.77 | 26.08 | 18.83 | 13.8 | | 43.24 |
| 2018 | 196.6 | 22.8 | 3.2 | 29.3 | 17.3 | 19.9 | | 34.7 |
| 2019 | 172.05 | 28.53 | 7.51 | 56.86 | 19.71 | 18.1 | | 31.94 |
| 2020 | 147.92 | 25.4 | 11.45 | 18.6 | 16.39 | 10.72 | 27.86 | 25.85 |
| 2021 | 171.35 | 29.54 | 13.09 | 15.84 | 25.26 | 4.52 | 61.24 | 26.58 |
| 2022 | 180.02 | 39.16 | 23.16 | 24.47 | 22.93 | 18.25 | 0.07 | 60.51 |
| 2023(upto Aug) | 177.81 | 30.01 | 1.49 | 16.67 | 17.43 | 11.73 | - | 35.53 |

2017 2018 2019 2020 2021 2022 2023(upto Aug)

රූපය 2

*මූලාශ්‍රය: කාර්මික තාක්ෂණ ආයතනය*

## 22.3 අනාගත සැලැසුම් - 2024

1. ව්‍යාපාර විවිධාංගීකරණය: සමස්ත මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා ආයතනයේ ආදායම් ප්‍රභාවයන් සහ නව ආදායම් අවස්ථා විවිධාංගීකරණය කිරීම

- මාලදිවයින වෙත තාක්ෂණ සේවා සහ ක්‍රමාංකන සේවා ව්‍යාප්ත කිරීම සඳහා තාක්ෂණ සේවා අංශය විවිධාංගීකරණය කිරීම.

- විෂ සහිත අපවිත්‍ර ද්‍රව්‍ය (ඛනිජ තෙල් සංතෘප්ත හයිඩ්‍රොකාබන- MOSH, ඛනිජ තෙල් ඇරෝමැටික හයිඩ්‍රොකාබන - MOAH, ඩයොක්සින්, furans), සමස්ථානික තනුක ස්කන්ධ වර්ණාවලීක්ෂය/අයිඩීඑම්එස් මගින් ලෝහ විශේෂණය (මැට්‍රොපොටෝමෙට්‍රි-අයිඩීඑම්එස්) ඇතුළුව පරීක්ෂණ සේවා පරාමිති පරාසය පුළුල් කිරීම. පියාසර කරන වේලාව (MALDI-TOF) සංකීර්ණ මිනුම් සඳහා ස්කන්ධ වර්ණාවලීක්ෂය (MS), කාබනික පොහොරවල ක්ෂුද්‍ර ප්ලාස්ටික්, විලවුන් සඳහා සමේ සංවේදීතා පරීක්ෂණය, කල් තබා ගන්නා අභියෝගතා පරීක්ෂණය,( Heat stress and Building acoustics) සහ ගොඩනැගිලි ධ්වනි, දිය යට ධ්වනි මිනුම්, විද්‍යුත් චුම්භක මිනුම්, වායු

ප්‍රවේගය, ප්ලාස්ටික් උපකරණ ක්‍රමාංකනය, වාර්ප් සහ ඉහළ නිරවද්‍යතා බහුමාපක ක්‍රමාංකන, ඩිජිටල් ක්‍රමාංකන සහතික, ඇසුරුම් ද්‍රව්‍යවල ආයු කාලය, ක්ෂුද්‍ර ව්‍යුහය විශ්ලේෂණය, Asphalt පරීක්ෂාව, සම්පීඩිත ස්වාභාවික වායු සහ අදාළ එන්ජින් ඔයිල් පරීක්ෂාව, දේශගුණික විපර්යාස ආශ්‍රිත කාබන් පියසටහන් ගණනය/හරිතාගාර වායු (GHG) විමෝචන ඇස්තමේන්තු, පාරිසරික විවිධ කර්මාන්ත/විශේෂිත අංශ හරහා පුළුල් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පරීක්ෂා කිරීම සහ අනුකූල වීම.

- රසායනික reference රසායනාගාරයක් පිහිටුවීම.
- නිෂ්පාදන සහතිකය -ISO 17065 - කුළුබඩු අංශය සඳහා නිෂ්පාදන සහතිකය ලබා දීම.
- ISO17025:2017 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතියේ විෂය පථය පුළුල් කිරීම
- ප්‍රවීණතා පරීක්ෂණ (PT) සපයන්නෙකු ලෙස ISO 17043:2010 ප්‍රතීතනයේ විෂය පථය පුළුල් කිරීම.

2. ආරම්භකයින්ට සහාය වීම සඳහා නිෂ්පාදන/ක්‍රියාවලි ඉන්කියුබේටර් සහ ඇක්සලරේටර් ස්ථාපිත කිරීම, ආහාර හා ශාකසාර තාක්ෂණයන් පුළුල් කිරීම සඳහා Pilot plant පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සහ කොන්ත්‍රාත් නිෂ්පාදන සඳහා වන චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ජෛව තාක්ෂණ රසායනාගාර පහසුකමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම.

3. දිගුකාලීන/උසස් තාක්‍ෂණික පර්යේෂණ පර්යත්නයන් සඳහා කැප වූ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ වේදිකාවල ඊළඟ දිගු කාලින ලෙස උසස් පර්යේෂණ මධ්‍යස්ථානය ආරම්භ කිරීම, ජාත්‍යන්තර ප්‍රදාන ලබා ගැනීම සහ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

4. ITI අනුබද්ධ පශ්චාත් උපාධි පිරිනැමීමේ ආයතනයක් පිහිටුවීම.

5. ආයතනය UNIDO, FAO, GIZ, සහ USAID වැනි ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන හරහා බාහිර අරමුදල් සහ උපාය මාර්ගික හවුල්කාරිත්වයන් සඳහා පරීක්ෂණ, ක්‍රමාංකන සහ පර්යේෂණ සහ සංවර්ධන සේවා පුළුල් කිරීම.

6. S&T ව්‍යාපාර මධ්‍යස්ථානය හරහා ගතික තාක්‍ෂණ හුවමාරු වේදිකාවක් පිහිටුවීම.

7. විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සහ උපදේශන සේවා වැඩි කිරීම.

8. පුනරාවර්තන වියදම් අවම කිරීමට සහ නාස්තිය අවම කිරීමට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීම.

# 23

# සී/ස ලංකා පොස්පේට් සමාගම (LPL)

## 23.1 හැඳින්වීම

එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරාලන අතර තුර අපනයනය සඳහා යොමු වෙමින් විදේශ විනිමය උපයාගැනීමට ලංකා පොස්පේට් සමාගම ක්‍රියාකරනු ලැබේ.

**මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය:**

බහු වාර්ෂික කෘෂි බෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැණීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

## 23.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**මූල්‍ය ප්‍රගතිය**

| | සත්‍ය |
|---|---|
| අලෙවිය (මෙ.ටො.) | 28,320 |
| නිෂ්පාදනය (මෙ.ටො.) | 31,196 |
| ආදායම (රු. මිලියන) | 629.19 |
| බදු වලට පෙර ලාභය 31.07.23 දිනට (රු. මිලියන) | 54.60 |

*මූලාශ්‍රය: ලංකා පොස්පේට් සමාගම*

1. 2023 මැයි මාසය වනවිට බැංකු අයිරාව වූ රු. මිලියන 124ක් පියවීමට හැකි වූ අතර, සියළු සේවක සහ ව්‍යවස්ථාපිත ගෙවීම් නිසිපරිදි ගෙවා දැමීමට ද ආයතනයට හැකි විය.
2. බොහෝ අවස්ථාවල උත්සාහ කළ පරිදි, 2023 අගොස්තු වන විට, විදේශ විනිමය රට තුලට ගෙන්වාගැනීම අරමුණු කරගත් අපනයන වෙළඳාමේ යෙදෙන දේශීය ආයතන 03 ක් සඳහා රොක් පොස්පේට් මෙ.ටො. 7007 ක් අලෙවි කිරීමට වර්තමාන කළමණාකාරිත්වයට හැකි විය. මෙයින් ලද මුළු ආදායම රු. මිලියන 181 ක් වේ.
3. DM Traders විසින් 650MT(HERP) නව අපනයන ඇණවුමක් ලැබී ඇත. නිෂ්පාදන කටයුතු මේ දින වල සිදුකරමින් පවතී. මේ වන විට නිෂ්පාදනය 341.35 MT කි.
4. Dusaru International (Tulip Agro) විසින් ලබාදුන් 2500 MT (HERP) අපනයන ඇණවුමේ නිෂ්පාදන කටයුතු අවසන් කර ඇත. පැටවීම සිදු කිරීමට නියමිතයි.
5. නියමිත ප්‍රමිතියෙන් යුතුව භාණ්ඩ නිෂ්පාදනය නොකිරීම නිසා තොග ආපසු යැවීම නිසා අමතර පිරිවැයක් දැරීමට ආයතනයට සිදු වූ අතර එම නිසා නිෂ්පාදනයේ හා ක්‍රියාවලියේ ගුණාත්මය වැඩිකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

**භාණ්ඩ නිෂ්පාදන හා ක්‍රියාවලියේ ගුණාත්මය වැඩිකිරීම**





7. මුදල් ඉතිරි කරමින් හා විදේශ විනිමය රටතුල ඉතිරි කර ගනිමින් යන්ත්‍රසූත්‍ර සහ අමතර කොටස් දේශීයව හා අභ්‍යන්තරව නිෂ්පාදනය කිරීමට පියවර ගන්නා ලදී.

**යන්ත්‍රසූත්‍ර සහ අමතර කොටස් දේශීයව හා අභ්‍යන්තරව නිෂ්පාදනය කිරීම**





## 23.3 අනාගත සැලසුම් - 2024

- නිමි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා දැනට තිබෙන ගබඩා පහසුකම් ප්‍රමාණවත් වන්නේ මෙ.ටො. 5,000 කට පමණි. ඉලක්කගත අපනයන සහ අගය වැඩි කළ නිෂ්පාදන සඳහා මෙම ප්‍රමාණය මෙ.ටො. 15,000 දක්වා ද අමුද්‍රව්‍ය ගබඩාව මෙ.ටො. 30,000 දක්වා වැඩි කිරීමට කඩිනමින් අවශ්‍ය වී ඇත. මෙය අඛණ්ඩව මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ඉවහල් වනු ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලියට සෘජු දායකත්වයක් සපයන ක්‍රෂර් යන්ත්‍රය මගින් විශාල පාෂාණ කොටස් සම්මත කුඩා කැබලි වලට කැඩීම සිදුකරයි. පසුව මෙම කුඩා පාෂාණ කොටස් ඇඹරුම් යන්ත්‍ර වෙත යොමු කෙරේ. දැනට ස්ථාපිත කර ඇති වසර 40 ක් පමණ පැරණි ක්‍රෂර් යන්ත්‍රය ඉදිරි විශාල මෙහෙයුම් සඳහා ප්‍රයෝජනයට ගැනීම අපහසු වන අතර, අමතර කොටස් සපයාගැනීමද දුෂ්කර වී ඇත. මෙම හේතුව නිසා ක්‍රෂර් යන්ත්‍රය නවීකරණය කිරීමට හෝ යාවත්කාලීන කිරීමට සිදුවනු ඇත. එමගින් ඉදිරි අපනයන ඇණවුම් සහ අගය වැඩිකළ නිපැයුම් සඳහා අවස්ථාවන් උදාවේ.

- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) උපදේශකත්වයෙන් ඉදිරියේදී පුළුල් කෙරෙන ඇඹරුම් සහ ක්‍රෂර් යන්ත්‍රය සඳහා දැනට තිබෙන විදුලි පද්ධතිය ප්‍රමාණවත් ද යන්න පරීක්ෂා කරගැනීමට බලාපොරොත්තු වන අතර, ඉදිරි අවශ්‍යතා සඳහා වෙනස්කිරීම්/ යාවත්කාලීන කිරීම් පිළිබඳව තක්සේරුවක් ලබාගැනීම

- තත්ත්ව පරීක්ෂා කිරීමේ දේශීයව සහ අන්තර්ජාතිකව පිළිගත් තත්ත්ව සහතිකයක් ලබාදීමට වැඩිදියුණු කළ රසායනාගාර පහසුකම් හඳුන්වාදීම.

- ආවරණයක් නොමැතිකමින් වැසි සහ හිරු රශ්මිය ඇති දින වලදී පැටවුම් ක්‍රියාවලිය අඛන්ඩව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. ඒ සඳහා මිළදී ගැනීම් කාර්යයන් ආරම්භ කර ඇත.

- වැඩිදියුණු වන කැණීම් සහ ඇඹරුම් මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට ආයතනය සතු නිෂ්පාදනයට අදාල වාහන අළුත්වැඩියා කිරීමට සිදු වෙයි. වීල් ලෝඩර් සහ ෆෝර්ක් ලිෆ්ට් ඒවා අතර වේ.

- එප්පාවල වැඩබිමෙහි තිබෙන නිෂ්පාදන කාර්ය මණ්ඩල, රියදුරු සහ විධායක මහත්වරුන්ගේ ආයතනික නිල නිවාස බොහොමයක් වසර 25 ක් පමණ පැරණි අබලන් වූ ගොඩනැගිලි වේ. මෙම නිවාස නවීකරණය කිරීමට අවශ්‍ය වී තිබේ. නිෂ්පාදනයට අවශ්‍ය කාර්ය මණ්ඩලය එප්පාවල වැඩබිම තුළ රඳවා තබාගැනීම මෙ මගින් පහසු වනු ඇත.

- දැනට භාවිතාවන ගිණුම් පැකේජය 2003 වසරේදී මිළදීගෙන ස්ථාපිත කර ඇත. එය වසර 20 ක් පමණ පැරණි පැකේජයක් වන අතර මේ වන විට එහි තාක්ෂණික ගැටළු සහ සීමාවන් පැන නැගී ඇත. මෙම හේතුවෙන් වර්තමානයට මෙන්ම අනාගතයට ද ගැලපෙන පරිදි මෙම පැකේජය යාවත්කාලීන කිරීම හෝ අළුතින් පැකේජයක් මිළදීගත යුතුව තිබේ.

# 24

# සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL)

## 24.1 හැඳින්වීම

ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී (මින් ඉදිරියට LAL ලෙස හැඳින්වේ) 1982 දී ශ්‍රී ලංකා රජයේ පූර්ණ හිමිකාරීත්වය දරන සමාගමක් වන ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම සහ ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් ලිමිටඩ් අතර හවුල් ව්‍යාපාර සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

එම සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනයෙන් 41.77% ක පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් වන ලංකා ලේලන්ඩ් සමාගම සතු වන අතර, 27.85% ක කොටස් ප්‍රමාණයක් ඉන්දීය අශෝක් ලේලන්ඩ් සමාගම සතු වෙයි. ඉතිරි කොටස් 30.38 %ක ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ජනතාව සතු වේ. මෙම සමාගම 1983 වසරේ දී කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් වශයෙන් ස්ථාපිත කර ඇත.

දැනට, සමාගමේ ප්‍රධාන ව්‍යාපාරයට Semi-Knocked-Down (SKD) වැසි ආනයනය කිරීම සහ එකලස් කිරීම සහ උපාංග නිපදවීම, අශෝක් ලේලන්ඩ් වර්ගයේ වාහන ආනයනය සහ අලෙවිය, අමතර කොටස්, විදුලි ජනක යන්ත්‍ර සහ කුලියට වාහන සැපයීම ඇතුළත් වේ. වාණිජ වාහන අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම ද සමාගම විසින් සිදු කරයි.

ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම කළමනාකරණය කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ බාහිර විශේෂඥයින්ගේ තීක්ෂණ බුද්ධියෙන් සහ දැනුමෙන් පිරිපුන් සහයෝගයෙන් ශක්තිමත් ආයතනික ඥානය, කුසලතා, දැනුම සහ පළපුරුද්ද සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගිනි. සමාගම රටේ නීතිවලට අනුගත වන පාලන ව්‍යුහයක් ස්ථාපිත කර ඇති අතර ඒවා නියාමන නියෝගවලට අනුකූල වීම සහතික කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාලන ව්‍යුහය නිශ්චිත වගකීම් සඳහා වගකිව යුතු කමිටු වලින් සමන්විත වන අතර සමාගම සඳහා උපාය මාර්ග සහ අනාගත දිශානතිය තීරණය කරයි.

**ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

- වාණිජ වාහන අමතර කොටස් හා විදුලි ජනක යන්ත්‍ර ආනයනය කිරීම සහ අලෙවි කිරීම.
- වාණිජ වාහන දේශීය වශයෙන් එකලස් කිරීම.
- ට්‍රක් රථ සඳහා බවුසර්, බහාලුම් සහ අනෙකුත් වානේ සහ ඇලුමිනියම් බඳ සැකසීම.
- අලින් ප්‍රවාහනය කරන ට්‍රක්රථ, තට්ටු දෙකේ සංචාරක බස්රථ, කැරවෑන්, රේල් බස් වැනි විශේෂ ප්‍රවාහන මාධ්‍යයන් සැපයීම.
- පරණ හා අනතුරුවලට ලක් වූ වාහන අලුත් වැඩියා කිරීම.
- අශෝක් ලේලන්ඩ් වාහන සඳහා වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත් සැපයීම.
- රජයේ හා තෝරාගත් පෞද්ගලික ආයතන සඳහා (ඉපයූ පසු ගෙවීමේ එකගතාව මත) කුලී පදනම අනුව වාහන සැපයීම.
- සමාගම සතුව නවීනතම පහසුකම්වලින් සමන්විත කර්මාන්තශාලාවක් පනාගොඩ ප්‍රදේශයේ පිහිටා ඇති අතර, අලෙවි කාර්යාලය කොළඹ පිහිටා තිබේ.

එමෙන්ම අලෙවිය, සේවා සැපයීම සහ අමතර කොටස් අලෙවිය යන ක්‍රියාකාරකම් ත්‍රිත්වයෙන්ම සමන්විත මධ්‍යස්ථාන දිවයින පුරා අනුරාධපුර, දඹුල්ල, ඇඹිලිපිටිය, යාපනය සහ මහනුවර යන ප්‍රදේශවල පිහිටා තිබේ. අමතර කොටස් අලෙවිසැල්ද, දිවයින පුරා පිහිටා තිබේ.
පාරිභෝගික අවශ්‍යතා සපුරන, බලයලත් සේවා සැපයුම් මධ්‍යස්ථාන විස්සකට අධික සංඛ්‍යාවක් සමාගම සතුව පවතී.

## 24.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- රටේ වත්මන් තත්ත්වය හමුවේ ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම ස්ථාවරව සිටි. ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම කර්මාන්තශාලාව සීමා සහිත ආනයන සහ දේශීය සැපයුම් සහිතව සිය දේශීය උපාංග නිෂ්පාදන සහ වැසි එකලස් කිරීම අඛණ්ඩව සිදු කර ඇත.

- එමෙන්ම, ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම විසින් දින 180 DA නියමයන් මත Semi-Knocked-Down (SKD) කට්ටල ආනයනය කරන ලද අතර කාල සීමාව අවසානයේ ගෙවිය යුතු මුළු බිල්පත් (GIT ඇතුළුව) USD 4.13 කි. එම කාලය තුළ සමාගම වාර්තා කර ඇති රු. බිලියන 2.22 ක ආදායමක් පෙර වසරට සාපේක්ෂව 52.93% ක අඩුවීමකි.

- වාණිජ වාහන අලෙවිය මුළු ආදායමෙන් 72% ක් වූ අතර ඉතිරි 28% ජෙනරේටර් අලෙවිය, අලුත්වැඩියා ආදායම, අමතර කොටස් අලෙවිය, කුලියට ගැනීමේ ආදායම සහ ප්‍රාදේශීය නියෝජිතායතන කොමිෂන් සභාව නියෝජනය කරයි.

- වාහන අලෙවියෙන් ලද ආදායම පසුගිය වසරේ රුපියල් බිලියන 4.71 ක් වූ අතර එය මෙම වසරේ රු. බි. 1.59 දක්වා 61.1% කින් පහත වැටී ඇත. නමුත්, අනෙකුත් ආදායම් සමස්ත පිරිවැටුම සඳහා වැඩි දායකත්වයක් පෙන්නුම් කරන බැවින්, සමස්ත ආදායම සඳහා වාහන අලෙවියේ කොටස පසුගිය වසරේ 87.1% සිට 72% දක්වා අඩු විය.

- අනෙකුත් ආදායම් බොහෝ දුරට බදු ආදායමෙන් ලබා ගත් අතර එය පෙර වසරට සාපේක්ෂව 35% කින් කල්බදු කල් පිරෙන ආකාරය අනුව පහත වැටී ඇත.

**පහත වගුව 2023 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස නවය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.**

| | **2023 රු.මි.** |
|---|---|
| ආදායම | 2,218.09 |
| දළ ලාභය | 797.51 |
| බදු වලට පෙර ලාභය | 407.56 |
| බදු ගෙවීමෙන් පසු ලාභය | 268.53 |

*මූලාශ්‍රය: අශෝක් ලේලන්ඩ් සමාගම*

**ආදායම සහ ඉපැයීම්**

සමාගම විසින් මාස නවයක කාලය තුළ මුළු ආදායම රු.බිලියන 2.22 ක් වූ අතර එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට වඩා 52.93% ක අඩුවීමකි.

**දළ ලාභ**

එම මාස නවය සඳහා ව්‍යාපාරයේ දළ ලාභය රු. මිලියන 797.51, පෙර වසරට වඩා 315.05% කින් වැඩි විය. වත්මන් මූල්‍ය වර්ෂය තුළ දේශීය අගය එකතු කිරීම් සහ ඉන්වෙන්ටරි ප්‍රතිපාදන ආපසු හැරවීම් මත වඩා හොඳ ආන්තිකය හරහා සියල්ල සාක්ෂාත් කර ගෙන ඇත.

**ලාභදායිත්වය**

බදු ගෙවීමට පෙර උපයාගත් ලාභය පෙර වසරට වඩා 536.49% කින් වැඩි විය. 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සමාගමට බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 407.56 කි. සමාගම. බදු ගෙවීමෙන් පසු ලාභය රු. මිලියන 268.53 ක්, පෙර කාලයට වඩා 544.18% ක වර්ධනයකි.

## 24.3 අනාගත සැලැසුම් - 2024

- අභියෝගයේ විශාලත්වය සහ විෂය පථය පිළිබඳ හවුල් අවබෝධයක් වර්ධනය කර ගනිමින් දේශීය හා ජාත්‍යන්තර වෘත්තීය ආයතන වල සහාය ඇතිව ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා පැහැදිලි දිශානතියක් ලබා දීමෙන් ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවට පෙර නොවූ විරූ සහ සංකීර්ණ අභියෝග කළමනාකරණය කිරීමට හැකි වනු ඇත.
- විදේශ විනිමය ගැටළුව විසඳන තෙක් ආනයන සීමා කිරීම් පවතිනු ඇත. එසේ වුවද, කුලියට ගැනීම, අලෙවියෙන් පසු සේවා සහ අමතර කොටස් අලෙවිය වැනි අනෙකුත් ව්‍යාපාරික අවස්ථාවල දියුණුව පිළිබඳ සුබවාදීව සිටින අතරම, ඉදිරි වසර තුළ ඉල්ලුම සපුරාලීම සඳහා අපි අපගේ සැලකිය යුතු බඩු තොග තත්ත්වය මත විශ්වාසය තබමු.
- ඉදිරි මාස දොළහ තුළ අපි විශාල අභියෝග අපේක්ෂා කරන අතරම, අර්බුදයේ උග්‍ර අවධිය ශ්‍රී ලංකාව ජය ගනු ඇතැයි අපට විශ්වාසයි. වැසි සහ බොඩි ප්‍රාදේශීයව එකලස් කිරීම සඳහා කර්මාන්තශාලාවේ අප විසින් සිදු කර ඇති සහ දිගටම සිදු කරනු ලබන ආයෝජන වෙළඳපල ප්‍රමුඛයා ලෙස අපගේ ස්ථාවරය තවදුරටත් තහවුරු කරන අතර ආර්ථිකය වැඩිදියුණු වන විට ප්‍රාග්ධනය කිරීමට හොඳම තත්ත්වයට පත් වනු ඇත.
- වටිනාකමක් ලබා දීමට අපගේ හැකියාව රඳා පවතින්නේ අපගේ ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, සේවකයින් සහ අප සේවය කරන ප්‍රජාවන් සමඟ අපගේ සබඳතාවල ශක්තිය මතය.

# 25

# ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA)

## 25.1 හැඳින්වීම

වසර විසිහතරකට අධික කාලයක් කර්මාන්තයට සේවය කර ඇති CITI සහ TT&SC 2009 අංක 12 දරන පනත යටතේ ශ්‍රී ලංකා රෙදිපිළි සහ ඇඟලුම් ආයතනය (SLITA) බවට ඒකාබද්ධ කර 2009 ජුනි 15 සිට ක්‍රියාත්මක වේ. නව ආයතනය SLITA නැගී එන ව්‍යාපාරික අභියෝගවලට මුහුණ දීම සඳහා සහ වඩා හොඳ පාරිභෝගික කේන්ද්‍රීය සේවාවක් සැපයීම සඳහා ප්‍රතිසංවිධානය කරන ලද දෙපාර්තමේන්තු සහ කළමනාකරණ ව්‍යුහයක් සමඟ පූර්ණ පරිවර්තනයකට ලක් කිරීමට අපේක්ෂා කෙරේ. SLITA හි කළමනාකරණ ව්‍යුහය එක් එක් දෙපාර්තමේන්තු සහ පුද්ගලයා සඳහා නිශ්චිත බෙදාහැරීම් සමඟ පැහැදිලි වගකීම් සහ අධිකාරියක් නිර්මාණය කරයි. නව පනතේ දක්වා ඇති පරිදි, SLITA පහත සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් අංශයට සේවය කිරීමේ වැඩි වගකීමක් දරනු ඇත.

- රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා විශේෂඥ දැනුම ලබා දීම.
- නැඟී එන තාක්ෂණික වර්ධනයන් සපුරාලීම සඳහා රෙදිපිළි සහ ඇඟලුම් අංශයේ දැනුම් පදනම වැඩි දියුණු කිරීම.
- දේශීය හා විදේශීය රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදකයින්ට උපදේශන සහ තාක්ෂණික සේවා සැපයීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම.
- දේශීය අත්යන්ත්‍ර කර්මාන්තයට තාක්ෂණික විශේෂඥතාව ලබා දීම.

- ඇඟලුම්, අත්යන්ත්‍ර සහ පාවහන් නිෂ්පාදනයේ නියැලී සිටින ග්‍රාමීය අංශයේ කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට තාක්ෂණික සහාය ලබා දීම සඳහා බහු සේවා ප්‍රවේශයක් හඳුන්වා දීම.
- වෘත්තීය පුහුණුව ලබා දීමේ ප්‍රමුඛයකු ලෙස දිගටම කටයුතු කිරීම.
- NVQ ප්‍රමිතීන්ට අනුකූලව වෘත්තීය උපාධි වැඩසටහන් පවත්වමින් SLITA සිය සේවාවන් තෘතියික මට්ටමට උසස් කිරීමට කටයුතු කිරීම.
- පාරිභෝගික තෘප්තිය සහතික කිරීම සඳහා සේවා සඳහා පහසු ප්‍රවේශය සඳහා SLITA හි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ශක්තිමත් කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට. ඉහත අරමුණු සමඟින්, SLITA සිය සේවාවන් වේගවත් කිරීමට රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තයේ ප්‍රමුඛතම සේවා සපයන්නා ලෙස ඉදිරියට යාමටත්, දිගුකාලීනව ආර්ථික වශයෙන් සාධනීය ආයතනයක් බවට පත්වීමටත් අපේක්ෂා කෙරේ.

## 25.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### භෞතික ප්‍රගතිය:

2023 දී, අපගේ පර්යේෂණ සහ සංවර්ධන හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා කැපී පෙනෙන පියවරක් සනිටුහන් කරමින් පර්යේෂණ මධ්‍යස්ථානයක් සාර්ථකව ස්ථාපිත කිරීම.

### පර්යේෂණ පුහුණු වැඩසටහන්

දැනුවත් කිරීම සහ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කරමින් විවිධ පර්යේෂණ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### 1. රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණය - 2023

"ආර්ථික සංවර්ධනය සඳහා රෙදිපිළි සහ ඇඟලුම් නවෝත්පාදනය" යන තේමාව යටතේ 2023 ජූනි 23 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. එහිදී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 16 අතරින් පර්යේෂණ පත්‍රිකා 13 ක් තෝරා ගන්නා ලදී.

මෙම සම්මන්ත්‍රණය සඳහා SLITA කාර්ය මණ්ඩලයද, විශ්ව විද්‍යාල නියෝජිතයන්ද කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘතිකයන් ද අදාල රජයේ අමාත්‍යාංශ සාමාජිකයින් ඇතුළු විවිධ පර්යේෂකයින් පිරිසක් සහභාගී විය.

**රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණය**



*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය*

- **හොඳම ඉදිරිපත් කරන්නා සම්මානය:**

2023 වසරේ ඒ.පී.එල්.එස්. වාස් සහ ජී.ඩී.එම්. යසාරා යන අයට Hayleys Fabric PLC නියෝජනය කරමින් මෙම පර්යේෂණ සම්මන්ත්‍රණයේදී, රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයට ඉදිරිපත් කිරීමේ විශිෂ්ටත්වය සහ දායකත්වය ඇගයීම සඳහා හොඳම ඉදිරිපත් කරන්නාගේ සම්මානයක් හිමි විය.

- **ප්‍රතිඵලය සහ බලපෑම:**

2023 ජුනි මාසයේදී පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව ක්‍රියාත්මක කිරීම, රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තයේ නවෝත්පාදනයන් පෝෂණය කිරීමට කටයුතු කරන ලදි. එය පර්යේෂකයන්ට, කර්මාන්ත

විශේෂඥයින්ට සහ විද්වතුන්ට සහයෝගයෙන් කටයුතු කිරීමට, ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් බෙදාහදා ගැනීමට සහ ආර්ථික සංවර්ධනයට හේතු විය හැකි නවෝත්පාදන සාකච්ඡා කිරීමට සුදුසු වේදිකාවක් විය.

පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ 2023 දී පර්යේෂණ සම්මන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික සංවර්ධනය සඳහා හොඳ අනාගතයක් ඇති කරමින් රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ පර්යේෂණ, නවෝත්පාදන සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කර ඇත.

## 25.3 අනාගත සැලැසුම් - 2024

2024 වසර සඳහා, අපගේ පර්යේෂණ වැඩසටහන තවදුරටත් ශක්තිමත් කිරීමට සහ පුළුල් කිරීමට අභිලාෂකාමී සැලසුම් තිබේ.

අනාගත සැලසුම් සහ මුලපිරීම්:

**1. පර්යේෂණ සංස්කෘතික සංවර්ධනය:**

- අපගේ ආයතනය තුළ පර්යේෂණ හිතකාමී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වීමට කාර්ය මණ්ඩලය සහ සිසුන් දිරිමත් කිරීමට අපේක්ෂා කෙරේ.
- පර්යේෂණ ක්‍රමවේද, විද්‍යාත්මක ලේඛන සහ විවේචනාත්මක චින්තනය පිළිබඳ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරනු ඇත.

**2. රජයේ සහ පෞද්ගලික පාර්ශ්ව සමඟ සහයෝගීතාව:**

- ජාතික සංවර්ධන ඉලක්ක සමඟ පර්යේෂණ මුලපිරීම් සමගාමී කිරීම සඳහා රජයේ අමාත්‍යාංශ සහ ආයතන සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.
- ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සහ සංවර්ධන ප්‍රයත්නයන් සිදු කිරීම සඳහා රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ පෞද්ගලික අංශයේ සමාගම් සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට කටයුතු කරනු ඇත.

**3. විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාව:**

- දැනුම හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම, ඔවුන්ගේ විශේෂඥතාව සහ සම්පත් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල සමඟ පර්යේෂණ සහයෝගිතා ඇති කර ගැනීමට සැලසුම් කරමින් ඇත.
- අපගේ SLITA සිසුන් සඳහා රෙදිපිළි සහ ඇඟලුම් අංශයේ ප්‍රයෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා පර්යේෂණ වැඩසටහන් සහ සීමාවාසික පුහුණුව ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

**4. රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්ත සමඟ සහයෝගීතාව:**

- ඔවුන්ගේ අභියෝග, අවශ්‍යතා සහ පර්යේෂණ ප්‍රමුඛතා තේරුම් ගැනීමට රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්ත සමඟ සමීපව කටයුතු කරනු ඇත.
- සැබෑ ලෝකයේ ගැටළු විසඳීම සහ නවෝත්පාදනයන් මෙහෙයවීම ඉලක්ක කරගත් කර්මාන්ත-විශේෂිත පර්යේෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

**5. පර්යේෂණ ආශ්‍රිත සංවිධාන සමඟ සහයෝගීතාව:**

- දැනුම හුවමාරු කර ගැනීමට සහ සාමූහික ප්‍රවීණත්වය ලබා ගැනීමට පර්යේෂණ ආයතන, සහ කර්මාන්ත සංගම් වැනි වෙනත් පර්යේෂණ ආශ්‍රිත සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

**6. පර්යේෂණ ඉලක්ක සහ දර්ශක:**

- නිශ්චිත පර්යේෂණ පත්‍රිකා, පේටන්ට් බලපත්‍ර, සහ නව්‍ය විසඳුම් ප්‍රකාශනය ඇතුළුව පැහැදිලි පර්යේෂණ ඉලක්ක සැකසීම සඳහා කටයුතු කෙරේ.
- පර්යේෂණ ක්‍රියාකාරකම්වල බලපෑම සහ සාර්ථකත්වය මැන බැලීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ස්ථාපිත කිරීම සිදු කෙරේ.

**7. සඟරා ප්‍රකාශනය:**

- තම සොයාගැනීම් පිළිගත් සඟරාවල පළ කිරීමට පර්යේෂකයන් දිරිමත් කරමින් සඟරා ප්‍රකාශනයේ ක්‍රියාකාරීව නිරත වනු ඇත.
- දැනුම සහ පර්යේෂණ ප්‍රතිඵල පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**8. රෙදිපිළි සහ ඇඟලුම් ආශ්‍රිත හිඩැස්/ගැටළු හඳුනා ගැනීම**

- රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ විවිධ අංශවල හිඩැස් සහ ගැටලු හඳුනාගැනීම සඳහා පුළුල් කර්මාන්ත සමීක්ෂණ සහ අධ්‍යනයන් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.
- අනාගත පර්යේෂණ ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති නිර්දේශ සඳහා මෙම දත්ත ගබඩා කිරීමට සහ විශ්ලේෂණය කිරීමට මධ්‍යගත දත්ත සමුදායක් සකස් කිරීමට අපේක්ෂා කෙරේ.

2024 සඳහා වන මෙම අනාගත සැලසුම් අපගේ පර්යේෂණ වැඩසටහන රෙදිපිළි සහ ඇඟලුම් අංශය තුළ නවෝත්පාදන, දැනුම නිර්මාණය සහ ගැටළු විසඳීම සඳහා ගතික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම අරමුණු කරයි. සහයෝගීතාව පෝෂණය කිරීමෙන් සහ පර්යේෂණ කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් පෝෂණය කිරීමෙන්, කර්මාන්ත අභියෝගවලට මුහුණ දීමට, ආර්ථික සංවර්ධනයට දායක වීමට සහ රෙදිපිළි හා ඇඟලුම් පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රගතියට අප ආයතනය වඩාත් හොඳින් ක්‍රියාකාරී වනු ඇත.

**9. SLITA කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ ප්‍රකාශනය පිළිබඳ දත්ත සමුදාය සකස් කිරීමට අපේක්ෂා කෙරේ.**

**Database on research publication by the SLITA staff**

| International Journals | International Conferences | Local Conferences | Published Books | Project reports | Published Newsletter |
|---|---|---|---|---|---|
| 07 | 02 | 17 | 03 | 12 | 08 |

| Unpublished Books | Unpublished Project reports |
|---|---|
| 02 | 10 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය*

# 26

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)

## 26.1 හැඳින්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

### ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය

හස්ත කර්මාන්ත පෝෂණය කිරීම, සංස්කරණය කිරිම හා සංවර්ධනය කිරීම.

### ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ලබාදෙන සේවාවන්

- දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැම්යාවන්ට අනුව නව නිර්මාණ සැලසුම් කිරීම හා මූලාදර්ශ සකස් කිරීම හා හස්තකර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීම.
- දිවයින පුරා හස්තකර්මාන්ත ශිල්පීන්ට, ගුරු ශිල්පීන්ට නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආයතනයේ වැඩහල සේවක පිරිස හා ඒ ආශ්‍රිත සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගනිමින් නව නිර්මාණ හා නව තාක්ෂණික, න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා විධිමත් කෙටිකාලීන පුහුණු සැසි මාලාවක් ක්‍රියාත්මක කිරීම.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන්නන් සඳහා වැඩහල පරිශ්‍රය තුළ එක්දින දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති නව නිර්මාණ සකස් කර ගැනීමට අවශ්‍ය සහාය ලබාදීම.
- පොදු පහසුකම් සේවා හරහා හස්තකර්මාන්ත ශිල්පීන්ට තම නිෂ්පාදන සඳහා වැඩහළ තුළ නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍ර භාවිතා කිරීමට පහසුකම් සැලසීම.

- පුස්තකාල පහසුකම් හරහා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල පොත් හා සඟරා පරිශීලනයට අවස්ථාව ලබාදීම.

- පර්යේෂණ සංවර්ධන අංශයේ රසායනික හා යාන්ත්‍රික ක්ෂේත්‍ර යටතේ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම. විශේෂයෙන් බතික් ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම හා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය හා හස්තකර්මාන්ත ශිල්පීන් මෙන්ම අදාළ වෙනත් ආයතන හා පුද්ගලයින්ගේ ඉල්ලීම මත අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා අමුද්‍රව්‍ය වල ගුණාත්මකභාවය සම්බන්ධ ප්‍රමිති සහතික නිකුත් කිරීම.

- හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ඵලදායී වන්නා වූ මෝස්තර හා වෙළඳපොළ ප්‍රවනතා පිළිබඳ තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳපොළ වැඩිදියුණු කිරීම සඳහා නව නිර්මාණ ප්‍රදර්ශන, අලෙවි ප්‍රවර්ධන හා අලෙවි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම.

- ආයතන විසින් ඉටුකරන ලද සේවාවන් සඳහා ගාස්තු අය කිරීම හා රසායනාගාර, වැඩපළවල් සහ වෙනත් ආයතන පවත්වාගෙන යාම යටතේ,
  - ගෘහ අභ්‍යන්තර සැලසුම්, ග්‍රැෆික් නිර්මාණ, තේමා ව්‍යුහයන්, කුසලාන, පදක්කම් හා සමරු ඵලක සහ වෙළෙඳ හා ප්‍රදර්ශන කුටි ආදිය සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් පරිදි මෝස්තර උපදේශන සේවා සැපයීම.
  - ආයතනය යටතේ පවත්නා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා හා ජීවන රටා නිමැවුම් ජාතික ඩිප්ලෝමා ආදී ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරිම.

- ආයතනයේ පරමාර්ථ වලට මුළුමනින්ම හෝ අඩවශයෙන් සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශීය ආයතන සමඟ රජයේ අනුමැතිය ඇතිව එකඟතාවයන්ට එළඹීම.

- සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් සඳහා 2023 සැප්තැම්බර් මස වන විට රු.මි.11ක ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් නිදහස් කර ඇත. එම දිනට රු.මි. 1.45 ක සංවර්ධන වැඩසටහන් නිමකර ඇති අතර රු.මි. 1.235ක සංවර්ධන වැඩසටහන් නිමකරමින් පවතී.

- එමෙන්ම මැයි මස ප්‍රතිපාදන නිදහස් කරන තෙක් ආයතනය උපයා ඇති මුදලින් රු.මි.1.2ක ප්‍රතිපාදන වැය කරමින් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් හා සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සඳහා දේශීය හස්තකර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිත නව සංකල්ප හා මෝස්තර හඳුන්වාදීම යටතේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමත් සිදුකරන ලදි.

- තවද, අපනයන අභිමුඛ කොහු හා බතික් ආශ්‍රිත නව නිර්මාණ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇති අතර, විදේශ රටවල හස්තකර්මාන්ත ආයතන සමග තොරතුරු තාක්ෂණ වැඩසටහන් හරහා තොරතුරු හුවමාරු කරගැනිම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

- එමෙන්ම නව නිර්මාණ සංකල්ප සමඟ "යුගයට නිමැවුම්" නව නිර්මාණ ප්‍රදර්ශනය නොවැම්බර් මස මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හි පැවැත්වීමට ද මේ වන විට කටයුතු සංවිධානය කරමින් පවතී.

## 26.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**නව නිර්මාණ සංවර්ධනය, දැනුම ඉහළ නැංවීම හා හැකියා සංවර්ධනය**

- ශ්‍රී ලංකාව තුල සිටින මෝස්තර නිර්මාණකරුවන්ගේ සංසදයක් නිර්මාණය කිරීම. වැඩසටහනට අදාළ සියළු ලිපි ලේඛන අවශ්‍යතා නිමකර ඇත. තෝරාගත් ප්‍රවීන නිර්මාණකරුවන් පිරිසක් සමඟ මූලික සාකච්ඡාව සාර්ථකව පවත්වන ලද අතර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- වෙළඳපළට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම හා ඊට අදාළ මූලික සාම්පල සකස් කිරීම - පන් හා කෙඳි, දැව , රෙදිපිළි, උණ හා වේවැල්, රතුමැටි, කොහු, ආභරණ, සම්, ලාක්ෂා, පිත්තල හා බතික් ආශ්‍රිත නවෝත්පාදන ඇසුරුම් සහ සිහිවටන ඇතුළුව නව නිර්මාණ 499ක් සැලසුම් කරමින් ඉලක්කය 100% ක් සපුරාගෙන ඇති අතර, වැඩහල තුළ ඊට අදාළ මූලික සාම්පල 297ක් සකස් කරමින් 63%ක ප්‍රගතියක් දක්වයි.

- ඉල්ලීම මත වැඩහල තුළ ප්‍රයෝගික පුහුණුව ලබාදීම හා පොදු පහසුකම් සේවා ලබාදීම - 71%ක ඉලක්ක සපුරාගනිමින් කෙටිකාලීන පුහුණු සැසි හරහා 53දෙනෙකුට වැඩහල තුළ ප්‍රයෝගික පුහුණුව ලබාදීමටත්, ක්ෂේත්‍රයේ රැදීසිටින්නන්ට, පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් ඇතුළුව 408 දෙනෙකුට අවශ්‍ය සේවා ලබාදීමටත් කටයුතු කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස 82%කි.

- සුළු හා මධ්‍ය පරිමාණ දේශීය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට වර්තමාන අවශ්‍යතාව මත පාරම්පරික චිත්‍ර කලා හා ප්‍රතිමා කලාව තුළ ඇති සැලසුම් මූලාංග (මෝස්තර / රටා) (Motif) විධිමත්ව ප්‍රතිනිර්මාණය කර නැවත සමාජගත කිරීම - සියළු ලේඛණ කටයුතු සම්පූර්ණ කර, ග්‍රන්ථයක් ලෙස එළිදැක්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**දේශීය වෙළෙඳපොල ප්‍රවර්ධන වැඩසටහන් හා නව නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම.**

- නව නිර්මාණ ප්‍රදර්ශනය හා ඊට අදාළ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ හරහා නව නිර්මාණ 200 ක් හඳුන්වාදීමට අපේක්ෂිතයි.

- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන 02ක් සඳහා සහභාගීත්වය ලබා දෙමින් නව නිර්මාණ එළිදැක්වීමට කටයුතු කර ඇත.

- ප්‍රමුණ පෙළේ හස්තකර්මාන්ත අලෙවිසැල් සහ මිලදීගැනීමේ නියෝජිතායතන සමඟ වෙළඳපළ සම්බන්ධතා ඇති කිරීමේ වැඩසටහන් ඉලක්ක කරන ලද නව නිර්මාණ 40න් 22ක් හඳුන්වාදී ඇත.

ආයතනයේ නව නිර්මාණ ජනප්‍රිය කිරීම සඳහා ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් 5ක් ඉලක්ක කර ඇති අතර ඉන් 02ක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම සමාජ මාධ්‍ය ප්‍රචාරණ 32 ක් (සමාජ මාධ්‍ය ප්‍රචාරණය (ෆේස් බුක් )පළකිරීම් (සාමාන්‍ය) ෆේස්බුක් සහ යූ ටියුබ් වීඩියෝ, ෆේස්බුක් බැනර්) හරහා ආයතනයේ සංවර්ධන ක්‍රියාකාරම් පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

**නව නිර්මාණ හා නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීම.**

- තෝරාගත් හස්තකර්මාන්ත ශිල්පීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන පරිදි රට පුරා ගුණාත්මක පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම.

ඉල්කක කරන ලද පුහුණු වැඩසටහන් 29න් වැඩසටහන් 6ක් කාන්තාවන්ට ප්‍රමුඛතාවය දෙමින් ප්‍රතිලාභීන් 108 දෙනෙකු සඳහා සිදු කරන ලද අතර, නව නිර්මාණ 82ක් ශිල්පීන්ට හඳුන්වාදීමට කටයුතු කරන ලදී. එමෙන්ම වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත.

**පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සහ නව තාක්ෂණය, නව ක්‍රියාවලි සහ ද්‍රව්‍යමය නවෝත්පාදන හඳුන්වාදීම.**

- **හස්තකර්මාන්ත නිෂ්පාදන හා ක්‍රියාවලින්හි ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම, සහතික කිරීම හා ඒ පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා පිළිගත් රසායනාගාර, ආයතන සමඟ සම්බන්ධ වීම.**

  බතික් හා GMP ප්‍රමිති කෙටුම්පත SLSI ආයතනය මඟින් ප්‍රමිතියක් ලෙස ප්‍රදර්ශනය කරන ලද්දේ මෙම වසරේ අගෝස්තු මාසයේ වන අතර, මේ පිළිබඳ දැනුම්වත් වැඩසටහන් පැවැත්වීම පිළිබඳ අප විසින් විමසිම් කර ඇත. ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සැලසුම් කරමින් පවතී. ඉලක්කය අනුව ප්‍රගතිය 20% කි.

- **ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරන ලද අර්ධ ස්වයංක්‍රිය පන් සකස්කිරීමේ යන්ත්‍රය පන් හා කෙඳි කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීමේ වැඩසටහන**

  මෙම වැඩසටහනට සම්බන්ධ වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 20කි.

- **දේශීය විශ්ව විද්‍යාල හා වෙනත් පිළිගත් ආයතන සමඟ සම්බන්ධව පර්යේෂණ පැවැත්වීම.**

  ගෘහස්ත බතික් කර්මාන්තරුවන්ට සුදුසු බතික් අපජල පද්ධතියක් හඳුනාගැනීමට අදාළව පිළිගත් ආයතනයන්ගෙන් ව්‍යාපෘති යෝජනා කැඳවා ඇත. බතික් අපජලය රසායන ද්‍රව්‍ය පමණක් භාවිතයෙන් පිරිපහදු කිරීමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂණ කරමින් පවතී. ඉලක්කය අනුව ප්‍රගතිය 30%කි.

- **ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මඟින් සිදු කරන ජල පිරිපහදුවේදී නිපදවෙන ඝන අපද්‍රව්‍ය මැටි ආශ්‍රිත අත්කම් නිෂ්පාදනය සඳහා යොදාගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම**

  මෙම ව්‍යාපෘතිය සඳහා ඉහත ආයතනය සමඟ MOU අත්සන් කර ඇත. මෙම මැටි  මහායාල මැටි කර්මාන්තකරුවන්ට හඳුන්වාදී ඇති අතර, ඔවුන් විසින් එම මැටි විසිතුරු අත්කම් නිර්මාණ සඳහා භාවිතා කර ඇත. දැනට මැටි ලබාගැනීමට ඉල්ලුම් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 05කි. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය 70%කි.

- **කොහු ආශ්‍රිත හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා මූලික කොහු පටි ගෙතීමේ යන්ත්‍රයක් හා රතුමැටි කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා බහුකාර්ය මැටි පහන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රයක් නිර්මාණය කර සංවර්ධනය කිරීම**

  මෙම යන්ත්‍ර 02 නිර්මාණය කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් 25%ක හා 40% ලෙස දැක්විය හැක.

- **කෙඳි ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හණ යොදාගනිමින් ලාම්පු ආවරණ නිර්මාණ සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා හඳුන්වාදීම .**

  ඉලක්ක සපුරා ඇත.

- **ලාක්ෂා කර්මාන්තය සඳහා KNOCK-DOWN තාක්ෂණය භාවිතයෙන් සැකසූ මෙවලම් හඳුන්වාදීම සහ සංවර්ධනය කිරීම.**

  මෙහි ප්‍රගතිය 70%කි.

- **හස්තකර්මාන්ත සඳහා භාවිතා කළහැකි විකල්ප අමුද්‍රව්‍ය දියුණු කිරීම සහ පූර්ව ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම**

  මේ යටතේ තල්කොළ මත පුස් සෑදීම වැළැක්වීමට අදාළව පෙර වර්ෂයේ කරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම් හී පසුවිපරම සිදුකොට ඉදිරි ක්ෂේත්‍ර වැඩමුළු සඳහා අවශ්‍ය සැලසුම් සිදුකරමින් පවතී. ප්‍රගතිය 20%කි.

- **ශිල්ප උපදේශකයන් සඳහා සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව වැඩමුළු පැවැත්වීම.**

  ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා ඉලක්ක කරන ලද වැඩමුළු 02 පවත්වන ලදී.

- **නැනෝ තාක්ෂණ ආයතනය සමඟ එක්ව ස්වාභාවික වර්ණ පිළිබඳ පර්යේෂණ සිදුකිරීම.**

  අමාත්‍යාංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතර, පර්යේෂණ හරහා සොයාගන්නා නව වර්ණ ප්‍රභේද ඇතුළු නව සොයාගැනීම් ක්ෂේත්‍රයට මුදාහැරීමට කටයුතු කෙරේ.

- නත්තරම්පොත ශාඛා කාර්යාලයේ ස්ථාපිත බතික් ආශ්‍රිත අපජල පිරිපහදු පොදු පහසුකම් මධ්‍යස්ථානය හරහා සේවාවන් ලබාදීම හා බතික් ආශ්‍රිත උසස් තාක්ෂණික වැඩසටහන් පැවැත්වීම

**නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම**

- අධ්‍යාපන අංශය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදීගැනීම - මෙහි භෞතික ප්‍රගතිය 100%

- ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2023-2024) සිසුන් 60 දෙනෙකු බඳවාගනිමින් ඉලක්කය 100%ක් සපුරා ඇති අතර ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික පදනම් පාඨමාලාව (මාස 03) සඳහා සිසුන් 11 දෙනෙකු බඳවා ගනිමින් 73% ප්‍රගතියක් පෙන්වයි.

- මහනුවර - නත්තරම්පොත ශාඛා කාර්යාලයේ ආරම්භ කිරීමට නියමිත ජීවන රටා නිමැවුම් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2023 – 2024) ආරම්භ කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

- උපාධි ප්‍රධානෝත්සව 02ක් සංවිධානය කර පැවැත්වීමට ඉලක්ක කර ඇති අතර ඉන් එක් උපාධි ප්‍රදානෝත්සවයක් අප්‍රේල් මස පවත්වන ලදී.

- 2022 අවසානයේ ජාතික පිරිනිර්මාණ විද්‍යාලය (අධ්‍යාපන අංශය) හරහා ලබාගත් ආදායම රු.මිලියන 4.8 ක් වන අතර මෙම වසරේ අනපේක්ෂිත ආදායම රු.මිලියන 13.75කි.

**උපදේශන සේවා සැපයීම**

සේවාලාභියාගේ අවශ්‍යතා අනුව ලාභ අරමුණු කරගත් පදනම මත උපදේශන සේවා භාර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම යටතේ ඉලක්ක කළ උපදේශන සේවා 03න් 02ක් සිදුකර ඒ හරහා ඉලක්ක කළ ආයතනික ගාස්තු 80%ක් සපුරාගෙන ඇත.

## 26.3 අනාගත සැලැසුම් - 2024

| | වැඩසටහන / ව්‍යාපෘතිය | අවශ්‍ය ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|
| | **නව ව්‍යාපෘති / වැඩසටහන්** | |
| 1 | උණ ආශ්‍රිත අත්පොතක් සැලසුම් කිරීම, මුද්‍රණය හා එළිදැක්වීම | 1.00 |
| 2 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය | 2.50 |
| 3 | සහයෝගීතාවය තුළින් අත්කම් කර්මාන්තය වැඩිදියුණු කිරීම - ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා මොරටුව විශ්ව විද්‍යාලය ඒකාබද්ධව | 3.60 |
| 4 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය මෝස්තර සම්පාදකවරුන් සඳහා විදේශීය නිර්මාණ නිරාවරණය සඳහා අවස්ථාව | 3.00 |
| 5 | ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් සමඟ සහයෝගයෙන් නව නිර්මාණ ආශ්‍රිත බතික් ආභරණ හා විලාසිතා නිර්මාණ දැක්ම | 3.00 |
| 6 | නව නිර්මාණ ප්‍රවර්ධනය සඳහා වෙනත් රටවල් විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා හා විවිධ වැඩසටහන් සඳහා සහභාගීවීම | 2.00 |
| 7 | හස්තකර්මාන්ත නව නිර්මාණ ප්‍රවර්ධනය සඳහා කෙටි චිත්‍රපට තරඟාවලියක් පැවැත්වීම | 1.00 |
| 8 | එක් එක් හස්තකර්මාන්ත ක්ෂේත්‍ර යටතේ වීඩියෝ නිර්මාණ සැකසීම | 2.40 |
| 9 | අත්කම් ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 5.90 |
| | **සිදුකරමින් පවතින ව්‍යාපෘති/ වැඩසටහන්** | |
| 1 | මෝස්තර නිර්මාණකරුවන්ගේ සංසදයට අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීම | 5.00 |
| 2 | නව නිර්මාණ සැලසුම් කිරීම හා හඳුන්වාදීම (මෝස්තර සම්පාදකවරුන් සඳහා විශේෂ මෙවලම් හා මෘදුකාංග) | 2.10 |
| 3 | නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල සකස් කිරීම හා සංවර්ධන කිරීම සඳහා අමුද්‍රව්‍ය සැපයීම හා බාහිර ශිල්පීන්ට ගෙවීම | 4.80 |
| 4 | නව නිර්මාණ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් පැවැත්වීම | 10.50 |
| 5 | නව නිර්මාණ ප්‍රදර්ශනය සමඟ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන | 12.50 |
| 6 | නව නිර්මාණ ප්‍රවර්ධනය සඳහා වෙනත් ආයතන විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය හා විවිධ වැඩසටහන් සංවිධානය හා සමාජ මාධ්‍ය ප්‍රචාරණය | 3.50 |
| 7 | අත්කම් ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් | 0.60 |
| 8 | කාර්ය මණ්ඩල පුහුණුව | 0.**60** |
| 9 | ගොඩනැගිලි අලුත්වැඩියාව | 5.60 |
| 10 | සහායක අංශ වැඩිදියුණු කිරීම සඳහා කාර්යාල උපකරණ, සේවා සහ ප්‍රතිසංස්කරණය කිරීම | 11.00 |
| | **අවශ්‍ය මුළු ප්‍රතිපාදන** | 80.63 |
| | **බාහිර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක ව්‍යාපෘති / වැඩසටහන්** | |
| 1 | ජා.මෝ.ම. වැඩහල තුළ කෙටිකාලීන පුහුණු සැසි පැවැත්වීම | |
| 2 | නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම | |
| 3 | මෝස්තර උපදේශන සේවා සැපයීම | |

# 27

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)(SLHB)

## 27.1 හැඳින්වීම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය දිවයින පුරා පිහිටා ඇති ප්‍රදර්ශනාගාර දහයක් (10) හරහා දේශීය හස්ත කර්මාන්ත අලෙවිය ප්‍රවර්ධනය කරයි. මෙම ප්‍රදර්ශනාගාර ජාලය 1964 ආරම්භයේ සිටම සාම්ප්‍රදායික ශිල්පීන්ට තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අත්‍යාවශ්‍ය වෙළඳපොළ සම්බන්ධතා සපයයි. එම යුගයේ භුක්ති විඳි අතථ්‍ය ඒකාධිකාරී තත්ත්වය හේතුවෙන් සංවෘත ආර්ථිකය යටතේ ලාබ ලබන ආයතනයක් ලෙස ලක්සල පැවතී ඇත. 1983 දී, එය 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ ඒ ආශ්‍රිත ආයතන පනත යටතට පත් විය.

LAKSALA යනු ස්වයං මූල්‍ය ආයතනයක් වන අතර ශ්‍රී ලංකාව පුරා ගෘහ කර්මාන්ත හරහා නිෂ්පාදනය කරනු ලබන එකම රජය සතු හස්ත කර්මාන්ත අලෙවි කරන ආයතනය වේ.

දැනට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ (ලක්සල) සමස්ත මෙහෙයුම් ජාතික ප්‍රතිපත්ති රාමුව හා ගැමි පාරම්පරික ශිල්පීන්ගේ පැවැත්මට අනුගත වේ.

ආයතනය සෑම විටම කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් යටතේ දක්වා ඇති විශේෂ ප්‍රමුඛතාවලට අනුකූල වන අතර 2030 වසර වන විට සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන ගෝලීය නව ප්‍රමිතියක් වන "තිරසාර සංවර්ධන ඉලක්ක" (SDG's) කෙරෙහි දැඩි උනන්දුවක් දක්වයි.

### ප්‍රධාන අරමුණු

- ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම සහ ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත අලෙවිය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීම

**සම්ප්‍රදායික හස්ත කර්මාන්ත අත්යන්ත්‍ර,බතික්, දේශීය ඇහලුම් තේ සහ සම් නිෂ්පාදන**



## ඉලක්ක

- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මානය කිරීම සහ වටිනාකම් බෙදාහදා ගැනීම
- හොදම පාරිභෝගික තේරීම සඳහා බහුවිධ අවස්ථා
- ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය සහ මුදල් සඳහා වටිනාකම
- සේවා විශිෂ්ටත්වය තුළින් අපගේ ගනුදෙනුකරුවන් සතුටු කිරීම

## 27.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**ප්‍රගතිය**

| සංරචකය | 2023 |
|---|---|
| විකුණුම් පිරිවැටුම (රු.මි.) | 410 |
| ලාභය(රු.මි.) | 25 |
| ප්‍රදර්ශනාගාර නිෂ්පාදන මිලදී ගැනීම (රු.මි.) | 200 |
| සැපයුම්කරුගේ ගෙවීම (රු.මි.) | 138 |
| ලියාපදිංචි වූ වන සැපයුම්කරවන් සංඛ්‍යාව | 360 |
| අත්කම් මිලදී ගැනීම සඳහා කලාපීය චාරිකා ගණන | 10 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)*

**2022 සහ 2023 වසර වල විකුනුම් සැසඳීම**




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)*

## 27.3 අනාගත සැලැසුම් - 2024

- ඇල්ල,මීගමුව සහ හම්බන්තොට වැනි සංචාරක ගමනාන්තයන් සඳහා ලක්සල ප්‍රදර්ශනාගාර විවෘත කිරීම.
- කොටුවේ පිහිටි ලක්සල ගොඩනැගිල්ලේ රාජ්‍ය පෞද්ගලික සහභාගිත්ව ව්‍යාපාර ආකෘතිය අනුව ක්‍රියාත්මක කිරීම.
- ලියාපදිංචි ලක්සල සැපයුම්කරුවන්ගේ පදනම 2000 දක්වා වැඩිදියුණු කිරීම.
- රජයේ ආයතනවල ආයතනික විකුණුම් ඇණවුම් වැඩි කිරීම.
- තෝරාගත් සුප්‍රසිද්ධ විදේශ වෙළෙඳප්‍රදර්ශන සඳහා ලක්සල ඉදිරිපත් වීම.
- ව්‍යාපාරික හවුල්කරුවන් හරහා අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ඌන උපයෝගි කරගත් දේපල හඳුනා ගැනීම

# 28

# ජාතික ශිල්ප සභාව (NCC)

## 28.1 හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතින් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

**අරමුණු / ඉලක්ක**

1. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 10% කින් ඉහළ නැංවීම
2. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම
3. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400 ක් නිර්මාණය කිරීම

4. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස 16% කින් ඉහළ නැංවීම

**කාර්යභාරය**

- ප්‍රාදේශීය මට්ටමින් ශිල්පීන්ගේ සමිති පිහිටුවීම තුළින් ශිල්පින් සංවිධානය කිරීම හා ශිල්ප ගම්මාන ඇති කිරීම
- අත්කම් ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම
- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම
- අත්කම් භාණ්ඩවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩමුළු පැවැත්වීම
- ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම
- විදේශීය වෙළඳ පොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, දිරිගැන්වීම, ප්‍රදර්ශනය කිරීම හා විදේශ ප්‍රදර්ශනවලට ශිල්පීන් ඉදිරිපත් කිරීම
- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම තුළින් ශිල්පීන් ඇගයීමට ලක් කිරීම සහ අළෙවි සල්පිල් පැවැත්වීම, ශිල්ප ගම්මාන පිහිටුවීම මඟින් ශිල්පීන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා පහසුකම් සංවිධානය කිරීම
- ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශිල්පීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණ කිරීම

## 28.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**1. ශිල්පීන් කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම**

- හස්ත කර්මාන්ත ශිල්පීන් 1209 දෙනෙකු ලියාපදිංචි කර නව හැඳුනුම්පත් 933ක් නිකුත් කර ඇත.
- සමස්ත ශිල්පීන් සංඛ්‍යාව-22317

**2. ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය**

දිවයින පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන් ඒකරාශී කර ඔවුන් සංවිධාන ගත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය කර, ප්‍රාදේශීය මට්ටමින් හස්ත කර්මාන්ත ශිල්පීන් ඒකරාශී කර ඔවුන්ගේ සංවිධානාත්මක ශක්තිය වර්ධනය කිරීමත්, ශිල්පීය කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය, අළෙවි පහසුකම්, කුසලතා ප්‍රවර්ධන සහ ව්‍යවසායකත්ව හැකියාව වර්ධනය කිරීමත් අපේක්ෂාව වේ. ඒ අනුව, 2023 වර්ෂයේ දී නව ශිල්ප සමාජ 41ක් ස්ථාපිත කර ඇති අතර සාමාජිකයින් සංඛ්‍යාව 911 කි. සමස්ත ශිල්ප සමාජ සංඛ්‍යාව 174.

**3.ශිල්ප පුහුණු මධ්‍යස්ථාන මඟින් පුහුණු පහසුකම් ලබාදීම. (පුහුණු දීමනා, අමුද්‍රව්‍ය සහ උපකරණ)**

දිස්ත්‍රික් 18 ක් ආවරණය වන පරිදි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 70ක ශිල්පීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වසරේදී එම මධ්‍යස්ථාන හරහා පූර්ණකාලීනව ආධුනිකයින් 705ක් පුහුණුව ලබමින් සිටින අතර නිෂ්පාදන පහසුකම් ලබා ගන්නා ශිල්පීන් සංඛ්‍යාව 436 දෙනෙකු වේ.

### 4. අපනයන අභිමුඛ හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පහසුකම් සැලසීම

Crafting Ceylon" අපනයන අභිමුඛ නිර්මාණ තරඟය සඳහා ශිල්පීන් 1553 දෙනෙකු විසින් නිර්මාණ 2214 ඉදිරිපත් කර ඇති අතර ජයග්‍රාහී නිර්මාණ 546ක් තෝරාගැනීම සිදු කර ඇත. "Crafting Ceylon" අපනයන අභිමුඛ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන මාර්තු මස 23, 24 දිනයන්හි BMICH හිදී පවත්වන ලදී. ජයග්‍රාහකයින් 100ක් සඳහා සහතික පත්‍ර ප්‍රදානය, B to B Meeting, ඇසුරුම්කරණය පිළිබඳ වැඩමුළුව, ජාතික වාණිජ මණ්ඩලයේ ඉදිරිපත් කිරීම හා විද්‍යුත් අලෙවිකරණය පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

අප්‍රේල් මස 30 දින ඊජිප්තු තානාපති කාර්යාලය මගින් Shangri-La හෝටල් පරිශ්‍රයේ සංවිධානය කරන ලද "Women Plus" Bazaar අලෙවි ප්‍රදර්ශනය සඳහා ජයග්‍රාහී ශිල්පීන් 54 දෙනෙකු සහභාගී කරවන ලදී. 2023.06.27 දින Daraz ආයතනයේ දී මාර්ගගත ක්‍රමය ඔස්සේ නිර්මාණ අලෙවි කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක්, ඊජිප්තු තානාපති කාර්යාලයේ මෙහෙයවීම මත ශිල්පීන් 10 දෙනෙකු සඳහා පැවැත්විය.

**නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**



### 5. ශිල්පීන් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහන යටතේ වයස්ගත ශිල්පීන්, ආබාධිත මට්ටමේ ශිල්පීන් සඳහා ආධාර මුදලක් ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථාවලදී ශිල්පීන් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා (සැත්කම්, හෘදයාබාධ, අක්ෂි රෝග හා විශේෂ සැත්කම් ආදී) ශිල්ප සුභ සාධන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ මෙම වසරේ දී ශිල්පීන් 83දෙනෙකු සඳහා පහසුකම් සලසා දී ඇත. (මාසිකව රු.5000 බැගින් යාවජීව ශිල්පීන් - 19, මාසිකව රු.3000 බැගින් ශිල්පීන් - 64

### 6. දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන

- බත්තරමුල්ල දියත උයන - “Shilpa Thursday” අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සෑම බ්‍රහස්පතින්දා දිනකම පවත්වා ඇත.සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව55.
- කුරුණෑගල "Made in Sri Lanka" අලෙවි ප්‍රදර්ශනය මාර්තු 31 සිට අප්‍රේල් 2 දින දක්වා පවත්වා ඇත.
- මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ අලෙවි කුටියක් 2023 ජූනි 27 හා 28 දෙදින තුළ පවත්වන ලදී.
- සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන Green Super අලෙවි සැලෙහි “Lak Shilpa” සන්නාමය යටතේ නිර්මාණ අලෙවි කරනු ලබයි.

**දේශීය හා විදේශීය විකුණුම් ප්‍රවර්ධන වැඩසටහන**



- නාරාහේන්පිට “රජවාස” දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සෑම සතියකම සිකුරාදා, සෙනසුරාදා හා ඉරිදා පවත්වමින් පවතී. සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව 15

**දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන්**





- 2023 පෙබරවාරි 2 සිට 18 දක්වා ඉන්දියාවේ පැවති "Suraj Kund Crafts Mela" සඳහා ශිල්පීන් 10 දෙනෙකු සහභාගී කරවීම සිදුකර ඇත.

**"Suraj Kund Crafts Mela"**




- 2023 අප්‍රේල් 29 සිට මැයි 14 දක්වා තමිල්නාඩු රජයේ සංචාරක දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ "Chennai Vizha - 2023" සඳහා ශිල්පීන් 8 දෙනෙකු සහභාගී කරවීම සිදුකර ඇත.

- 2023 ජුනි මස 28 සිට ජුලි 03 දක්වා චීනයේ පැවැත්වූ “16th China Woodcarving and Bamboo Weaving Art and Crafts Expo” සඳහා ශිල්පීන් 2 දෙනෙකු සහභාගී කරවීම සිදුකර ඇත.

## 7. දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

- කටුබැද්ද දැව මෝස්තර සහ නිර්මාණ නවෝත්පාදන පුහුණු මධ්‍යස්ථානයේ පළමු අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර දෙවන අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත.

- දැව කර්මාන්තයේ මෝස්තර හා ක්‍රියාවලි නවෝත්පාදනය සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- පළාත් වඩු පාසල් වලින් සිසුන් තෝරා ගැනීම සඳහාවූ පරීක්ෂණය අවසන් කර ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

**කටුබැද්ද දැව මෝස්තර සහ නිර්මාණ නවෝත්පාදන පුහුණු මධ්‍යස්ථානය**




## 8. ජාතික අමුද්‍රව්‍ය කළමනාකරණ ඒකකය (බැංකුව) ස්ථාපිත කිරීම

ජාතික ශිල්ප සභාව යටතේ පළාත් මට්ටමින් අමුද්‍රව්‍ය ගබඩා ස්ථාපිත කර කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඉතා සාධාරණ මිලට ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ සැලසෙනු ඇත.

- නන්නපුරව අමුද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීම සිදුකර ඇත.
- බුලත්සිංහල හා මනම්පිටිය අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණ පත්‍ර ලබා ගෙන ඇත.

## 28.3 අනාගත සැලසුම් - 2024

### 1. හස්ත කර්මාන්ත ආශ්‍රිත ආනයනික භාණ්ඩ සඳහා ආදේශන නිෂ්පාදන දිරිමත් කිරීම

මෙහිදී සියලුම හස්ත කර්මාන්ත ආශ්‍රිත ආනයනික භාණ්ඩ හඳුනා ගැනීම, ඒ සඳහා ආදේශන නිෂ්පාදන හඳුනා ගැනීම තුළින් අවශ්‍ය අමුද්‍රව්‍ය, මෝස්තර, පුහුණුව හා ක්‍රමවේදයන් හඳුන්වා දීම තුළින් අනෙකුත් සියලු පහසුකම් සපුරාලීම හරහා ශිල්පීන් ධෛර්යමත් කිරීමට අපේක්ෂිතය. තවද, තෝරා ගත් පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීම, අළෙවි මධ්‍යස්ථාන සමග නිෂ්පාදන මධ්‍යස්ථාන ජාලගත කිරීමට අපේක්ෂිතය.

### 2. පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන විධිමත් කිරීම

තෝරා ගත් පුහුණු මධ්‍යස්ථාන නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීම, අළෙවි මධ්‍යස්ථාන සමඟ නිෂ්පාදන මධ්‍යස්ථාන ජාලගත කිරීම, නිෂ්පාදන මධ්‍යස්ථානයන්හි ගිණුම් හා පොත්පත් තැබීම විධිමත් කිරීම හා පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් විධිමත් පුහුණුලාභීන් බිහි කිරීම හා හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණකරුවා ධෛර්යමත් කර උපරිම නිෂ්පාදනයක් ලබා ගෙන දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය ඉහළ නැංවීම මෙමගින් අපේක්ෂිතය.

### 3. තිරසර සංචාරක ගමනාන්ත ආශ්‍රිත හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය මඟින් පළාත් නවය සඳහා සංචාරක ගමනාන්ත නවයක් යෝජනා කර ඇති අතර ඒ සඳහා සුදුසු සංචාරක ගමන් මාර්ග තීරණය කර ඇත. එම සංචාරක ගමන් මාර්ග ආසන්නයේ පිහිටා ඇති හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කර සංචාරකයින් සඳහා අවශ්‍ය නිර්මාණ ලබා ගැනීම, කර්මාන්තය සිදු කරන ආකාරය දැක ගැනීම හා ප්‍රායෝගිකව නිර්මාණකරණයේ යෙදීමට අවස්ථාව ලබා දීම තුළින් සංචාරකයින් ආකාර්ශනය කර ගැනීමට මෙන්ම දේශීය කර්මාන්තකරුවාට වෙළඳපළ අවස්ථා පුළුල් වීමට හේතු වනු ඇත.

තවද, සංචාරක ගමන් මාර්ගය ආසන්නයේ හස්ත කර්මාන්ත ගම්මාන නොමැති ස්ථානවල හස්ත කර්මාන්ත වීදි (Handicrafts Streets) ස්ථාපිත කර එමගින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල සේවාවන් ලබා දීම ද සිදු කළ හැක.

පළාත් නවය සඳහා සංචාරක ගමන් මාර්ග ආශ්‍රිතව හස්ත කර්මාන්ත ගම්මාන / හස්ත කර්මාන්ත වීදි නවයක් සංවර්ධනය කිරීම.

# 29

# සීමාසහිත ලංකා සළුසල (LSL)

## 29.1 හැඳින්වීම

වර්ෂ 1967 ඔක්තෝම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව ලෙස ස්ථාපනය වූ සළුසල ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ දේශීය නිෂ්පාදනය නගා සිටුවීම හා දේශීය රෙදිපිළි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සැපයීමේ පුරෝගාමියා වීම සහ ශ්‍රී ලංකාව තුළ රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඉහළ තලයකට පැමිණීම සඳහා පූර්ණ සහයෝගය ලබාදීමයි.

මෙහි ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කරගැනීම සඳහා 1991.11.28 වන දින සී/ස ලංකා සළුසල සමාගමක් ලෙස ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව 1991.12.21 වන දින පලකරන ලද ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව වත්කම්, වගකීම් සහ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු මෙම සමාගමට පවරන ලදි.

### අරමුණු

1. නිෂ්පාදන ආශ්‍රිත යටිතල පහසුකම් සහ සැලසුම් සංවර්ධනය සඳහා පහසුකම් සපයන අග්‍රස්ථ රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියා කිරීමෙන්,දේශීය අත්යන්ත්‍ර, බතික් සහ ඇඟලුම් සඳහා වෙළෙඳපොළ අවස්ථා දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයින්ට නිෂ්පාදනය ඉහළ නැංවීමට අවස්ථාවක් උදාකර දෙන අතර, එමඟින් ග්‍රාමීය ආර්ථිකයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ සංවර්ධනයට දායක වේ.

2. පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කර්මාන්ත ශාලා විවෘත කිරීම මගින් මහා පරිමාණ දේශීය නිෂ්පාදන ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් නිල ඇඳුම් ආනයනය සහ අනෙකුත් ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා වැය වන රජයේ මුදල් ඉතිරි කිරීම.

3. රාජ්‍ය අංශයේ සංවිධානවල (B2G) සියලුම රෙදිපිළි, රෙදිපිළි සහ අදාළ අවශ්‍යතාවල එකම සැපයුම්කරු වීම.

4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ශිල්පීන් සඳහා නිෂ්පාදනය සඳහා සහ අනෙකුත් සැපයුම්කරුවන් සඳහාත් කර්මාන්තය තුළ නිෂ්පාදනය සඳහා ඉඩකඩ සැපයීම.

5. දැරිය හැකි මිලකට ගුණාත්මක ද්‍රව්‍ය ලබා දීමෙන් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන් සඳහා වඩාත්ම විශ්වාසදායක සන්නාමය වීම.

6. දේශීය සහ එතෙර වෙළඳපළ නඟා සිටුවීමට සහ නංවාලීමට රෙදිපිළි, ඇඟලුම් සහ බතික් අත්යන්ත්‍ර කර්මාන්ත නියාමනය කිරීමට පෙරමුණ ගැනීම.

7. රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් ඉවත් කිරීම මගින් JV සහ PPP වලට පිවිසීමෙන් කර්මාන්තයේ වෙනසක් ඇති කිරීම.

8. අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා කලාපයේ සහ විදේශීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බතික් අත්යන්ත්‍ර සහ ඇඟලුම් ප්‍රවර්ධනය කිරීම තුළින් රටේ ඩොලර් සංචිත ඉහළ නැංවීම.

## 29.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

- අමාත්‍යාංශය යටතේ බණ්ඩාරනායක සම්මන්ත්‍රන ශාලාවේ ජුනි 22,23,24 හා 25 දින වල පැවති ප්‍රදර්ශනයට සහභාගි වීය.
- ආයතනයට අයත් අම්පාර ගොඩනැගිල්ල සළුසල නාමය ප්‍රවර්ධනය සඳහා කුලි පදනම මත ලබාදීම
- දීර්ඝ කාලයක් තිබු රෙදිපිළි හා යකඩ ද්‍රව්‍ය ටෙන්ඩර් කැඳවා අලෙවි කරන ලදි.
- ආයතනය ප්‍රතිසංවිධාන කිරීම යටතේ නිෂ්පාදන අංශයේ මැෂින් 20 ක් අළුත් වැඩියා කර ඇත.
- ගිණුම්කරණ මෘදුකාංගයකින් ආයතනයේ තොග පාලනය ක්‍රමවත්ව පවත්වා ගැනීම

## 29.3 අනාගත සැලැසුම් - 2023

- සළුසල විදේශීය ශාඛා ඕස්ට්‍රේලියාව සහ චීනයේ විවෘත කිරිම සඳහා ගිවිසුම්ගත විමට අපේක්ෂිතයි.
- සළුසල නිෂ්පාදන රාජ්‍ය හා පුද්ගලික ආයතන ආශ්‍රිතව අලෙවි කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට යෝජිතයි.
- අන්තර්ජාලය හරහා සළුසල නිෂ්පාදන අලෙවි කිරිම
- සළුසල වෙබ් අඩවිය එළිදැක්වීම
- අලෙවි මධ්‍යස්ථාන වල විකුණුම් මාර්ගගතව ඉතා කාර්යක්ෂමව ඉටු කිරීමට අපේක්ෂිතයි.

# 30

# විදාතා මධ්‍යස්ථානය

## 30.1 හැඳින්වීම

විදාතා වැඩසටහන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනවලින් රටේ බිම් මට්ටමේ ජනතාව වෙත විද්‍යාත්මක දැනුම හා තාක්ෂණ පැවරීමේ අරමුණින් ජාතික මට්ටමින් 2000 වර්ෂයේදී ආරම්භ කරන ලදී. විදාතා වැඩසටහන මඟින් නාගරික සහ ග්‍රාමීය ජනතාව අතර තාක්ෂණික පරතරය පිරවීමට පහසුකම් සලසන අතර, රටේ ජාතික ආර්ථිකය මෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අගය එකතු කිරීම තුළින් සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම දිරිගන්වනු ලැබේ.

අංක. 2311/42 සහ 2022.12.22 දිනැති ගැසට් පත්‍රය මගින් විදාතා වැඩසටහන කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට ඒකකයක් ලෙස සම්බන්ධ වෙමින් දිප ව්‍යාප්ත විදාතා සම්පත් මධ්‍යස්ථාන ජාලය (VRCs) මඟින් සිදු කරන තාක්ෂණ පැවරීම් හරහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරී වෙළෙඳපොළ පරිසරය සමඟ කර්මාන්තකරුවන් සම්බන්ධ කිරීම තුළින් මහත් වූ සේවයක් සපයනු ලැබේ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම විදාතා සම්පත් මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන අතර විදාතා ඒකකය යටතේ 967ක් වූ නිලධාරින් පිරිසක් සේවය කරනු ලැබේ.

### අරමුණු

- ග්‍රාමීය ව්‍යවසායකයින් වෙත තාක්‍ෂණික පැවරීම තුලින් දළ දේශීය නිෂ්පාදිතයේ කර්මාන්ත අංශ නියෝජනය ඉහළ නැංවීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) අංශයේ දායකත්වය වැඩි දියුණු කිරීම.
- තාක්ෂණ පැවරීම තුලින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ තරුණ හා කාන්තා ව්‍යවසායක දායකත්වය වැඩි කිරීම.

## 30.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**නිෂ්පාදන පිලිබඳ තාක්ෂණික හුවමාරුව, වැඩිදියුණු කිරීම සහ ප්‍රමිතිකරණය**

විදාතා ඒකකය, ග්‍රාමීය මට්ටමින් වෙළෙඳපොළට ළඟා වන නිෂ්පාදනවල ගුණාත්මක තහවුරු කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සමඟ එක්ව පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික නිකුත් කිරීමට පහසුකම් සපයනු ලැබේ. රට තුළ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නය සපුරාලීම සඳහා නිෂ්පාදන ප්‍රමිතිකරණය වැදගත් වේ.එම ක්‍රියාවලිය නිම කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. 2022/2023 වර්ෂවලදී ආහාර සහ පාන වර්ග, කුළුබඩු ආදී අංශ සඳහා, ගුණාත්මක නිෂ්පාදන පිළිවෙත් (GMP) සහතික 25 ක් සහ විදාතා පද්ධති සහතික (VSC) 01 ක් ඇතුළුව තත්ත්ව පරීක්ෂණ වාර්තා 332 ක් ලබා දී ඇත. 2023 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා රු. මිලියන 15 ක් වෙන් කර ඇත.

**රාජ්‍ය අමාත්‍යතුමන්ගේ සහ ලේකම්තුමියගේ සහභාගීත්වයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ දී පැවැත් වූ තත්ත්ව සහතික ප්‍රදානය කිරීමේ උත්සවය**



**කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් හඳුන්වා දීම**

කර්මාන්තවල නියැලෙන බොහෝ ව්‍යවසායකයින් තම නිෂ්පාදන ක්‍රියාවලියේදී විදුලිය සහ L.P. ගෑස් මිල ඉහළ යාමේ පොදු අභියෝගයකට මුහුණ දෙයි. විදාතා ඒකකය විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස ජීවවායු ඒකක හඳුන්වා දීමට සහාය ලබා දෙන අතර එමඟින් කර්මාන්තකරුවන් ගේ බලශක්ති ගැටළුව සඳහා විසඳුම් ලැබේ. ඒ සඳහා රු.මිලියන 10 ක් 2023 වර්ෂයේදී වෙන් කර ඇති අතර මූලික කටයුතු අවසන් කර ආරම්භ කිරීමට නියමිතය.

**පරිගණක දෘඩාංග සහ ජංගම දුරකථන අලුත්වැඩියාව සිදු කරන ව්‍යවසායකයින් සහ ඒ පිලිබඳ උනන්දුවක් දක්වන තරුණයින් සඳහා පුහුණු වැඩසටහන**

ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ රැකියා සඳහා ඇති ඉහළ ඉල්ලුම සහ දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ තුල පවතින අවස්ථා හේතුවෙන් මෙරට තරුණ ප්‍රජාව මෙම ක්ෂේත්‍රයෙහි රැකියා පිලිබඳ උනන්දුවක් දක්වති. ඔවුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා ශක්තිමත් කිරීමේ අරමුණින් විදාතා ඒකකය නවීන තාක්‍ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) සමඟ එක්ව මෙම පුහුණු වැඩසටහන ආරම්භ කර ඇත. මෙම වැඩසටහන, රු. මිලියන 2ක වියදමින්, 2023 ඔක්තෝබර් 7 වන දින ආරම්භ කිරීමට නියමිත වන අතර 100 දෙනෙකුගෙන් යුත් යොවුන් කණ්ඩායමක් සඳහා ප්‍රතිලාභ අත්වනු ඇත.

**අදායම් උත්පාදන කුඩා කණ්ඩායම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

විදාතා ඒකකය විසින් උනන්දුවක් දක්වන ව්‍යවසායකයින් හට තම කුඩා කණ්ඩායම් ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා, තාක්ෂණ භාවිතය වැඩි දියුණු කිරීම තුලින් සහ ඒ සඳහා ඔවුනට අවස්ථා ලබාදීම තුලින් සහාය ලබාදෙනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලි. 5ක් වෙන් කර ඇති අතර තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ අදාල පුහුණු වැඩසටහන් සිදු කිරීම සඳහා විදාතා සම්පත් මධ්‍යස්ථාන 6 ක් සඳහා රුපියල් 251,000ක ප්‍රතිපාදන යොමුකර ඇත. ව්‍යාපෘති ආරම්භයේ සිට 2023/09/13 දක්වා ව්‍යවසායකයින් 274 දෙනෙකුට ප්‍රතිලාභ අත්වනු ඇත.

### විදාතා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

විදාතා ඒකකය රටේ ආර්ථික වර්ධනය සඳහා ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීම තුලන් දායකත්වය ලබා දෙනු ලැබේ. එබැවින්, තිරසාර ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා උපදේශන සැපයීම, පහසුකම් සැලසීම සහ පුහුණුව ලබාදීම සඳහා ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම පිළිබඳ විදාතා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය වැදගත් වේ. මේ සඳහා 2023 වර්ෂයේ දී රු. මිලි. 3 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඌව, මධ්‍යම සහ දකුණු පළාත්වල විදාතා නිලධාරීන් 112 දෙනෙකු මේ දක්වා පුහුණු කර ඇති අතර ඒ සඳහා රු. 939,224 ක් වැයකරන ලදී. ඉතිරි වැඩමුළු 02 නොවැම්බර් මස වන විට පැවැත්වීමට සැලසුම් කර ඇත.

**විදාතා නිලධාරීන් සඳහා පොල්ගොල්ලේදී පැවැත් වූ ව්‍යාපාර සැලසුම් වැඩමුළුව**



### රෙදිපිළි සහ ඇඟලුම් ව්‍යවසායකයින්ගේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීම

මෙම ඒකකය ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය සමඟ එක්ව රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ නියැළෙන ව්‍යවසායකයින්ට නිෂ්පාදනවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා තාක්ෂණ පුහුණුව ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. මේ සඳහා 2023 වර්ෂයේ රු. මිලියන 2ක් වෙන් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යවසායකයින් 90 දෙනෙකුට ප්‍රතිලාභ ලැබෙනු ඇත. මේ වන විට මූලික කටයුතු අවසන් කර ඇති අතර මෙම කාර්තුවේ ආරම්භ කිරීමට නියමිතය.

### විදාතා සම්පත් මධ්‍යස්ථාන සංවර්ධනය

විදාතා සම්පත් මධ්‍යස්ථාන (VRC) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යවසායකයින් සඳහා සේවා සපයනු ලැබේ. ඵලදායී සේවා සැපයීම සඳහා VRC සඳහා යහපත් වැඩ පරිසරයක් අත්‍යවශ්‍ය වේ. VRC ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මි.18 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර විදාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි 19ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් 11,464,689.38ක් ලබා දී ඇත. ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික ප්‍රගතිය, 100% සම්පූර්ණ කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 3 ක්, 80% සම්පූර්ණ කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 4 ක්, 50% සම්පූර්ණ කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 5 ක් සහ 50% ට අඩුවෙන් සම්පූර්ණ කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 7 ක් වේ. යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීම සහ අත්පත් කර ගැනීම සඳහා රු. මිලි. 6 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර විදාතා සම්පත් මධ්‍යස්ථාන 20 ක උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් 583,300.00 ක් ලබා දී ඇති අතර විදාතා සම්පත් මධ්‍යස්ථාන 6 ක උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් 144,400.00 ක් වෙන් කර ඇත. විදාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලි 8 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර විදාතා සම්පත් මධ්‍යස්ථාන 07 ක් සඳහා කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රුපියල් 335,765 ක් ලබා දී ඇත. මෙම සියලුම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.

### මුහුණ දුන් ගැටළු

- මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක: 02/2023 සහ 2023.02.02 දිනැති චක්‍රලේඛයේ ඇති කොන්දේසි අනුව අක් මුදල් ලබා ගැනීම ප්‍රමාද වීම නිසා නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම.

- නියමිත කාලසීමාව තුළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පාර්ශ්වකාර ආයතනවල සහයෝගීතාව ලබා ගැනීම අභියෝගයක් වීම.

## 30.3 අනාගත සැලැසුම් - 2024

- ග්‍රාමීය ව්‍යවසායකයින්ට උචිත තාක්ෂණයන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම වෙනුවෙන් විදාතා ඒකකය යටතේ වන විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය මගින් තාක්ෂණ පැවරීම් සඳහා සම්පත් සංචිතයක් නිර්මාණය කිරීම.
- කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන, පිරිසිදු කිරීමේ නිෂ්පාදන, බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන, අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදන සහ අනෙකුත් අගය එකතු කළ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ 50% දායකත්වයද සමඟ තාක්ෂණ පැවරීම් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
- SMILE ණය යෝජනා ක්‍රමය යටතේ නව රැකියා අවස්ථා සහ තිරසාර ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීම සඳහා පොල් ආශ්‍රිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය සමඟ එකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස වීදුරු ප්‍රසාරණ තාක්ෂණය සහ අගය එක්කල සැකසුම් සඳහා වියළි මල් තාක්ෂණය යන ක්ෂේත්‍රවල නව තාක්ෂණ පැවරීම තුලින් ආදායම් උත්පාදනය කළ හැකි ව්‍යවසායකයින් බිහි කිරීම.
- Australia Sri Lanka Trade and Investment Framework Arrangements යටතේ ශ්‍රී ලංකාවේ එළවළු, කොළ සහ පලතුරු කල් තබා ගැනීම, විජලනය සහ අගය එකතු කිරීම සඳහා දෙවසරක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. මෙහි සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 1246 කි. වසර 2ක් සඳහා දේශීය අරමුදල් අවශ්‍යතාවය රු. මිලි. 50 කි.
- විභවතාවයන් සහිත ව්‍යවසායකයින් හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම සහ ව්‍යාපෘති යෝජනා ලිවීම යන ක්ෂේත්‍රයන් පිලිබඳව විදාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ කුසලතා ශක්තිමත් කිරීම.

# 31

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)

## 31.1 හැඳින්වීම

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, නියාමනය සහ ප්‍රවර්ධනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත.

ඒ අනුව කර්මාන්තකරුවන් දැනුවත්කිරීම හා මග පෙන්වීම, මැණික් ඉඩම් වෙන්දේසි මගින් රජයේ ඉඩම් වල මැණික් කැණීමේ අයිතිය කර්මාන්තකරුවන් වෙත ලබාදීම, රසායනාගාර සේවා සැලසීම වැනි කටයුතු කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන්ද කැණීම්, වෙළඳ, මැණික් කැණීම් හා මැණික් වෙන්දේසි සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා නිරන්තර අධීක්ෂණය හා වැටලීම් මගින් කර්මාන්තය නියාමනයද දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන වලට ශ්‍රී ලංකාව නියෝජනය , නව වෙළඳපොලවල් කරා කර්මාන්තකරුවන් යොමුකිරීම මගින් ප්‍රවර්ධනය යන කාර්යයන් ද සිදු කරනු ලබයි. මීට අමතරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියුතු සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් ධෛර්යමත් කිරීම, පහසුකම් සැපයීම, ඒ සඳහා අදාළ වන්නාවූ දැනුම වර්ධනය කිරීම යන ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් වලද නිරතව සිටී. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ව්‍යාපාරික ආකෘතිය, ස්වාධීනව නැගීසිට ස්වයං මූල්‍ය ස්ථාවරත්වය සහ රජය තුළ තිරසාර බවින් යුත් අධිකාරිය යන සංකල්පය මත පදනම් වී ඇත.

### ප්‍රධාන අරමුණු

- මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළව වර්ෂ 2027 වන විට මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 2.5 ක් දක්වා වැඩි කිරීම සහ තිරසර මැණික් පතල් කැණීමේ සහ වෙළඳාම් ක්‍රමවේදය සංවර්ධනය.

- මැණික් සහ ස්වර්ණාභරණ කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා වාර්ෂික ජාත්‍යන්තර මට්ටමේ මැණික් වෙන්දේසියක් පැවැත්වීම.

- ශ්‍රී ලංකාවේ ඇති නව මැණික් නිධි ගවේෂණය කර මැණික් කැණීමේ ප්‍රමාණය 50% කින් ඉහළ නැංවීම.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට තරුණ පරපුර ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. ඒ තුළින්, ක්ෂේත්‍රයට පිවිසෙන තරුණ පරපුර 2027 වන විට 20% කින් වර්ධනය කිරීම.

- 2027 වන විට ඇමරිකානු ඩොලර් මිලියන 10 ක දායකත්වයක් පාරම්පරික ස්වර්ණාභරණ ශිල්පීන් මඟින් ලබා ගැනීම.

- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් සිදු කරන මැණික් හා ස්වර්ණාභරණ තක්සේරු කිරීමේ හා පරීක්ෂා කිරීමේ කටයුතු ජාත්‍යන්තර පිළිගැනීමක් ලබාගත හැකි තත්වයට උසස් කිරීම.

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 14 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කාර්යභාරය පහත පරිදි වේ.

- සංවර්ධනය සහ ප්‍රවර්ධනය
- නියාමනය සහ බලාත්මක කිරීම
- පර්යේෂණ සහ නවෝත්පාදනය
- සමාජීය සහ පාරිසරික වගකීම
- පුහුණුව සහ හැකියාවන් සංවර්ධනය

## 31.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය

**ලාභ ඉපයීම්**

| විස්තරය (රු.මි) | ප්‍රගතිය |
|---|---|
| ආදායම | 878.96 |
| වියදම | 450 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 428.96 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**අධිකාරියේ විවිධ ආදායම් ප්‍රභවයන්**

| විස්තරය | ඉලක්කය (රු.මි) | ආදායම (රු.මි) | ප්‍රගතිය % |
|---|---|---|---|
| අපනයන සේවා ගාස්තු අදායම | 204.63 | 201.95 | 99% |
| මැණික් ගැරීම් බලපත්‍ර | 34.39 | 65.69 | 191% |
| වෙළඳ බලපත්‍ර | 80.44 | 74.82 | 93% |
| මැණික් කැපුම් බලපත්‍ර | 0.225 | 0.27 | 120% |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 1.60 | 2.43 | 152% |
| වැටලීම් | 11.64 | 24.95 | 214% |
| ඉඩම් වෙන්දේසි | 139.45 | 232.74 | 167% |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම | 24.00 | 21.12 | 88% |
| මැණික් රසායනාගාරය | 15.67 | 11.18 | 71% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 21.31 | 32.36 | 152% |
| උපදේශන සේවා සැපයීම - දේශීය | 27.20 | 21.99 | 81% |
| යාන්ත්‍රික මැණික් ගැරීමේ අනුමැතිය | 38.82 | 113.39 | 292% |
| වෙනත් ආදායම් | 47.38 | 15.16 | 32% |
| ශුද්ධ මූල්‍ය ආදායම | 89.25 | 60.91 | 68% |
| මුළු ආදායම | 736.01 | 878.96 | 119% |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති ප්‍රතිඅපනයන ආදායම් (ඇ.ඩො.මි)**

| මුළු අපනයන (ඇ.ඩො.මි) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් | 354 | 146.33 |
| ස්වර්ණාභරණ | 27 | 8.95 |
| දියමන්ති ප්‍රතිඅපනයන | 214 | 201.18 |
| රළු ආනයන ප්‍රතිඅපනයන (මැණික්) | 5 | 2.88 |
| රළු ආනයන ප්‍රතිඅපනයන ( ස්වර්ණාභරණ) | 1 | 0.6 |
| දියමන්ති එබ්බවූ ස්වර්ණාභරණ | 6 | 1.29 |
| ගෙවුඩ/ගෙවුඩ කට්ට | - | 0.04 |
| රළු නොවන ගෙවුඩ | - | 0.01 |
| මුළු අපනයන | 607 | 361.28 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**විවිධ රසායනාගාර පහසුකම් සැපයීම**

| | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් රසායනාගාරය (සහතිකපත් ප්‍රමාණය) | 10,288 | 7,176 |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම (පරික්ෂා කළ අයිතම ප්‍රමාණය) | 53,175 | 23,784 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**විවිධ බලපත්‍ර නිකුත් කිරීම**

| බලපත්‍ර වර්ගය (නිකුත්කරණ ලද බලපත්‍ර සංඛ්‍යාව) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් ගැරීම් බලපත්‍ර | 4,310 | 6,041 |
| වෙළඳ බලපත්‍ර මැණික් | 4,944 | 5,439 |
| කැපුම් බලපත්‍ර මැණික් | 195 | 142 |
| වෙන්දේසි බලපත්‍ර | 535 | 884 |
| වැටලීම් (සිදුකරන ලද වැටලීම් ප්‍රමාණය) | 1,060 | 2,058 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**සංවර්ධන ව්‍යාපෘති**

**රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් කුළුණ**

- රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය 2023 දෙසැම්බර් මස අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට නියමිතය.
- මෙම ගොඩනැගිල්ල රුපියල් මිලියන 450 ක පමණ වියදමක් දරා ඉදිකර ඇති අතර මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගමනය මෙයින් අපේක්ෂා කෙරේ.
- මෙම ගොඩනැගිල්ල තුල අපනයන මධ්‍යස්ථානයක්, අංග සම්පූර්ණ මැණික් රසායනාගාරයක් පිහිටවනු ලබන අතර අපනයන සිදු කිරීමට අවශ්‍ය ශ්‍රී ලංකා රේගුව ඇතුලු ආයතන වල සහය මගින් අපනයන කරුවන්ට පහසුකම් ලබාදීමට නියමිතය.
- මෙහි දේශීය මෙන්ම විදේශීය මැණික් සහ ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන් සඳහා මැණික් මිලදී ගැනීමේ සහ අලෙවි කිරීමේ අලෙවි කුටි 27 ක් ඉදිකර ඇත.

**රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් කුළුණ ඉදිකිරීම**



## 31.3 අනාගත සැලැසුම් - 2024

- සියලු පුද්ගලික රසායනාගාර ලියාපදිංචිය සඳහා වන පනත ක්‍රියාත්මක කර රසායනාගාර ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රයක් ලබාදීම.

- කොළඹ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම.

- ජාත්‍යාන්තර ප්‍රදර්ශන වලදී ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම.

- ඉහළ අපනයන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින වෙළඳපොලවල් පුළුල් කිරීම හා නව වෙළඳපොළවල් සඳහා ප්‍රවිෂ්ඨ වීම.

- ස්වර්ණාභරණ හා රිදී නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් නගා සිටුවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ස්වර්ණාභරණ ගම්මාන ඇති කිරීම. (ගාල්ල නුවර, වෑබඩ, සියඹලාපෙ, හික්කඩුව)

- ස්වර්ණාභරණ ශිල්පින්ට ජාත්‍යන්තර ප්‍රදර්ශන නැරඹීම සඳහා අවස්ථාව ලබාදිම.

- විදේශිකයින් සඳහා කපා ඔපදමන මැණික් වෙළඳාමට පහසුකම් සැලසීම.

- ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා දේශිය වෙළඳපොළ අවකාශය විවෘත කිරීම අරමුණු කොට ජංගම පොළක් 2024 වර්ෂයේ සිට පැවැත්වීමට සැළසුම් කර ඇත.

- ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා විදේශීය පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.

- අන්තර්ජාතික වශයෙන් කර්මාන්තය දියුණු කිරීම උදෙසා Facets Sri Lanka, Gem Sri Lanka සහ Jewels ප්‍රදර්ශනයන් සඳහා අනුග්‍රාකත්වය ලබාදීම සහ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කිරීම.

# 32

# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

## 32.1 හැඳින්වීම

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 1950 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ අංක 25(I) වගන්තිය ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය පාලනය කිරීම, නඟා සිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා පුහුණු හා පර්යේෂණ පහසුකම් සැලසීමේ පරමාර්ථයෙන් මෙම ආයතනය ස්ථාපනය කර ඇත.

**ආයතනය වෙත පැවරී ඇති බලතල**

- ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ පිළිබඳ සමීක්ෂණයක් කිරීම.
- පිහිටීම, හඳුනාගැනීම, මැණික් ගල් අනර්ඝීකරණය කිරීමේ ක්‍රම, වෙනත් අදාළ ක්ෂේත්‍රයන් හා අදාළ රත්නවිද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම.
- පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිලිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවිධානය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

- මැණික් කැපීම, ස්වර්ණාභරණ සැදීම, දියමන්ති ඇතුළු රත්නවිද්‍යාව, ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම, මැණික් ගල් අනර්ගීකරණය, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙත් අදාළ අංශ පිළිබඳව පුහුණුව ලබා දීම
- වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අදාළ මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පළ කිරීම.
- ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසුකිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.

## 32.2 ප්‍රගතිය 2023 සැප්තැම්බර් මස අවසානයට

**ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ මැණික් විභවතාව පිළිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතියක් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය හරහා ක්ෂේත්‍ර ගවේෂණය, නියැදි ලබාගැනීම, විද්‍යාගාර අධ්‍යයනය සහ ප්‍රතිඵල විශ්ලේෂණය අනුව **පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට** අදාළ මූලික මැණික් විභව සිතියම නිර්මාණය කර ඇත.

| | |
|---|---|
|  ඉංගිරිය මූලික මැණික් විභව සිතියම |  දෙහිඕවිට මූලික මැණික් විභව සිතියම |

එසේම මේ වන විට **ඉංගිරිය, දෙහිඕවිට හා අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ** ආශ්‍රිතවද මැණික් නිධි ගවේෂණ කටයුතු ආරම්භ කර ඇත.

**මැණික්මය ගුණාංග අඩු ඛණිජ සඳහා අගය ඉහල නැංවීමට නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුනා ගැනීම.**

- රූටයිල් අපද්‍රව්‍ය ඛණිජ ඉතා බහුලව පවතින ගෙවුඩ ඉතා සාර්ථකව පාලීය තත්වය යටතේ විදුලි උඳුන ආධාරයෙන් තාප පිරියම් කිරීම සඳහා ප්‍රසස්ථ තත්ව අනාවරණය කර ගන්නා ලදි.

| | | |
|---|---|---|
|  |  |  |
| *තාප පිරියම් කිරීමට පෙර* | *1700°C ඔක්සිකාරක තත්ව යටතේ* | *1700°C/ රික්තයක් යටතේ* |

- අප්‍රිකානු රූබි වල නිල් වර්ණය ගැමා ප්‍රතිකර්මය මඟින් ඉවත් කිරීම පිළිබඳව අධ්‍යනයන් සාර්ථකව සිදුකරන ලදි.

| | |
|---|---|
|  |  |
| *ගැමා පිරියම් කිරීමට පෙර* | *ගැමා පිරියම් කිරීමට පසු* |

- ඉහළ තාපකරණ තත්ත්ව යටතේ නයිට්‍රජන් වායුව ලබා දීම හරහා යං ගෙවුඩ ඛණිජයෙහි පරමාණු වෙත දැඩි පීඩනයක් ඇති කිරීම මඟින් එහි නිල් වර්ණය ඉතා සාර්ථකව ඉහල නැංවිය හැකි බව අනාවරණය කර ගන්නා ලදි.

| *Samples Name* | *TG 41/4* | *TG 43/4* | *TG 45/4* | *TG 50/4* |
|---|---|---|---|---|
| *පිරියම් කිරීමට පෙර* |  |  |  |  |
| *නයිට්‍රජන් සමඟ පිරියම් කිරීමට පසු* |  |  |  |  |

- ගෙවුඩ කිරිංචි තාප පිරියම් කිරීම පිළිබඳ අධ්‍යනය කරමින් පවති.

**ශ්‍රී ලංකාවේ මැණික් ගල්වල පවතින පළුදු පිරවීම සඳහා සුදුසු තෙල් වර්ග හඳුන්වා දීම**

කුරුවින්ද කුලයේ මැණික්වල පවතින පළුදු පිරවීම සඳහා සුදුසුවන දියරයක් ලෙස ග්ලිසරින් සුදුසු බව හඳුනාගන්නා ලදී. එමඟින් කහ කුරුවින්ද මැණික්වල විනිවිදභාවය හා අලංකාරය වැඩිදියුණු කිරීමට හැකිවිය. මෙම පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකව පවතී.

*ප්‍රතිකාර කිරීමට පෙර හා පසු*





**ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා අඩු වියදම් වර්ණ රන් මිශ්‍ර ලෝහයක් හඳුන්වා දීම**

මේ වන විට නැනෝ තාක්ෂණය යොදාගෙන රක්ත වර්ණ රත්‍රං නැනෝ අංශ නිපදවා ඇත. ඒ හරහා මිශ්‍ර වර්ණ ලෝහ සෑදීමේ පර්යේෂණ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී.

*වර්ණ මිශ්‍ර ලෝහ නැනෝ අංශු සෑදීම*







**ශ්‍රී ලාංකේය පාරම්පරික ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය පිළිබඳ නාමාවලියක් සකස් කිරීම**

මේ සඳහා අවශ්‍ය වන පාරම්පරික ස්වර්ණාභරණ මෝස්තර සඳහා තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා කෞතුකාගාර දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට පාරම්පරික ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ අධ්‍යනය කරමින් ඒවා පිටපත් කිරීම ආරම්භ කර ඇත.

*පිටපත් කරන ලද පාරම්පරික ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ*



**නිෂ්පාදන විවිධාංගීකරණය හා නව තාක්ෂණය බෙදාහැරීම**

- "Sri Lankan Gem Mining Industry for a Sustainable Era" කෘතියේ ඉංග්‍රීසි පිටපත මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

***"Sri Lankan Gem Mining Industry for Sustainable Era" ග්‍රන්ථය***




- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය තුළ හඳුනාගත් නව සොයාගැනීම් ක්ෂේත්‍රය තුල ප්‍රචාරණය සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක් 2023.10.25 දින පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතී.

*පර්යේෂණ සම්මන්ත්‍රණ දැන්වීම*




- උසස් හා ප්‍රමිතියෙන් යුතු මැණික් විශ්ලේෂණ වාර්තා ලබා දීම අරමුණු කරගනිමින් අප ආයතනයේ අධිතාක්ෂණික විශ්ලේෂණ විද්‍යාගාරය සඳහා ISO17025 ප්‍රමිතිකරණය යටතේ විද්‍යාගාර ප්‍රතීතනය සඳහා කටයුතු ක්‍රියාත්මකව පවතී.

**තාක්ෂණික සේවා ලබා දීම**

- බාහිර පුද්ගලයන් සඳහා ගෙවුඩ තාප කරණ සේවාවන් 13 ක් ලබාදී ඇත.
- රසායනාගාර විශ්ලේෂණ සේවා 71 ක් ලබාදී ඇත.
- පෞද්ගලික ඉඩම් සඳහා සමීක්ෂණ සේවා 03 ක් ලබා දී ඇත.

**මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ රැකියා පාදක වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.**

කර්මාන්තයේ පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම වෙනුවෙන් 2023 ක්‍රියාකාරී වර්ෂයේ පුහුණු පාඨමාලා සඳහා සැලසුම් කළ පුහුණුලාභීන් 1130 ක සංඛ්‍යාවෙන් 2023 සැප්තැම්බර් වන විට පුහුණු ලාභීන් 1226 ක් සාර්ථකව බඳවා ගනිමින් 100% ට වැඩි ප්‍රගතියක් ලබා ඇත. මෙම ප්‍රගතිය කඩුවෙල ප්‍රධාන මධ්‍යස්ථානය ප්‍රමුඛ සෙසු ප්‍රාදේශිය මධ්‍යස්ථාන දොළහක පාඨමාලා හරහා ලබාගෙන ඇත.

**පුහුණු පාඨමාලා ව්‍යාප්ත කිරීම**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග ඒකාබද්ධව දීපව්‍යාප්ත පුහුණු ප්‍රාදේශීය මධ්‍යස්ථාන බිහි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රත්නවිද්‍යාව, ස්වර්ණාභරණ නිෂ්පාදනය මැණික් කැපීම් පුහුණු ඒකක සහිත අංගසම්පූර්ණ ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් බදුල්ලේ ස්ථාපිත කිරීම. ස්වර්ණාභරණ නිෂ්පාදන පුහුණු ඒකකයක් සහිත පුහුණු මධ්‍යස්ථානයක් ගම්පොල ස්ථාපිත කිරීම. එමෙන්ම මරදාන තාක්ෂණික විද්‍යාලය තුල මැණික් කැපුම් පුහුණු ඒකකයක් ස්ථාපනයට කටයුතු කිරීම. නිවිතිගල පුහුණු මධ්‍යස්ථානය මැණික් කැපීම හා ගෙවුඩ තාප පිරියම් කිරීමේ පාඨමාලා නොමිලේ පැවැත්වීම සඳහා නැවත ආරම්භ කිරීම.

**විශ්ව විද්‍යාල සහ වෘත්තීය අධ්‍යාපන ආයතන සමඟ අනුබද්ධව අධ්‍යයන කටයුතු පවතවාගෙන යාම**

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අවශ්‍ය උසස් වෘත්තියවේදීන් බිහිකිරීම සඳහා ක්ෂේත්‍රයේ පාඨමාලා උපාධි මට්ටම දක්වා සංවර්ධනයට අවශ්‍ය කටයුතු ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමග ඒකාබද්දව ආරම්භ කර ඇත. එහි විෂය නිර්දේශ සංවර්ධනය සඳහා මූලික සාකච්ඡා පවත්වා ඊට අවශ්‍ය කර්මාන්ත සමීක්ෂණය පැවැත්වීම හා යෝජනාවලිය සකස් කර ඇත.

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ), ක්ෂේත්‍රයට අදාලව සකස් කිරිමට අවශ්‍ය කටයුතු තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව, තාක්ෂණ විශ්ව විද්‍යාලය හා ආධුනිකත්ව පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව ආරම්භ කර ඇත.

ඒ අනුව ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය (NVQL 4) ට අදාල ජාතික නිපුනතා සම්මත හා විෂය නිර්දේශ සංවර්ධනය අවසන් කරන ලද අතර රත්නවිද්‍යාව (NVQL 4)/(NVQL 5) හා මැණික් කැපිම සහ ඔප දැමීම (NVQL 5) ක්ෂේත්‍රයන්ට අදාලව විෂය නිර්දේශ සංවර්ධනය කිරීමට හා ජාතික කුසලතා ප්‍රමිතීන් සකස් කිරිමට කටයුතු ආරම්භ කර ඇත.

**නිෂ්පාදන ගම්මාන කේන්ද්‍ර කරගනිමින් තාක්ෂණික වැඩමුළු පැවැත්වීම.**

නිවිතිගල විවිධ සේවා සමුපකාර සංගමය සේවකයන් ඇතුළු බැංකුකරුවන් සඳහා ව්‍යාජ රන් අභරණ හඳුනාගැනීම සඳහා ස්වර්ණාභරණ ප්‍රමිතිකරණය හා තත්‍යාංකනය තාක්ෂණික වැඩමුළුව රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානටය දී පවත්වන ලදී.
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යන් සඳහා දින 5 මැණික් කැපුම් තාක්ෂණය පිලිබඳ වැඩමුළු පැවැත්වීම.

**ව්‍යවසායකත්වය සංවර්ධනය හා සිසුන් රැකියාගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එකාබද්ධව ව්‍යවසායකත්ව සංවර්ධනය පිලිබඳ තාක්ෂණික වැඩමුළුවක් කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාරිකයන් වෙත පවත්වන ලදී.

**පුහුණු අංශය සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම**

පුහුණු අංශයේ පාඨමාලා සඳහා සහභාගිවන සිසුන් ගේ දත්ත කළමනාකරණය හා ඒ ආශ්‍රිත වාර්තාවල නිරවද්‍යාභාවය වැඩි කිරීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) මේ වනවිට භාවිතා කරන මෘදුකාංගය ලබාගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර ඊට අදාල පුහුණු සැසි පැවැත්වීම හා අවබෝධතා ගිවිසුම සැකසීම මේ වන විට සිදුකර ඇත.

## 32.3 අනාගත සැලැසුම් - 2024

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාල උපාධි පාඨමාලා හඳුන්වාදීම.
- 2024 වර්ෂය සඳහා ශිල්පීන් 1260 ක් කර්මාන්ත ගත කිරීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා මෙහෙයවීම
- පාඨමාලා අවසන් කරන සිසුන් කර්මාන්තය තුල කාර්යසත්ත පුහුණුව සඳහා යොමු කිරීම හා රැකියා ගත කිරීම.
- වෙළඳපොල සමීක්ෂණ පැවැත්වීම මඟින් සාම්ප්‍රදායික නිෂ්පාදන ගම්මාන හඳුනා ඒ සඳහා තාක්ෂණික වැඩමුළු පැවැත්වීම.
- ලග්ගල, අකුරැස්ස ආශ්‍රිතව නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම
- පුහුණු පාඨමාලා පිළිබඳ පුළුල් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ විදේශ සේවා නියුක්ති කාර්යංශය සමඟ ඒකාබද්ධව නිෂ්පාදන අපනයනය හා විදේශ රැකියා සඳහා යොමු කිරීමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- තොරතුරු කළමණාකරණ පද්ධතියක් හඳුන්වාදීම හා එය ඉදිරියේදී ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව ව්‍යාපෘතිය හොරණ, නිවිතිගල හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කිරීම.
- නවීන තාක්ෂණික ක්‍රම භාවිතයෙන් ගුණාත්මක බවින් අඩු මැණික්වල වටිනාකම වැඩි කිරීම සඳහා නව ක්‍රමවේද හඳුනා ගැනීම.
- තෙවන වායුවක් භාවිතයෙන් නිල් මැණික්වල වර්ණ වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තය සඳහා අඩු වියදම් වර්ණ රත්‍රං මිශ්‍ර ලෝහයක් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ස්වර්ණාභරණ මෝස්තර පිළිබඳ නාමාවලියක් හඳුන්වා දීම
- ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම
- පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- ISO 17025 යටතේ රසායනාගාර ප්‍රතීතනය කිරීම
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තුළ තාක්ෂණික භාවිතය හා ශ්‍රමික කුසලතා හිඟය හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම.

# මූල්‍ය ප්‍රගතිය

## 1. වැය ශීර්ෂය 149 : කර්මාන්ත අමාත්‍යාංශය
## අයවැය ඇස්තමේන්තුව සහ වියදම 2023 (2023.09.30 දක්වා)

වැඩසටහන : **01 මෙහෙයුම් වැඩසටහන**
ව්‍යාපෘතිය : **01 අමාත්‍ය කාර්යාලය**

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව 2023 (රු.) | වියදම 30.09.2023 (රු.) | ශේෂය (රු.) | වියදම % |
|---|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **34,325,760.00** | **24,421,410.85** | **9,904,349.15** | **71%** |
| **0** | 1001 | වැටුප් හා වේතන | 20,200,000.00 | 16,220,553.21 | 3,979,446.79 | 80% |
| **0** | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 7,026,880.00 | 2,601,628.02 | 4,425,251.98 | 37% |
| **0** | 1003 | වෙනත් දීමනා | 7,098,880.00 | 5,599,229.62 | 1,499,650.38 | 79% |
| | | | | | | |
| | | **ගමන් වියදම්** | **9,801,000.00** | **2,695,375.93** | **7,105,624.07** | **28%** |
| **0** | 1101 | දේශීය | 4,161,000.00 | 2,213,269.00 | 1,947,731.00 | 53% |
| **0** | 1102 | විදේශීය | 5,640,000.00 | 482,106.93 | 5,157,893.07 | 9% |
| | | | | | | |
| | | **සැපයීම්** | **46,613,020.00** | **19,391,162.74** | **27,221,857.26** | **42%** |
| **0** | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 5,154,000.00 | 783,640.00 | 4,370,360.00 | 15% |
| **0** | 1202 | ඉන්ධන | 39,959,020.00 | 18,607,522.74 | 21,351,497.26 | 47% |
| **0** | 1203 | ආහාරපාන හා නිළ ඇඳුම් | 1,500,000.00 | - | 1,500,000.00 | 0% |
| | | | | | | |
| | | **නඩත්තු වියදම්** | **10,413,024.00** | **6,760,237.21** | **3,652,786.79** | **65%** |
| **0** | 1301 | වාහන | 8,634,864.00 | 6,379,152.86 | 2,255,711.14 | 74% |
| **0** | 1302 | යන්ත්‍ර හා යන්තෝපකරණ | 1,478,580.00 | 377,462.35 | 1,101,117.65 | 26% |
| **0** | 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 299,580.00 | 3,622.00 | 295,958.00 | 1% |
| | | | | | | |
| | | **ගිවිසුම්ගත සේවා** | **14,207,780.00** | **2,016,827.84** | **12,190,952.16** | **14%** |
| **0** | 1401 | ප්‍රවාහන | 3,771,980.00 | 35,900.00 | 3,736,080.00 | 1% |
| **0** | 1402 | තැපැල් සහ සන්නිවේදන | 3,760,000.00 | 1,062,487.71 | 2,697,512.29 | 28% |
| **0** | 1403 | විදුලිය හා ජලය | 4,042,500.00 | 741,196.13 | 3,301,303.87 | 18% |
| **0** | 1409 | වෙනත් | 2,633,300.00 | 177,244.00 | 2,456,056.00 | 7% |
| | | | | | | |
| | | **මාරු කිරීම්** | **1,500,000.00** | **752,508.23** | **747,491.77** | **50%** |
| **0** | 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 1,500,000.00 | 752,508.23 | 747,491.77 | 50% |
| | | | | | | |
| | | **මුළු පුනරාවර්තන වියදම** | **116,860,584.00** | **56,037,522.80** | **60,823,061.20** | **48%** |
| | | | | | | |
| | | **<u>මූලධන වියදම්</u>** | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | **11,100,000.00** | **7,998,462.24** | **3,101,537.76** | **72%** |
| **0** | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,500,000.00 | - | 1,500,000.00 | 0% |
| **0** | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,500,000.00 | - | 1,500,000.00 | 0% |
| **0** | 2003 | වාහන | 8,100,000.00 | 7,998,462.24 | 101,537.76 | 99% |
| | | | | | | |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **600,000.00** | **-** | **600,000.00** | **0%** |
| **0** | 2102 | ගෘහ භාණ්ඩ කාර්යාලීය උපකරණ | 300,000.00 | - | 300,000.00 | 0% |
| **0** | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000.00 | - | 300,000.00 | 0% |
| | | | | | | |
| | | **මුළු මූලධන වියදම** | **11,700,000.00** | **7,998,462.24** | **3,701,537.76** | **68%** |
| | | | | | | |
| | | **මුළු එකතුව** | **128,560,584.00** | **64,035,985.04** | **64,524,598.96** | **50%** |

වැඩසටහන : **01 මෙහෙයුම් වැඩසටහන**
ව්‍යාපෘත්ය : **02 පරිපාලන හා ආයතන සේවා**

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව 2023 (රු.) | වියදම 30.09.2023 (රු.) | ශේෂය (රු.) | වියදම % |
|---|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **266,974,000.00** | **136,585,970.48** | **130,388,029.52** | **51%** |
| **0** | 1001 | වැටුප් හා වේතන | 175,100,000.00 | 88,329,239.33 | 86,770,760.67 | 50% |
| **0** | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 9,144,000.00 | 4,299,315.79 | 4,844,684.21 | 47% |
| **0** | 1003 | වෙනත් දීමනා | 82,730,000.00 | 43,957,415.36 | 38,772,584.64 | 53% |
| | | **ගමන් වියදම්** | **9,105,860.00** | **4,136,637.24** | **4,969,222.76** | **45%** |
| **0** | 1101 | දේශීය | 3,645,880.00 | 1,211,546.00 | 2,434,334.00 | 33% |
| **0** | 1102 | විදේශිය | 5,459,980.00 | 2,925,091.24 | 2,534,888.76 | 54% |
| | | **සැපයීම** | **67,837,800.00** | **28,040,055.25** | **39,797,744.75** | **41%** |
| **0** | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 17,758,900.00 | 6,946,717.33 | 10,812,182.67 | 39% |
| **0** | 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 45,979,140.00 | 20,973,057.92 | 25,006,082.08 | 46% |
| **0** | 1203 | ආහාරපාන හා නිළඇඳුම් | 599,760.00 | 116,000.00 | 483,760.00 | 19% |
| **0** | 1205 | වෙනත් | 3,500,000.00 | 4,280.00 | 3,495,720.00 | 0% |
| | | **නඩත්තු වියදම්** | **47,917,860.00** | **20,231,582.33** | **27,686,277.67** | **42%** |
| **0** | 1301 | වාහන | 32,668,580.00 | 12,982,555.81 | 19,686,024.19 | 40% |
| **0** | 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,882,660.00 | 4,863,890.88 | 1,018,769.12 | 83% |
| **0** | 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 9,366,620.00 | 2,385,135.64 | 6,981,484.36 | 25% |
| | | **ගිවිසුම්ගත සේවා** | **148,046,272.00** | **56,332,955.48** | **91,713,316.52** | **38%** |
| **0** | 1401 | ප්‍රවාහන | 13,070,000.00 | 5,313,371.93 | 7,756,628.07 | 41% |
| **0** | 1402 | තැපැල් සහ සන්නිවේදන | 10,846,292.00 | 4,666,224.80 | 6,180,067.20 | 43% |
| **0** | 1403 | විදුලිය හා ජලය | 34,236,380.00 | 18,830,447.70 | 15,405,932.30 | 55% |
| **0** | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 54,000,000.00 | 9,400,398.00 | 44,599,602.00 | 17% |
| **0** | 1408 | කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම | 5,200,000.00 | 4,001,737.78 | 1,198,262.22 | 77% |
| **0** | 1409 | වෙනත් | 30,693,600.00 | 14,120,775.27 | 16,572,824.73 | 46% |
| | | **මාරුකිරීම්** | **24,800,000.00** | **17,166,840.41** | **7,633,159.59** | **69%** |
| **0** | 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 800,000.00 | 76,176.00 | 723,824.00 | 10% |
| **0** | 1505 | සම්මාදම් දායක මුදල් | 20,000,000.00 | 16,326,146.08 | 3,673,853.92 | 82% |
| **0** | 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොළී | 3,900,000.00 | 764,518.33 | 3,135,481.67 | 20% |
| **0** | 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000.00 | - | 100,000.00 | 0% |
| | | **මුළු පුනරාවර්තන වියදම** | **564,681,792.00** | **262,494,041.19** | **302,187,750.81** | **46%** |
| | | **මූලධන වියදම්** | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **54,700,000.00** | **4,693,112.23** | **50,006,887.77** | **9%** |
| **0** | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 37,000,000.00 | - | 37,000,000.00 | 0% |
| **0** | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,700,000.00 | 31,270.00 | 1,668,730.00 | 2% |
| **0** | 2003 | වාහන | 16,000,000.00 | 4,661,842.23 | 11,338,157.77 | 29% |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **4,500,000.00** | **1,100,644.00** | **3,399,356.00** | **24%** |
| **0** | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 2,500,000.00 | 744,694.00 | 1,755,306.00 | 30% |
| **0** | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 355,950.00 | 1,644,050.00 | 18% |
| | | **ධාරිතා සංවර්ධනය** | **3,700,000.00** | **561,902.00** | **3,138,098.00** | **15%** |
| **0** | 2401 | කාර්යය මණ්ඩල පුහුණු | 3,700,000.00 | 561,902.00 | 3,138,098.00 | 83% |
| | | **මුළු මූලධන වියදම** | **62,900,000.00** | **6,355,658.23** | **56,544,341.77** | **10%** |
| | | **මුළු එකතුව** | **627,581,792.00** | **268,849,699.42** | **358,732,092.58** | **43%** |

වැඩසටහන : **02** සංවර්ධන වැඩසටහන

ව්‍යාපාතිය : **03** කාර්මික සංවර්ධනය

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව 2023 (රු.) | වියදම 30.09.2023 (රු.) | ශේෂය ( රු.) | වියදම % |
|---|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **338,290,000.00** | **241,816,104.20** | **96,473,895.80** | **71%** |
| 1 | 1001 | වැටුප් හා වේතන | 228,000,000.00 | 166,510,068.97 | 61,489,931.03 | 73% |
| 1 | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,290,000.00 | 1,189,329.80 | 2,100,670.20 | 36% |
| 1 | 1003 | වෙනත් දීමනා | 107,000,000.00 | 74,116,705.43 | 32,883,294.57 | 69% |
| | | **ගමන් වියදම්** | **3,200,000.00** | **2,773,492.36** | **426,507.64** | **87%** |
| 1 | 1101 | දේශීය | 2,200,000.00 | 1,864,330.80 | 335,669.20 | 85% |
| 1 | 1102 | විදේශීය | 1,000,000.00 | 909,161.56 | 90,838.44 | 91% |
| | | **සැපයීම්** | **10,408,000.00** | **7,933,947.25** | **2,474,052.75** | **76%** |
| 1 | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 4,230,000.00 | 2,133,468.83 | 2,096,531.17 | 50% |
| 1 | 1202 | ඉන්ධන සහලිහිසි තෙල් | 6,050,000.00 | 5,672,478.42 | 377,521.58 | 94% |
| 1 | 1203 | ආහාරපාන හා නිළ ඇදුම් | 128,000.00 | 128,000.00 | - | 100% |
| | | **නඩත්තු වියදම්** | **8,210,000.00** | **4,315,924.40** | **3,894,075.60** | **53%** |
| 1 | 1301 | වාහන | 5,600,000.00 | 2,936,618.49 | 2,663,381.51 | 52% |
| 1 | 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,500,000.00 | 1,029,125.91 | 470,874.09 | 69% |
| 1 | 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,110,000.00 | 350,180.00 | 759,820.00 | 32% |
| | | **ගිවිසුම්ගත සේවා** | **23,692,000.00** | **12,957,539.48** | **10,734,460.52** | **55%** |
| 1 | 1401 | ප්‍රවාහන | 2,500,000.00 | 2,395,383.87 | 104,616.13 | 96% |
| 1 | 1402 | තැපැල් සහ සන්නිවේදනය | 3,150,000.00 | 1,400,919.12 | 1,749,080.88 | 44% |
| 1 | 1403 | විදුලිය සහ ජලය | 2,820,000.00 | 442,961.89 | 2,377,038.11 | 16% |
| 1 | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 5,500,000.00 | 2,513,401.64 | 2,986,598.36 | 46% |
| 1 | 1409 | වෙනත් | 9,722,000.00 | 6,204,872.96 | 3,517,127.04 | 64% |
| | | **මාරුකිරීම්** | **2,500,000.00** | **1,248,698.52** | **1,251,301.48** | **50%** |
| 1 | 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 100,000.00 | - | 100,000.00 | 0% |
| 1 | 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොළී | 2,400,000.00 | 1,248,698.52 | 1,151,301.48 | 52% |
| | | **මුළු පුනරාවර්තන වියදම** | **386,300,000.00** | **271,045,706.21** | **115,254,293.79** | **70%** |
| | | **මූලධන වියදම්** | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **5,000,000.00** | **879,525.00** | **4,120,475.00** | **18%** |
| 1 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | - | 500,000.00 | 0% |
| 1 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 334,500.00 | 165,500.00 | 67% |
| 1 | 2003 | වාහන | 4,000,000.00 | 545,025.00 | 3,454,975.00 | 14% |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **2,000,000.00** | **-** | **2,000,000.00** | **0%** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,000,000.00 | - | 1,000,000.00 | 0% |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | - | 1,000,000.00 | 0% |
| | | **ධාරිතා සංවර්ධනය** | **1,000,000.00** | **18,750.00** | **981,250.00** | **2%** |
| 1 | 2401 | කාර්යය මණ්ඩල පුහුණු. | 1,000,000.00 | 18,750.00 | 981,250.00 | 2% |
| | | **මුළු මූලධන වියදම** | **8,000,000.00** | **898,275.00** | **7,101,725.00** | **11%** |
| | | **මුළු එකතුව** | **394,300,000.00** | **271,943,981.21** | **122,356,018.79** | **69%** |

වැඩසටහන : 02 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය : 04 සංවර්ධන වැඩසටහන් සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව **2023** (රු.) | වියදම **30.09.2023** (රු.) | ශේෂය (රු.) | වියදම **%** |
|---|---|---|---|---|---|---|
| | | <u>මූලධන වියදම්</u> | **3,000,000,000.00** | **1,875,749,615.14** | **1,124,250,384.86** | **63%** |
| **16** | 2302 | පාරිසරික හිතකාමී විසදුම සඳහා චක්‍රීය අරමුදල ( ශ්‍රී ලංකා රජය/ ජයිකා ආයතනය) ණය දීම පිළිබඳව | 396,000,000.00 | 116,918,000.00 | 279,082,000.00 | **30%** |
| **16** | 2509 | පාරිසරික හිතකාමී විසඳුම සඳහා චක්‍රීය අරමුදල (ශ්‍රී ලංකා රජය/ ජයිකා ආයතනය) වෙනත් | 4,000,000.00 | 2,464,808.00 | 1,535,192.00 | **62%** |
| 17 | 2302 | කුඩා හා සුළු කර්මාන්ත නියාමක හා ව්‍යවසායකත්ව වර්ධන ව්‍යාපෘතිය ((ශ්‍රී ලංකා රජය/ ජයිකා ආයතනය) ණය දීම පිළිබඳව | 2,594,000,000.00 | 1,753,187,865.00 | 840,812,135.00 | 68% |
| **17** | 2509 | කුඩා හා සුළු කර්මාන්ත නියාමක හා ව්‍යවසායකත්ව වර්ධන ව්‍යාපෘතිය ((ශ්‍රී ලංකා රජය/ ජයිකා ආයතනය) වෙනත් | 6,000,000.00 | 3,178,942.14 | 2,821,057.86 | **53%** |

වැඩසටහන : 02 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය : 05 රාජ්‍ය ආයතන

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව 2023(රු.) | වියදම 30.09.2023 (රු.) | ශේෂය (රු.) | වියදම % |
|---|---|---|---|---|---|---|
| | | <u>මුළු පුනරාවර්තන වියදම</u> | **1,570,300,000.00** | **980,821,102.00** | **589,478,898.00** | **62%** |
| **2** | 1503 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (පුද්ගල පඩිනඩි) | 53,000,000.00 | 24,948,800.00 | 28,051,200.00 | 47% |
| **4** | 1503 | කාර්මික සංවර්ධන මණ්ඩලය (පුද්ගල පඩිනඩි) | 550,000,000.00 | 386,195,000.00 | 163,805,000.00 | 70% |
| **4** | 1509 | කාර්මික සංවර්ධන මණ්ඩලය (වෙනත් මෙහෙයුම් වියදම්) | 100,000,000.00 | 44,000,000.00 | 56,000,000.00 | 44% |
| **9** | 1503 | ශ්‍රී ලංකා ජාතික මෝස්තර මධ්‍යස්ථානය (පුද්ගල පඩිනඩි) | 63,500,000.00 | 44,846,000.00 | 18,654,000.00 | 71% |
| **9** | 1509 | ශ්‍රී ලංකා ජාතික මෝස්තර මධ්‍යස්ථානය (වෙනත් මෙහෙයුම් වියදම්) | 28,800,000.00 | 6,865,000.00 | 21,935,000.00 | 24% |
| **10** | 1503 | ජාතික ශිල්ප සභාව (පුද්ගල පඩිනඩි) | 143,000,000.00 | 100,393,302.00 | 42,606,698.00 | 70% |
| **10** | 1509 | ජාතික ශිල්ප සභාව (වෙනත් මෙහෙයුම් වියදම්) | 36,000,000.00 | 16,539,000.00 | 19,461,000.00 | 46% |
| **18** | 1503 | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනය(පුද්ගල පඩිනඩි) | 62,000,000.00 | 45,635,000.00 | 16,365,000.00 | 74% |
| **18** | 1509 | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනය (වෙනත් මෙහෙයුම් වියදම්) | 34,000,000.00 | 18,899,000.00 | 15,101,000.00 | 56% |
| **19** | 1503 | කාර්මික තාක්ෂණ ආයතනය (පුද්ගල පඩිනඩි) | 500,000,000.00 | 292,500,000.00 | 207,500,000.00 | 59% |
| | | <u>මුළු මූලධන වියදම</u> | **761,000,000.00** | **127,091,000.00** | **633,909,000.00** | **17%** |
| **1** | 2201 | ශ්‍රී ලංකා පේෂ කර්ම හා ඇඟලුම් ආයතනය | 200,000,000.00 | 21,200,000.00 | 178,800,000.00 | 11% |
| **2** | 2201 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 60,000,000.00 | 16,540,000.00 | 43,460,000.00 | 28% |
| **4** | 2201 | කාර්මික සංවර්ධන මණ්ඩලය | 150,000,000.00 | 57,000,000.00 | 93,000,000.00 | 38% |
| **9** | 2201 | ශ්‍රී ලංකා ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 40,000,000.00 | 11,305,000.00 | 28,695,000.00 | 28% |
| **10** | 2201 | ජාතික ශිල්ප සභාව | 40,000,000.00 | 10,955,000.00 | 29,045,000.00 | 27% |
| **18** | 2201 | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනය | 21,000,000.00 | 10,091,000.00 | 10,909,000.00 | 48% |
| **19** | 2201 | කාර්මික තාක්ෂණ ආයතනය | 250,000,000.00 | - | 250,000,000.00 | 0% |
| | | <u>මුළු එකතුව</u> | **2,331,300,000.00** | **1,107,912,102.00** | **1,223,387,898.00** | **48%** |

වැඩසටහන : 02 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය : 03 කාර්මික සංවර්ධනය

| ව්‍යාපෘතිය අංක | වැය විෂයය | වැය විෂයය විස්තරය | ඇස්තමේන්තුව 2023 (රු.) | වියදම 30.09.2023 (රු.) | ශේෂය (රු.) | වියදම % |
|---|---|---|---|---|---|---|
| **2** | 2506 | කර්මාන්තපුර සංවර්ධනය | 1,000,000,000.00 | 96,084,647.58 | 903,915,352.42 | **10%** |
| **3** | 2202 | ආංශික සංවර්ධන වැඩසටහන | 300,000,000.00 | 23,928,508.98 | 276,071,491.02 | **8%** |
| **4** | 2509 | අත්යන්ත්‍ර සහ ඇහලුම් කර්මාන්තය | 100,000,000.00 | 8,448,229.75 | 91,551,770.25 | **8%** |
| **10** | 2506 | ප්‍රධාන හා කුඩා පරිමාණ කර්මාන්තපුර නගාසිටුවීම හා නවීකරණය | 50,000,000.00 | 14,347,116.55 | 35,652,883.45 | **29%** |
| **19** | 2506 | මෙට්‍රික් ටොන් 5ක ධාරිතාව සහිත මේස ලුණු යන්ත්‍රයක් මිලදී ගැනීම සහ අලිමංකඩ ලේවායේ යන්ත්‍රාගාරය ප්‍රතිෂ්ඨාපනය. | 100,000,000.00 | - | 100,000,000.00 | **0%** |
| **40** | 2506 | රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත සඳහා විශේෂිත කලාපයක් සෑදීම - එරාවූර් | 268,000,000.00 | 268,000,000.00 | - | **100%** |
| **42** | 2509 | සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය | 100,000,000.00 | 6,804,728.43 | 93,195,271.57 | **7%** |
| **43** | 2509 | කුඩා ප්‍රමාණයේ මැණික් කැපීමේ පුහුණු ඒකකයක් ස්ථාපිත කිරීම | 50,000,000.00 | 487,485.00 | 49,512,515.00 | **1%** |
| | | මුළු එකතුව | **1,968,000,000.00** | **418,100,716.29** | **1,549,899,283.71** | **21%** |

කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
**Ministry of Industries**

73/1, ගාලු පාර, කොළඹ 03    73/1, காலி வீதி, கொழும்பு 03    73/1, Galle Road, Colombo 03

**www.industry.gov.lk**